# මුදල් පරිහරණය

## නුවණින් යුතුව මුදල් පාවිච්චි කරමු.




# Use of Money

## -Use money wisely!

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය
Smallholder Agribusiness and Resilience Project

# මුදල් පරිහරණය

නුවණින් යුතුව මුදල් පාවිච්චි කරමු !

තමන්ට ලැබෙන සීමිත ධන සම්පත් නාස්තිවීමට ඉඩ නොතබා අර පරෙස්සමෙන් යුතුව පරිහරණය කිරීමෙන් ඕනෑම අයෙකුට බොහෝ ජීවිත අභියෝග ජය ගත හැකි බව පිළිගත් සත්‍යයකි. එසේ නුවණින් යුතුව මුදල් පරිහරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කාරණා කිහිපයක් පිළිබඳව විශේෂයෙන්ම කුඩා ඉඩම් හිමි ගොවීන් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාරිකයන් සහ පොදුවේ සාමාන්‍ය මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් සකස් කරන ලද ග්‍රන්ථයකි.

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**

**Smallholder Agribusiness and Resilience Project (SARP)**

© මුදල් පරිහරණය

**පළමු මුද්‍රණය :** 2026 මාර්තු

**ISBN** : 978-624-5753-12-3

**කර්තෘ** : ඩබ්ලිව්. එම්. කරුණාරත්න

**සිතුවම්** : හිඟුල්වල දිසානායක

**ප්‍රකාශනය :**

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය,**
2/2/1, කන්ද්‍රවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල
දුරකථන : +94112770986
www.sarp.lk

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,**
අංක.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
දුරකථන : +94112034300
www.agrimin.gov.lk

**මුද්‍රණය :**

**ප්‍රින්ට්මාස් (පුද්ගලික) සමාගම,**
අංක 138/10, කහතොට පාර,
මාලඹේ



# පෙරවදන

අප රටේ ජනතාවගෙන් බහුතරයකට අකුරු කියැවීමේ සහ ලිවීමේ හැකියාව එනම් සාක්ෂරතාවය තිබේ. එහෙත් ඔවුන්ට මුදල් පරිහරණය කරන අන්දම ගැන කියවීමට ලැබී ඇත්තේ අඩුවෙනි. මුදල් පරිහරණය පිළිබඳව ඇති වැරදි ආකල්ප නිසා සිදුවන කණගාටුදායක සිදුවීම් අපට නිතර අසන්නට දකින්නට ලැබේ. ඒවා අතර ප්‍රධාන සිදුවීම් තුනක් අපි අවධාරණය කරමු.

1. තමන් වෙහෙස මහන්සියෙන් උපයා ගන්නා මුදල් නිකරුණේ නාස්ති කර ගැනීම
2. නානාප්‍රකාර වංචනිකයන්ගේ මුදල් මගඩි වලට හසුවීමෙන් මුදල් නැති කර ගැනීම
3. යහමින් මුදල් හරිහම්බ කර ගත් කාලයේදී කිසිවක් ඉතුරු කරගැනීමට නොදත් බැවින් මහළු වයසේ දී දුක් විඳීමට සිදුවීම.

මුදල් පරිහරණය ගැන දැනගැනීමෙන් මෙවැනි කනගාටුදායක සිදුවීම් වළක්වා ගැනීමට පුළුවන. එබැවින් මුදල් පරිහරණය පිළිබඳව රටේ ජනතාව දැනුම්වත් කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයකි. මෙම වාතාවරණය තුළ, පොදුවේ ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහල නැංවීමේ අරමුණින් මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත.

මූල්‍ය සාක්ෂරතාවය යනු පුළුල් විෂයයකි. මෙවැනි කුඩා ග්‍රන්ථයකින් එය සම්පූර්ණයෙන්ම විස්තර කළ නොහැක. කෙසේ වුවද, ස්ථිර මාසික ආදායම් නොලබන ගොවිතැන් වෙළඳාම් හා කුඩා  ව්‍යාපාර හා කර්මාන්ත ආදී ස්වයං රැකියාවන්හි නිරත ජනයාට ප්‍රයෝජනවත් විය හැකි කරුණු ගණනාවක් මෙහි ඇතුළත් කර තිබේ. එබැවින් මෙය කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියට සම්බන්ධ වන සියලුම ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනවත් වේ යැයි අපි අදහස් කරමු.

මෙහි සඳහන් කරුණු දැනගැනීම එක් දෙයකි. එම කරුණු තේරුම් ගැනීමෙන් පසු ඒවා පිළිබඳව සුබවාදී ආකල්ප ඇති කර ගැනීම තවත් දෙයකි. ඉතාම වැදගත්ම කරුණ වන්නේ දැනුමත් හොඳ ආකල්පත්  අනුව මුදල් භාවිතා කිරීමේ චර්යාව එනම් හැසිරීම ඵලදායක ලෙස සකස් කර ගැනීමයි.

මෙම විෂයය පිළිබඳව මීට පෙරද ග්‍රන්ථයක් රචනා කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු සහකාර අධිපති  ඩබ්ලිව්. එම්. කරුණාරත්න මහතා අපගේ ආරාධනයෙන් මෙම  අනගි ග්‍රන්ථය රචනා කරදීම පිළිබඳව අපි ඒ මහතාට බෙහෙවින් ස්තූතිවන්ත වෙමු. එසේම මෙහි සඳහන් කරුණු වඩාත් පැහැදිලි කර ගැනීමට උපකාර වන පරිදි අගනා සිතුවම් නිර්මාණය කිරීමෙන් දායක වූ ප්‍රවීණ චිත්‍ර ශිල්පී හිඟුල්වල දිසානායක මහතාට ද ස්තූතිවන්ත වෙමු.

මුදල්වලින් නිසි ප්‍රයෝජනය ලබා ගන්නා ජන සමාජයක් බිහි කර ගැනීමේ උත්සාහයට මෙම ග්‍රන්ථයෙන් ද උපකාරයක් වේ නම් එය අපගේ බලවත් සතුටට හේතුවකි.

**එන් බී.එම්. රණතුංග**  
ව්‍යාපෘති අධ්‍යක්ෂ  
කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

# පටුන


1. මුදල් වැඩ කරන හැටි .................................................. 07

2. මුදල් උපයා ගැනීමට අවශ්‍ය දැනුම .................................................. 17

3. මුදල් ඉතිරි කිරීම පිළිබඳ දැනුම .................................................. 21

4. මුදල් වියදම් කිරීමට තිබිය යුතු දැනුම .................................................. 33

5. මුදල් ආයෝජනය කිරීම .................................................. 43

6. ණය මුදල් .................................................. 49

7. මුදල් ආරක්ෂා කර ගැනීම .................................................. 69

8. අනාගතයට සැලසුම් .................................................. 71

9. මූල්‍යය විනය සහ නිරවුල් මානසිකත්වය .................................................. 77

10. ඩිජිටල් මුදල් .................................................. 81

11. උප ග්‍රන්ථය .................................................. 89

* ණය සඳහා පොලී අය කරන හැටි .................................................. 89
* හොර සල්ලි .................................................. 93
* රක්ෂණය .................................................. 95
* ණය කාඩ්පත් භාවිතය .................................................. 96
* ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය .................................................. 98

# 1
# මුදල් වැඩ කරන හැටි

## 1. මුදල් වැඩ කරන හැටි

මුදල් යන වචනයෙන් කාසි සහ නෝට්ටු අදහස් වෙනවා.

ඒ වුණාට මුදල් කිව්වාම කාසි හා නෝට්ටු වලට වඩා වැඩි අර්ථයක් තියෙනවා.

### 1.1 මුදල් වටිනාකම් හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් වේ.

එදිනෙදා ජීවත් වන විට අපට අවශ්‍ය වන දේ එනම් ආහාර, රෙදි පිලි, බෙහෙත් ද්‍රව්‍ය වැනි භාණ්ඩ ලබා ගන්නා විටත්,

කුලී රථයකින් තැනකින් තැනකට යෑම නැත්නම් සැලූන් එකකට ගොස් රැවුල හෝ කොණ්ඩය කපා ගැනීම වැනි සේවාවක් ලබාගන්නා විටත්, ඒවා සඳහා මුදලින් ගෙවීමට සිදු වෙනවා.

සෑම භාණ්ඩයකට ම හෝ සේවාවකට ම වටිනාකමක් පවතී. භාණ්ඩය හෝ සේවාව සපයන පුද්ගලයාට (සැපයුම්කරුට) භාණ්ඩය හෝ සේවාව ලබාග න්නා පුද්ගලයා (ගැණුම්කරු) විසින් එහි වටිනාකම ගෙවිය යුතුය. මෙහි දී සිදු වූයේ වටිනාකම් හුවමාරුවකි. හුවමාරුව සිද්ධ වූයේ අදාළ වටිනාකම මුදලින් ගෙවීමෙනි.

### 1.2 මුදල්, භාණ්ඩවල සහ සේවාවන්වල වටිනාකම මනින මිනුමක් ද වේ.

අපට එදිනෙදා ජීවිතයේදී භාණ්ඩ හා සේවාවන් ගණනාවක් භාවිතා කිරීමට සිදුවේ. ඒවායේ වටිනාකම මනින්නේ මුදලිනි. හාල් කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 220 කොන්ඩේ කැපීමකට රුපියල් 250 ආදී වශයෙනි.



**1.3 මුදල්, වටිනාකම් රැස්කර තබා ගැනීමේ මාර්ගයක් ද වේ.**

වී කිලෝ ග්‍රෑම් එකක වටිනාකම රුපියල් එකසිය විස්සක් (120) යයි සිතමු. ඔබට වී කිලෝග්‍රෑම් දෙදහසක් (2,000) තිබේ. ඔබ එම වී තොගය විකුණා එහි වටිනාකම මුදලින් ලබා ගත්තේ යැයි සිතමු. දැන් ඔබට වී තොගය වෙනුවට රුපියල් දෙලක්ෂ හතළිස් දහසක මුදලක් ලැබී තිබේ. (2,40,000) මෙය වී තොග යක් වෙනුවට එහි වටිනාකම මුදලින් රැස්කර තබා ගැනීමකි. ඔබට එම මුදල් කාසි හා නෝට්ටු වශයෙන් ළඟ තබා ගැනීමට පුළුවන. නැතහොත් බැංකුවක තැන්පත් කර තබා ගැනීමට ද පුළුවන. ඔබ ළඟ තබා ගත්තත් බැංකුවක තැන්පත් කර තැබුවත් එතැන සිදුව ඇත්තේ වටිනාකම් රැස්කර තබා ගැනීමකි.

## 2. වටිනාකම්

යම් භාණ්ඩයක හෝ සේවාවක වටිනාකම තීරණය වන්නේ ඒවා සඳහා වෙළඳපොලේ පවතින ඉල්ලුම හා සැපයුම මගිනි.

වී කිලෝග්‍රෑම් දෙදහසක් නිපදවීම සඳහා ඔබට කාලය, ධනය හා ශ්‍රමය වැය කිරීමට සිදුවේ. වෙහෙස මහන්සි විය යුතුය. වන සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට නිදි වර්ජිතව සිටීමට සිදුවේ. ඇතැම් විට කෑමට බීමට පවා අවකාශයක් නැත. වැස්සෙන් අව්වෙන් පමණක් නොව මැසි මදුරුවන්ගෙන් පවා පීඩා විඳීමට සිදුවේ. වින්ද දුක් කරදර නිසාම ඔබට ලැබුණු අස්වැන්නේ වටිනාකම ඉතා ඉහළය.




නමුත් අස්වනු නෙලන කාලේදී තවත් බොහෝ සැපයුම්කරුවන් විසින් එවැනි භෝග වෙළඳපළට ගෙන එයි. කෙටි කාලයක් තුළදී වෙළෙඳපොළේ එම භෝග සැපයුම ඉහල යයි. සැපයුම්කරුවන් රාශියක් සිටිය ද ඉල්ලුම්කරුවන් ඇත්තේ සුළු පිරිසකි. වෙළඳපළේ බෝග සැපයුම ඉහළ යන විට ඉල්ලුම්කරුවන් එම භෝග අඩු මිලකට ලබා ගැනීමට උත්සාහ ගනී. ඉල්ලුම්කරුවන් සහ සැපයුම්කරුවන් අතරේ සිදුවන කේවල් කිරීමේදී ඒ ඒ භෝගවලට වටිනාකම් (මිළ) තීරණය වෙයි.

ඇතැම් අවස්ථාවල බෝගයේ වෙළඳපොළ මිළ අඩුවීමට බලපාන තවත් කරුණු තිබේ. බෝගය නිසි පරිදි වියළී නැත. එහි තෙතමනය අධිකය. එසේම, බොල්, ගල්, වැලි, පස් හා වෙනත් අපද්‍රව්‍යයන් බෝගය සමඟ මිශ්‍රව පවතී.

වටිනාකම අප සිතන පතන ආකාරයට සිදුවන්නක් නොව වෙළෙඳ පොලේ ඉල්ලුම හා සැපයුම අනුව තීරණය වන්නකි.

කෘෂි නිෂ්පාදනවලට නිසි වටිනාකමක් නොලැබෙන බව නිතර නිතර ප්‍රකාශ වන දෙයකි. ඒ අතරම ලැබෙන වටිනාකම වුණත් ආරක්ෂා කර ගැනීමට නොදන්නා බැවින් විපතට පත්වන අය ගැන ද අපට අසන්නට ලැබෙයි.

එබැවින් ඔබ මහත් වෙහෙස මහන්සියෙන් උපයා සපයා ගන්නා **"වටිනා මුදල්"** පරිහරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කාරණා ගැන මෙම පොතෙන් විස්තර කෙරේ.




මුදල්, වටිනාකම් හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් වැඩ කරයි. වටිනාකම් රැස්කර තබා ගැනීමට උපකාර කරයි. විවිධ ගනුදෙනුවලදී මාධ්‍යයක් ලෙස වැඩ කරයි. මුදල් වලට මේ වගේ වැඩ කිරීමට හැකි වන්නේ කොහොමද? ඒ මුදල් කෙරෙහි මහජන විශ්වාසයක් පවතින බැවිනි.

## 3. මහජන විශ්වාසය

අද ඔබට රුපියල් දහසක නෝට්ටුවක් ලැබුණා යැයි සිතමු. එම රුපියල් දහසේ නෝට්ටුවෙන් අද දවසේදී ලබාගත හැකි භාණ්ඩ හා සේවාවන් හෙට දිනයේදීත් එලෙසින්ම ලබාගත හැකි බවට විශ්වාසයක් ඇත.

මේ විශ්වාසය නැතිනම් රුපියල් දහසේ නෝට්ටුව කිසිම අගයක් නැති කඩදාසි කොලයක් බවට පත්වෙයි.

මුදල් කෙරෙහි මහජනයා තුළ මෙවැනි විශ්වාසයක් ඇතිවීමට උපකාර වන කාරණා කීපයක් පවතී.

- වලංගු කාසි හා නෝට්ටු නිකුත් කිරීමට නීතියෙන් බලය ලැබී ඇත්තේ රටක මහ බැංකුවට පමණි.
- නෝට්ටුවට අත්සන් තබා ඇත්තේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුවේ අධිපතිවරයා විසිනි.
- කාසි හා නෝට්ටු නිකුත් කර ඇත්තේ රටේ ආණ්ඩුව වෙනුවෙනි. ඒ බව ඕනෑම මුදල් නෝට්ටුවක ලියා දක්වා ඇති පහත සඳහන් වාක්‍යයෙන් පැහැදිලි වෙනවා ඇති.

**"ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කරන ලද මෙම මුදල් නෝට්ටුව ශ්‍රී ලංකාව ඇතුළත ඕනෑම මුදල් ගණනක් ගෙවීම සඳහා නීතියෙන් වලංගුය".**

මේ කරුණු නිසා කාසි හා නෝට්ටුවලට මහජනයා අතර පොදු පිළිගැනීමක් පවතී.

බැංකුවල තැන්පත් කර ඇති තම මුදල් ඕනෑම අවස්ථාවකදී කාසි හා නෝට්ටු වශයෙන්ම තමන්ට ආපසු ලබාගත හැකි බවට මහජනයා තුළ පොදු විශ්වාසයක් පවතී. රටක සමස්ත මූල්‍යය පද්ධතියේම ස්ථාවරභාවය රඳා පවතින්නේ මෙම විශ්වාසය මතය.




## 4. කාසි හා නෝට්ටු නොමැතිව කරන මුදල් ගණුදෙනු

බැංකුවල තැන්පත් කර ඇති මහජනයාගේ මුදල් බැංකු ලේඛනවල ගිණුම් සටහන් (ඉලක්කම්) ලෙස පවතී. සියලුම ගිණුම් පරිගණක ගත කර ඇති බැවින් කාසි හා නෝට්ටු භාවිතා නොකොට මුදල් ගනුදෙනු කිරීමට මහජනයාට දැන් අවස්ථාව සැලසී තිබේ .

බැංකුවෙන් නිකුත් කරන ණය කාඩ්පත භාවිතා කරමින් භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමට පුළුවන.

ගිණුම් හිමියෙකුට ලැබෙන වැටුප් ආදී ලැබීම් කෙලින්ම ගිණුමට ලැබීමට සලස්වන ලෙස ඉල්ලා සිටීමට පුළුවන.




බැංකුවේ අනුදැනුම ඇතිව ගිණුම් හිමියෙකුට රහස්‍ය මුරපදයක් හරහා තමන්ගේ පෞද්ගලික ගිණුමට ප්‍රවේශ වී එහි තොරතුරු බලා ගැනීමට පුළුවන. මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත දුරකථනයක් හෝ පරිගණකයක් තිබිය යුතුය. එසේ තම ගිණුමට ප්‍රවේශ වන ගිණුම් හිමියෙකුට තම ගිණුමේ ඇති මුදල් වලින් යම් ප්‍රමාණයක් එම බැංකුවේම හෝ වෙනත් බැංකුවක ඇති වෙනත් අයෙකුගේ ගිණුමකට මාරුකර යැවිය හැක. (අන්තර්ජාල පහසුකම් හෝ සුහුරු දුරකතන (Smart Mobile Phones) නොමැතිව වුවද සාමාන්‍ය ජංගම දුරකථනය ඔස්සේ ගනුදෙනුකරුවන්ට බැංකු ගනුදෙනු සිදුකිරීමට දැන් අවස්ථාව සැලසී ඇත. (10 පරිච්ඡේදය බලන්න.)

ණය කාඩ් පතකින් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවිය යුතු ණය මුදල්, කාඩ් පත නිකුත් කළ බැංකුවට ගෙවීමට පුළුවන.

මේ එකදු අවස්ථාවකදී හෝ කාසි හා නෝට්ටු භාවිතා වූයේ නැත. එසේ වුවද අදාළ ගනුදෙනු ඉතා සාර්ථකව හා නිවැරදි ලෙස සම්පූර්ණ කර ගැනීමට ගිණුම් හිමියාට හැකියාව ලැබේ. සිදුවූයේ බැංකු ගිණුම් හිමියාගේ ගිණුමෙහි ගිණුම් සටහන් වෙනස් වීම පමණි.

**4.1 කාලයත් සමග මුදලේ අගය අඩු වෙයි.**

මීට අවුරුදු කීපයකට පෙර රුපියල් දහසකින් මිලයට ගත හැකිව තිබූ භාණ්ඩ හා සේවාවන් ප්‍රමාණය ගැන සිතා බලන්න. නමුත් අද රුපියල් දහසකින් එම භාණ්ඩ හා සේවා ප්‍රමාණය ලබාගත හැකිද?

රුපියල් දහසේ නෝට්ටුව වෙනස් වී නැත. නමුත් එයින් මිලදීගත හැකිව තිබුණු භාණ්ඩ හා සේවා ප්‍රමාණය අඩු වී ඇත. මුදලේ අගය වෙනස් වේ.

කාලයත් සමඟ මුදල්වල වටිනාකම වෙනස් වන බව අප දැන සිටිය යුතුය. හේතුව කාලයත් සමඟ භාණ්ඩ හා සේවාවල මිල ගණන් වෙනස් වීමයි.

උදාහරණය: දැනට අවුරුදු කීපයකට පෙර දිවා ආහාර වේලක් සඳහා රුපියල් සියය ක මුදලක් ප්‍රමාණවත් විය. අද ඒ සඳහා අවම වශයෙන් රුපියල් හාරසියයක පමණ මුදලක් අවශ්‍ය වේ. කාලයත් සමඟින් ආහාර මිල වෙනස් වී ඇති අතර එදා රුපියල් සියයකට තිබුණු අගය අද වන විට අඩුවී ඇත. අනෙකුත් භාණ්ඩ හා සේවාවන්වල මිල ගණන්ද මෙසේමය. මිල ගණන් ඉහළ යන විට මුදලේ අගය අඩු වේ. මෙය සම්පූර්ණයෙන්ම වැළැක්විය හැකි තත්ත්වයක් නොවේ. එහෙත් පාලනය කළ හැක. උද්ධමනය පාලනය කිරීම යනුවෙන් අපි එය අසා ඇත්තෙමු. එහිදී භාණ්ඩ හා සේවාවල මිල ගණන් සීඝ්‍රයෙන් වැඩිවීම පාලනය වෙයි.




මුදලට ඇති වර්තමාන වටිනාකම අනාගතයේ දී අඩු විය හැකි බව දැන සිටීම ඉතා ප්‍රයෝජනවත්ය.

ඉතින්, අද ඔබ උපයාගන්නා සියලුම මුදල්, කාසි හා නෝට්ටු වශයෙන්ම ළඟ තබා ගෙන සිටියහොත් කාලයත් සමඟ ඒවායේ වටිනාකම අඩු වී යනු ඇත.

එබැවින් කාලයක් සමඟ අඩුවන මුදලේ අගය ආරක්ෂා කරගැනීමට ඔබට ගත හැකි පියවර දෙකක් ඇත.

**I. පිළිගත් නිත්‍යානුකූල මූල්‍ය ආයතනයක (බැංකුවක) ඔබගේ මුදල් තැන්පත් කර තැබීම.**

**II. ඥානාන්විත ලෙස මුදල් ආයෝජනය කිරීම. අනාගතයේදී වැඩි ආදායමක් උපයා ගත හැකි ලාභදායි ආර්ථික කටයුත්තක් තෝරාගෙන එහි ඇති අවදානම් පිළිබඳව නිසි තක්සේරුවක් සහිතව මුදල් ආයෝජනය කිරීම.**

බැංකුවක මුදල් තැන්පත් කිරීම (ඉතිරි කර තැබීම) නිසා ඔබට වාර්ෂිකව පොලී මුදලක් උපයා ගැනීමට පුළුවන. උද්ධමනය නිසා වාර්ෂිකව අඩු වන මුදලේ අගය ආරක්ෂා කර ගැනීමට එම පොලී මුදල බොහෝ දුරට උපකාර වෙයි.

අද ඥානාන්විත ලෙස ආයෝජනයක් කළහොත් අනාගතයේදී එයින් ලැබෙන ආදායම් සහ ලාබ නිසා මුදලේ අගය ආරක්ෂාවේ.

(මුදල් ඉතිරි කිරීම සහ ආයෝජනය කිරීම පිළිබඳ විස්තර සඳහා 3 හා 5 වැනි පරිච්ඡේද බලන්න.)

## 5. මුදල් පරිහරණය

තමන් සතු මුදල් ඵලදායක ලෙස පරිහරණය කිරීමට නම් අපට විශේෂ දැනුමක් තිබිය යුතුය. මුදල් පරිහරණය වැරදුනොත් මුළු ජීවිතය ම වැරදීමට ඉඩ ඇති බැවිණි.




මුදල් පරිහරණය ප්‍රධාන තේමාවන් පහක් යටතේ සිදුවන බව පෙනේ. එනම් තමන්ටත් තමන්ගේ පවුලේ අයටත් වඩා හොඳ ජීවන තත්වයක් ලබා ගැනීම සඳහා පුද්ගලයෙකුට අවම වශයෙන් ප්‍රධාන කරුණු පහක් ගැන හොඳ දැනුමක් තිබිය යුතු බවයි.

i. මුදල් උපයා ගැනීමට අවශ්‍ය දැනුම

ii. මුදල් ඉතිරි කිරීම පිළිබඳ දැනුම

iii. මුදල් වියදම් කිරීමට තිබිය යුතු දැනුම

iv. මුදල් ආයෝජනය කිරීම සඳහා තිබිය යුතු දැනුම

v. මුදල් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය දැනුම සහ හැකියාව

මෙම කරුණු පිළිබඳව පුද්ගලයෙකුට ඇති දැනුම හා හැකියාව, ඒවා පිළිබඳ දක්වන ආකල්ප, ඒවා සම්බන්ධයෙන් ඔහුගේ /ඇගේ හැසිරීම් රටාව (භාවිතය) යන මේ සියල්ලටම "මූල්‍යසාක්ෂරතාවය" යනුවෙන් හඳුන්වනු ලැබේ.

අපි දැන් මෙම කරුණු වෙන වෙනම සාකච්ඡා කරමු.

"ඔබ දුප්පත්ව ඉපදුනේ නම්
එය ඔබගේ වරදක් නොවේ.
එහෙත් ඔබ දුප්පත්ව මිය යන්නේ නම්
එය ඔබගේ වරදකි."

**- බිල් ගේට්ස් -**

පරිගණක විප්ලවයේ පුරෝගාමියාවන
බිල් ගේට්ස් ලෝකයේ ප්‍රධානපෙළේ
දානපතියෙක් ද වේ.

# සටහන්

# 2
# මුදල් උපයා ගැනීමට අවශ්‍ය දැනුම

## 1.0 මුදල් උපයා ගැනීමට අවශ්‍ය දැනුම

මුදල් පරිහරණය ඇරඹෙන්නේ මුදල් උපයා ගැනීමත් සමගය. එබැවින් නීත්‍යානුකූල මාර්ගවලින් මුදල් උපයා ගැනීමට ඇති දැනුම හා හැකියාව ද මූල්‍ය සාක්ෂරතාවයට අඩංගුවෙයි.




ගොවිතැන, වෙළඳාම්, කර්මාන්ත, රැකීරක්ෂා ආදි නොයෙකුත් නීත්‍යානුකූල මාර්ගවලින් අපට මුදල් උපයා ගැනීමට පුළුවන.

ඇතැම් විට පුද්ගලයෙකුට ආදායම් උපදවන මාර්ග එකකට වඩා තිබිය හැක.

වෙළෙඳාම් කරන අතරම ගොවිතැන් කිරීමටද පුළුවන. රැකීරක්ෂා කරන අතර ගොවිතැන් ද කරන අය සිටි. එසේම ගොවිතැන් කරන අතර සත්ව පාලනය වෙළෙඳාම හෝ කුඩා කර්මාන්ත කරන අයද සිටි.

යම් අයෙකුට මුදල් උපයා ගැනීමට ඇති එකම මාර්ගය ගොවිතැන විය හැක. ගොවිතැනට අමතරව ඔහුට කල හැකි වෙනත් ආදායම් උපයන මාර්ග පවතීද? වර්ෂය පුරාම දිනපතා මුදල් උපයා ගත හැකි අන්දමට ගොවිතැන් කරන්නේ කෙසේද?

පහත දක්වා ඇති කතාන්තරය කියවන්න.

# 2.0 කතාන්තර අංක 01

## 2.1 ගුණරත්න ආදර්ශමත් ගොවියෙකු වූ අන්දම

ගුණරත්න උසස් පෙළ විභාගය සමත් විය. එහෙත් ඔහුට විශ්ව විද්‍යාලයකට ඇතුළත් වීමට ලකුණු ප්‍රමාණවත් නොවීය. දෙවන වර විභාගය ලිවීමට ඔහු කැමැති වූයේ ද නැත. ගුණරත්න ගේ පියා ඉතා දක්ෂ ගොවියකු විය. ඔහුට ගමේ වැව යටතේ කුඹුරු අක්කරයක් පමණ හිමිව තිබුණි. ඔවුන් පදිංචිව සිටි ගොඩ ඉඩම ද අක්කර එකහමාරක් පමණ විය. එහි කුඩා ළිඳක් තිබුණි. නියං කාලයේදී පවා එම ළිඳෙන් ඔවුන්ට ප්‍රමාණවත් ජලය ලැබුණි.

ගමෙන් පිටව ගොස් සුළු රැකියාවක් සොයාගැනීමට ගුණරත්නට හැකියාව තිබුණි. එහෙත් මව අසනීපයෙනි. පියාට ද පෙර මෙන් මහන්සි වී වැඩපළ කිරීමට අපහසු බව පෙනිණි. එබැවින් ඔහු ගමෙන් පිටව ගොස් රැකියාවක් කිරීමේ අදහස අත් හරින ලදී. රැකියාවකින් ලබන ආදායමට වඩා වැඩි ආදායමක් ගොවිතැන්වලින් උපයාගත හැකි බවට ඔහුට දැඩි විශ්වාසයක් තිබුණි. ගුණරත්න සිය පියා සමඟ එක්ව ගොවිතැන් කිරීමට තීරණය කළේය.

මුලින්ම ඔහු විවිධ භෝග වර්ග වගා කරන අන්දම පිළිබඳව කරුණු සොයා ඉගෙන ගත්තේය. පළාතේ කෘෂිකර්ම නිලධාරීවරයාගෙන්ද උපදෙස් ලබා ගත්තේය. ඉන් පසුව ඔහු ගොඩ ඉඩමේ තිබුණු ළිඳ තවත් ගැඹුරු කොට වගා ළිඳක් ලෙස සකස් කර ගත්තේය. ඒ සමගම කුඹුරු ඉඩමේද කුඩා ළිඳක් සකස් කරගන්නා ලදී. ගොඩ ඉඩමේ වැට කඩුලු ශක්තිමත්ව බැඳගන්නා ලදී. වැටෙහි වැටමාර, පාවට්ට සහ මුරුංගා වැනි ශාක සිටුවන ලදී. ඉඩමේ පැත්තකින් කිරිගව දෙනුන් සඳහා ගව ගාලක් සාදන ලදී. අක්කර භාගයක පමණ සත්ව ආහාර සඳහා තණකොළ වගා කරන ලදී. ඊට අමතරව කිකිළියන් කිහිපදෙනෙකු සඳහා කුඩා කුකුල් කොටුවක්ද සාදා ගන්නා ලදී.

ගොඩ ඉඩමෙහි ළිඳට ආසන්නව බුලත් කොටුවක් සකස් කරගන්නා ලදී. බුලත් පාත්තිවල බුලත් වලට අමතරව කහ, ඉගුරු, මිරිස්, කොච්චි හා නයි මිරිස් ආදි බෝග වගා කරන ලදී. ගොවිපළ සංවර්ධනය කරගැනීමට ගුණරත්නට ඔහුගේ දෙමව්පියන්ගෙන් බොහෝ උපකාර ලැබුණි.

ඔහු වී වගාව සඳහා බැංකුවකින් කෙටි කාලීන ණයක් ලබා ගන්න ලදී. බැංකුවෙන් ලබා ගන්නා ණය මුදල් කලට වේලාවට ගෙවා නිම කරන බැවින් එක් අවස්ථාවකදී බැංකුවේ කළමනාකරු ද ගුණරත්නගේ ගොවිපළ නිරීක්ෂණය කිරීමට පැමිණියේය. මහත් සතුටට පත් වූ කළමනාකරු වගා ළිඳ සකස් කර ගැනීමට, ජල ඉසින යන්ත්‍රයක් මිලට ගැනීමට හා බින්දු ජල සම්පාදන කට්ටලයක් ලබා ගැනීමට ප්‍රමාණවත් මැදි කාලීන ණය මුදලක් අනුමත කරන ලදී.

ගුණරත්න වර්ෂ දෙකක් ඇතුළතදී දිනපතාම ආදායම් ලබන ගොවිපලක් නිර්මාණය කළේය.

## 2.2 ගුණරත්නගෙන් අපට ලැබෙන ආදර්ශය කුමක්ද?

ගුණරත්න උගත් තරුණයෙකි. බොහෝ තරුණයින් ගොවිතැන නිසරු වැඩක් යැයි අත්හැර දමන කාලයක ගුණරත්න "රැකියාවක් වශයෙන් ගොවිතැන් කිරීමට" තීරණය කළේය.

ඔහු ගොවිතැන ආදායම් උපදවන ව්‍යාපාරයක් ලෙස සකස් කර ගත්තේය.

ගොවිපල ඉවත ලන දේ ගවයන්ටත් ගවයන්ගෙන් ඉවත ලන අපද්‍රව්‍යය ගොවිපලටත් යොදා ගන්නා සමෝධාන ගොවිපළ ක්‍රමය ගුණරත්න විසින් ක්‍රියාවට නංවන ලදී. භෝග වගාවේ පොහොර සඳහා වන වියදම් අඩු කර ගැනීමට ඔහුට හැකි විය.

ගුණරත්නගේ සාර්ථකත්වයට උපකාරී වූ මූල්‍ය සාක්ෂරතාවය හඳුනාගැනීමට පහත සඳහන් කරුණු උපයෝගී කර ගැනීමට පුළුවන.

**කාරණා දහයක් යටතේ ගුණරත්නගේ මූල්‍යසාක්ෂරතාවය අගයමු.**

| | කාරණය | මූල්‍ය සාක්ෂරතාවය |
|---|---|---|
| i. | කෘෂිකර්මය මුදල් උපයාගත හැකි රැකියාවක් ලෙස තීරණය කිරීම | ආදායම් උපයා ගැනීම පිළිබඳව ඔහුගේ ආකල්පය ධනාත්මකය. |
| ii. | අංග සම්පූර්ණ ගොවිපලක් සකස් කර ගැනීම | නවීන ගොවිතැන් ක්‍රම ගැන ඉගෙන ගැනීමෙන් සහ භාවිතයෙන් ඔහු මුදල් උපයා ගැනීමේ හැකියාව වැඩිදියුණු කරගත්තේය. |
| iii. | තනි භෝගයකට සීමා නොවී විවිධ භෝග වගා කිරීම | ආදායම් උපයා ගැනීමේ මාර්ග පිළිබඳව ඔහුගේ දැනුම, හැකියාව, සුභවාදී ආකල්ප සහ භාවිතය පෙන්නුම් කරයි. |
| iv. | දිනපතා ආදායම් ලැබිය හැකි බුලත් වගාව සහ කිරි ගව පාලනය වැනි කටයුතු | ආදායම් උපයා ගැනීමේ මාර්ග පිළිබඳව ඔහුගේ දැනුම, භාවිතය පෙන්නුම් කරයි. |
| v. | ස්ථිර වශයෙන්ම ආදායම් ලැබිය හැකි කටයුතුවල මුදල් ආයෝජනය කිරීම | ආයෝජන පිළිබඳ ඔහුගේ දැනුම සහ ආකල්ප පෙන්නුම් කරයි |
| vi. | ගොවිපළ ආදායම් සහ වියදම් පොත්පත්වල සටහන් කර තැබීම | මුදල් පරිහරණය කිරීම පිළිබඳ ඔහුගේ දැනුම හැකියාව ආකල්ප සහ භාවිතය පෙන්නුම් කරයි |
| vii. | නිත්‍යානුකූල බැංකු ආයතනයක් සමඟ විශ්වාසනීය ලෙස ගනුදෙනු කිරීම | බැංකු ක්‍රමය, බැංකු සේවාවන් පිළිබඳව ඔහුගේ දැනුම, හැකියාව ආකල්ප සහ භාවිතය පෙන්නුම් කරයි. |
| viii. | ගොවිපළෙන් ලැබෙන ලාභ වලින් සැලකිය යුතු කොටසක් බැංකු ගිණුම් වල ඉතිරි කිරීම | ඉතිරිකිරීම් පිළිබඳ ඔහුගේ දැනුම හැකියාව ආකල්ප සහ භාවිතය පෙන්නුම් කරයි |
| ix. | මහත් සතුටකින් සහ කැපවීමකින් යුතුව ගොවිබල කටයුතුවල යෙදීම | ගොවිපළ (ගොවිතැන) පිළිබඳ ඔහුගේ සුබවාදී ආකල්පය පෙන්නුම් කරයි |
| x. | අත්‍යවශ්‍ය නොවන දේවල් මිලදී නොගෙන පවුලේ වියදම් කළමනාකරණය කරගැනීම | මුදල් වියදම් කිරීම පිළිබඳව ඔහුගේ දැනුම හැකියාව ආකල්ප සහ භාවිතය පෙන්නුම් කරයි. |

# සටහන්

# 3
# මුදල් ඉතිරිකිරීම පිළිබඳ දැනුම

## 1.0 ඉතිරි කිරීම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

**අනාගතයේ යම් දිනයක දී පාවිච්චි කිරීම පිණිස යම් පුද්ගලයකු හෝ පවුලක් විසින් ඔවුන්ගේ වර්තමාන ආදායමෙන් වෙන්කර තබන මුදල් ඉතිරිකිරීම ලෙස සරලව හඳුන්වා දීමට පුළුවන.**

**ඉතිරි කිරීම් ඕනෑම අයෙකුගේ ඥානාන්විත මුදල් කළමනාකරණයේ අත්තිවාරම වන්නේය.**




## 2.0 අප මුදල් ඉතිරි කළ යුත්තේ ඇයි?

පළමුවෙන්ම අපි මේ ප්‍රශ්නයට උත්තර සොයා ගනිමු.

හදිසි අවස්ථාවලදී ඉතිරිකිරීම් පිහිටවෙයි. අවදානමකට මුහුණ දීමට ශක්තිය ලැබේ. පුද්ගලයෙකුගේ හෝ පවුලක අනාගත වත්කම් ගොඩනගා ගැනීමේ මූලාරම්භය වන්නේ ද ඉතිරි කිරීම් ය. එසේම සුරක්ෂිත අනාගතයකට වුවමනා මූල්‍යය ඉලක්ක සපුරා ගැනීමට ද ඉතිරි කිරීම් ප්‍රයෝජනවත් වෙයි.

### 2.1 හදිසි ආපදා අවස්ථාවලට මුහුණ දීම සඳහා

එදිනෙදා ජීවිතයේදී කලින් බලාපොරොත්තු නොවූ ආපදාවන් නැතහොත් හදිසි සිදුවීම්වලට මුහුණ දීමට අප කාටත් සිදුවේ. කලින් ඉතිරි කර තබාගත් මුදල් එවැනි ආපදා අවස්ථාවලදී බොහෝ සෙයින් උපකාරී වේ. ඉතිරි කරගත් මුදල් නැත්නම් ආපදා අවස්ථාවලදී ඉතාමත්ම කරදරකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවේ. ඇතැම් විට තමන් සතු දේපලක් අඩු මුදලකට විකුණා දැමීමට සිදුවිය හැක. එසේ නැතහොත් අධික පොලී යටතේ අනුන්ගෙන් ණය මුදල් ලබා ගැනීමට සිදුවේ.

## 2.2 විශේෂ අවස්ථා ලාභයන් ලබාගැනීමට

බොහෝ විට අපට වාසි සහගත ආකාරයේ විවිධ අවස්ථාවන් උදාවේ. එවැනි අවස්ථාවලින් ප්‍රයෝජනය ගැනීමට නම් කලින් ඉතුරු කළ මුදල් අප ළඟ තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් වටිනා ඉඩමක්, ව්‍යාපාරික කටයුත්තක් හෝ එවැනි මුදල් උපයාගත හැකි මාර්ගයක් අත්පත් කර ගැනීමේ අවස්ථාවක් උදා වූයේ යැයි සිතමු. ඉතිරි කළ මුදල් තිබේ නම් එම අවස්ථාවෙන් ප්‍රයෝජනය ලබා ගත හැක. මුදල් නැත්නම් එම වටිනා අවස්ථාව මඟහැරී යනු ඇත. "අනේ ඒ වෙලාවේ මගේ අතේ සල්ලි තිබුණේ නැහැනෙ. තිබුණා නම් මට ඒක ගන්න තිබුණා" කියමින් පසු කාලයේදී පශ්චාත්තාප විය හැක.

## 2.3 මානසික සහනය ලබා ගැනීමට

සැලකිය යුතු මුදලක් ඉතිරිකිරීම් ගිණුම් වල පවතින විට, අනාගත අවදානම් සහ දුෂ්කරතා පිළිබඳව බියක් නැත. උදාහරණයක් වශයෙන් දැනටමත් මැදි විය ඉක්මවා සිටින ගොවි මහතෙකු හෝ වඩුවැඩ වැනි තමන්ගේම රැකියාවක් කරන පුද්ගලයෙකු ගනිමු. වයස්ගත වීම නිසා එම අය තව ටික කලකින් ආදායම් ඉපදවිය නොහැකි තත්ත්වයට පත්විය හැක. එවැනි අයට විශ්‍රාම වැටුප් ආදිය නැත. තමන්ට ආදායම් උපදවා ගැනීමට නොහැකි වන විට ඔවුන්ට සිදුවන්නේ එක්කෝ අනුන්ගෙන් යැපීමටය, නැත්නම් මිය යනතුරුම දුක්බර ජීවිතයක් ගත කිරීමටය.




වෙහෙස වී වැඩ කිරීමට හැකි කාලයේ දී උපයාගන්නා මුදල් වලින් යම් ප්‍රමාණයක් ඉතුරු කර තබාගත හැකි නම් වයස්ගත වූ පසු අනුන්ට කරදරයක් නොවන පරිදි සැනසිලිදායක ජීවිතයක් ගතකිරීමට හැකි වන බව එවැනි පුද්ගලයින් කල්පනා කළ යුතුවේ.

මෙම කාරණය වෙනත් ආකාරයකටද ඉදිරිපත් කිරීමට පුළුවන. එනම් විශ්‍රාම ජීවිතය සඳහා මූල්‍ය සැලැස්මක් සකස් කර ගැනීම හැටියට එය දැක්විය හැක.

## 3.0 විශ්‍රාම ජීවිතයට මූල්‍යය සැලැස්මක්

මෙහිදී මුදල් උපයන විටදීම ඉතිරි කිරීමට පුරුදු විය යුතුය. එනම් වියදම් කිරීමට පෙර ඉතිරි කළ යුතුය. එසේ ඉතිරි කරන මුදල මුලින්ම සාමාන්‍යය ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කිරීමට පුළුවන. මාස කිහිපයක් එසේ ඉතිරි කරන විට ගිණුමේ එකතුවන මුදල් එම බැංකුවේම ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට පුළුවන. (ස්ථාවර තැන්පත් වලට සාමාන්‍ය ඉතිරි කිරීම් වලට වඩා වැඩි පොලියක් ලැබෙන බැවිනි.) අවුරුදු කීපයකට පසු එම ස්ථාවර තැන්පත් ගිණුම්වල පවතින මුළු මුදල යොදාගෙන එක් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ හැක. මෙහිදී ඔබට ඉලක්කයක් තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් වසර පහකදී රුපියල් ලක්ෂ දහයක් ඉතිරි කරනවා යැයි ඉලක්ක කළ හැක. එවිට අවුරුද්දකට රුපියල් ලක්ෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඉතිරි කළ යුතුය. මාසිකව රුපියල් (17,000) දහසක් පමණක්ම ඉතිරි කිරීමට සිදුවේ. මාසිකව එසේ බැරි නම් වැඩිපුර මුදල් ලැබෙන අවස්ථාවලදී ඊට වඩා වැඩි මුදලක් තැන්පත් කිරීමෙන් ඉලක්කය සපුරා ගැනීමට පුළුවන. අවශ්‍ය වන්නේ අධිෂ්ඨානය සහ උනන්දුව පමණි.

තරුණ වයසේ දී හෝ මැදි වියේදී එවැනි මුදලක් ස්ථාවර තැන්පතුවක් ලෙස ඉතිරි කරන කෙනෙකුට තැන්පත් කළ මුදල මෙන්ම කිහිප ගුණයක වටිනාකම ඇති විශාල මුදලක් ජීවිතයේ සැඳෑ සමයේදී ලබා ගැනීමට පුළුවන.

මෙය ඕනෑම කෙනෙකුට වලංගුය. අනාගතයේදී තමන්ට විශාල මුදලක් ලබාගත හැකි නම් ඕනෑම අයෙකු එයට කැමති බැවිනි. එක් එක් අයට විශේෂයෙන් මුදල් අවශ්‍ය වන අවස්ථා සහ වයස් සීමාවන් පවතී. උසස් අධ්‍යාපනය, විදේශගතවීම, රැකී රක්ෂාවන්, විවාහය, විශ්‍රාම ජීවිතය වැනි අවස්ථාවලදී තමන්ට අවශ්‍ය වන ප්‍රමාණයේ මුදලක් ලබා ගැනීමට නම් ඉහත සඳහන් පරිදි සැලැස්මකට අනුව මාසිකව හෝ මුදල් ලැබෙන ආකාරය අනුව බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම ආරම්භ කළ යුතුය. ස්ථාවර තැන්පතුවක තිබෙන මුදල් වසර කිහිපයකදී දෙගුණ වේ. එසේ සිදුවන්නේ තැන්පත් කළ මුදලට එකතු වන වාර්ෂික පොලිය මුල් මුදලට එකතු වීම නිසාය. මෙසේ සෑම වර්ෂයකදීම පොලිය එකතු වන අතර එසේ එකතුවන පොලියට ද පොලී ලැබෙන බැවිනි. මෙය මිශ්‍ර පොලි නැතහොත් වැල් පොලී ලෙස හඳුන්වනු ලැබේ. අනාගතයේදී පාවිච්චි කිරීම සඳහා යම් මුදලක් නිවසේ තබා ගෙන සිටියහොත් එම මුදල දෙගුණ තෙ ගුණ වන්නේ නැත.

## 4.0 මූල්‍ය ඉලක්ක යනු මොනවාද?

යම් පුද්ගලයකු හෝ පවුලක් විවිධ අවස්ථාවන්ට මුහුණ දෙයි. සමහර අවස්ථාවන් උද්ගතවන බව අපි කල් තියාම දනිමු. සමහර ඒවා අප නොසිතන අවස්ථාවන්හිදී උද්ගත විය හැක. එවැනි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා කල් ඇතිව මුදල් රැස්කර වෙන්කර තබා ගැනීමට අපට මූල්‍ය ඉලක්ක තිබිය යුතුය.




- **කෙටිකාලීන මූල්‍යය ඉලක්ක :** දරුවකු පාසලට ඇතුළත් කිරීම වැනි ඉදිරි වර්ෂයක් දෙකක් වැනි කෙටි කාලෙකදී මුදුන් පමුණුවා ගත යුතු දේ සඳහා තිබිය යුතු මූල්‍ය ඉලක්ක

- **මැදිකාලීන මූල්‍ය ඉලක්ක :** නිවසේ අලුත්වැඩියාවන් කිරීමට, ගෘහභාණ්ඩ, යාන වාහන මිලට ගැනීමට ආදී ඉදිරි වසර තුනක් හතරක් වැනි කාලයකදී මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය වන මූල්‍යය ඉලක්ක

- **දිගුකාලීන මූල්‍ය ඉලක්ක :** අනුන්ට බරක් නොවී තමන්ගේ විශ්‍රාම ජීවිතය ගත කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ඉලක්ක

- **අපේක්ෂිත අවස්ථා :** වියදම් දැරීමට සිදුවන බව කල්තියාම දන්නා විවිධ අවස්ථාවන් උදාවේ. උදාහරණ: විවාහ මංගල උත්සව, දරු උපත්, අධ්‍යාපන වියදම්, ජීවිතය පහසු කරවන ගෘහ භාණ්ඩ හා උපකරණ ආදිය මිලදී ගැනීම, වයස්ගත වීම, විශ්‍රාම ජීවිතය.

- **අනපේක්ෂිත අවස්ථා:** වියදම් දැරීමට සිදුවන නමුත් අප කල් තියා දැන නොසිටි අවස්ථා හෙවත් අපේක්ෂා නොකළ අවස්ථා: උදාහරණ: ලෙඩ රෝග වැළඳීම්, හදිසි මරණ, බාහිර කරදර, ස්වාභාවික විපත් ආදිය

- **වත්කම් ගොඩනගා ගැනීම සඳහා වියදම් දැරීමට සිදුවන අවස්ථා:** උදාහරණ: නිවාස ඉදිකිරීම්, ඉඩම් දේපොළ මිලදී ගැනීම, ආදායම් උපදවන ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම, කෘෂිකර්මාන්තයේ දී නම් වගා ඉඩම් සංවර්ධනය කර ගැනීම, ජලසම්පාදන ක්‍රම ඇති කරගැනීම, කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ආදී අවස්ථාවන්ට මුදල් වැය කිරීමට සිදුවේ.

මෙවැනි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා අපට පැහැදිලි මූල්‍යය ඉලක්ක තිබිය යුතුය. තරුණ අවදියේ සිටම හැකි පමණින් මුදල් ඉතිරි කළ පියසේනගේ කතාව බලන්න.

# 5.0 කතන්දර අංක 02

## 5.1 පියසේනගේ කතාව

පාසැල් අධ්‍යාපනය හමාර කිරීමත් සමග පියසේන වඩු වැඩ සහ මේසන් වැඩ ඉගෙන ගත්තේය. ඔහුගේ පියා ගොවිතැන් කළ අතර ඉඩ ලැබෙන අවස්ථාවලදී මේසන් වැඩ කිරීමෙන් ද ආදායමක් උපයා ගත්තේය. දිනක් ගමේ පන්සලේ හාමුදුරුවෝ පියසේනගේ පවුලේ අයට මුදල් ඉතිරි කිරීමේ අගය පිළිබඳව දේශනා කළහ. උන්වහන්සේ මාතෘකාවට යොදාගත් ගාථාව පියසේන පාසැල් යන කාලයේදී ද අසා තිබුණි.




එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්වීහිකම්මං පයෝජයේ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති

තමන් උපයා ගන්නා ධනය කොටස් හතරකට බෙදන්න. එයින් එක කොටසක් පරිභෝජනයට ගන්න. කොටස් දෙකක් තමන් ආදායම් ඉපදවීම සඳහා කරනු ලබන ගොවිතැන්, වෙළදාම්, කර්මාන්ත ආදී ව්‍යාපාර කටයුතුවල යොදවන්න. හදිසි ලෙඩදුක්, කරදර, විපත් වැනි ආපදා අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම පිණිස හතරවෙනි කොටස නිදන් කර තබාගන්න. මෙහි නිදන් කිරීම යනු ඉතිරි කර තබා ගැනීමයි.

තරුණ පියසේන සකසුරුවමින් යුතුව මුදල් පරිහරණය කිරීමට අධිෂ්ඨාන කර ගත්තේය.
ඔහු තමන්ට ලැබෙන ආදායම් සහ පවුලේ අත්‍යවශ්‍යය වියදම් පොතක සටහන් කර තබා ගත්තේය.

මතු දවසක තමන් ද ලක්ෂපතියෙකු විය යුතු යැයි ඔහු අධිෂ්ඨාන කර ගත්තේය. එතැන් සිට ඔහු බැංකු ගිණුමක මුදල් ඉතිරිකිරීමට පටන් ගත්තේය. කලක් ගතවන විට සැලකිය යුතු මුදලක් බැංකු ගිණුමෙහි එකතු වී ඇති බව පියසේන ට දකින්නට ලැබුණි. අසල ගමක වඩු මඩුවක් පවත්වාගෙන ගිය පියසේනගේ යහළුවකු පිටරට රැකියාවකට යෑම පිණිස වඩුමඩුව විකුණා දමන බව අසන්නට ලැබුනි. තමන්ට ද වඩුමඩුවක් ආරම්භ කිරීමට හොඳ අවස්ථාවක් උදා වී ඇතැයි සිතූ පියසේන තමන් ඉතුරු කළ මුදල් සහ බැංකුවෙන් ලබාගත් කුඩා ණය මුදලක් ද යොදවා වඩු මඩුව මිලදී ගත්තේය.

එතැන් සිට පියසේනගේ ආදායම් තත්ත්වය සීග්‍රයෙන් වර්ධනය වන්නට විය. මාසික ආදායමෙන් හතරෙන් පංගුවක් බැංකු ගිණුමෙහි තැන්පත් කිරීම නොකඩවාම සිදු කරන ලදී. පසු කලෙකදී ඔහු බැංකු කළමනාකරුගේ උපදෙස් අනුව, ඉතිරි කිරීමේ ගිණුමේ එකතු වී තිබූ මුදල් යොදා ස්ථාවර තැන්පත් ගිණුමක් ආරම්භ කළේය. ඉන් පසුවද ඔහු වරින්වර ස්ථාවර තැන්පත් ගිණුම් වල ආයෝජනය කරන ලදි.

පළමු ස්ථාවර තැන්පතුව අරඹා වසර විස්සකට පසු තමන් මුලින් තැන්පත් කළ මුදල මෙන්ම හතර ගුණයකටත් වඩා මුදලක් එකතු වී ඇති බව දුටු පියසේන මහත් සතුටට පත් විය.

දැන් පියසේන ලක්ෂපතියෙකි.

ගොවිතැන්, වඩු වැඩ සහ මේසන් වැඩද කිරීමෙන් සිය දෙමාපියන්, බිරිඳ හා දරු දෙදෙනා ද නඩත්තු කළ පියසේනට තමන්ගේ විශ්‍රාම ජීවිතය පිළිබඳව කිසිදු බියක් නොවීය.

## 5.2 පියසේන අපට කියා දෙන පාඩම් මොනවාද?

ආදායම් මාර්ග කිහිපයක් ඇතිකර ගැනීම පුද්ගලයකුට අතිශයින්ම ප්‍රයෝජනවත් වන බව පියසේන අපට කියාදෙයි.

මුදල් ඉතිරි කිරීමට අධිෂ්ඨානයක්, පැහැදිලි මූල්‍ය ඉලක්කයක් මෙන්ම මනා සැලසුමක් ද අවශ්‍ය වන බව ඔහු අපට පෙන්වා දෙයි.

ස්ථාවර තැන්පතුවල පවතින මුදල් ටික කාලයකදී දෙගුණ විය හැකි බව පියසේනගේ කතාවෙන් පෙනේ.

තමන්ගේ විශ්‍රාම ජීවිතය තරුණ වයසේ දීම එනම් විශ්‍රාම යෑමට පෙර සැලසුම් කල යුතු බව පියසේන අපට කියාදෙයි.

# ස්ථාවර තැන්පත් ගිණුම්
# Fixed Deposits

අවදානමක් නැතිව  තමන්ගේ මුදල් ආයෝජනය කොට එමගින් ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබා ගැනීමට කැමති අයට වඩාත් සුදුසු ආයෝජන මාර්ගයක් වන්නේ ස්ථාවර තැන්පත් ගිණුම් ය.

තැන්පත් කරන මුදලට යම් කාලසීමාවක් තුළදී ලබාදීමට එකඟවන ප්‍රතිලාභ බැංකුව විසින් සහතික කර ඇත.

# 6.0 මුදල් ඉතිරි කරන්නේ කොහොමද?

අත්‍යවශ්‍ය වියදම් දිනෙන් දිනම ඉහළ යමින් පවතී. එවැනි තත්ත්වයක් යටතේ මුදල් ඉතිරි කිරීම අසීරු බව බොහෝ දෙනා කියති. එසේ වුවද ඉලක්ක සපුරා ගැනීමටත් මූල්‍ය සුරක්ෂිතතාවයක් ඇති කරගැනීමටත් මුදල් ඉතිරිකිරීම අනිවාර්යෙන්ම කළ යුතුය.

ඒ සඳහා මුදල් ඉතිරි කිරීමේ පුරුද්ද වැඩි දියුණු කරගත යුතුය . අනාගතයේදී තමන්ට දිනාගත හැකි මූල්‍ය ඉලක්ක තමන් විසින්ම තීරණය කළ යුතුය. උදාහරණයක් වශයෙන් යම් අයෙක් වර්ෂ පහකදී රුපියල් ලක්ෂ දහයක් ඉතුරු කරගත යුතු යැයි තීරණය කළේ යැයි සිතමු. දැන් ඔහු තමන්ට දැනට ලැබෙන ආදායම වැඩි කර ගැනීමට මාර්ග ඇත්තේ දැයි සොයා බැලිය යුතුය. ඒ සමගම තමන්ගේ වියදම් රටාව ගැන ද ගැඹුරින් විමසා බැලිය යුතුය. අත්‍යවශ්‍ය නොවන වියදම් කපා හැරීමෙන් ද මුදල් ඉතිරි කිරීමට පුළුවන.




ආදායමක් ලැබුණු විගසම එයින් කොටසක් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරගත යුතුය. ඉතිරි කරන මුදල කුඩා විය හැක. මූලදී වැදගත් වන්නේ මුදලේ ප්‍රමාණය නොව ඉතිරි කිරීමේ පුරුද්දයි. පුරුද්ද ඇති වූ පසු ඉතිරි කරන මුදල් ප්‍රමාණය ද ටිකෙන් ටික වැඩි වනු ඇත.

**මුදල් ඉතිරි කරන මිනිසුන්ගේ ක්‍රමය**
**"මුදල් ලැබෙන අවස්ථාවේදීම එයින් යම් කොටසක් ඉතිරි කිරීම් සඳහා වෙන්කර තබයි. මුදල් වියදම් කරන අවස්ථාවලදී අඩුවෙන් වියදම් කරයි".**

## 6.1 ඉතිරි කරන මුදල් තබාගත යුත්තේ කොහේද?

ඉතිරි කිරීම යනු අනාගතය වෙනුවෙන් වර්තමානයේ පරිභෝජනය කැප කිරීමයි. මේ නිසා සීමිත ආදායමක් උපයා ගන්නා අයෙකුට මුදල් ඉතිරි කිරීම සඳහා ඉතා දැඩි කැපකිරීමක් කිරීමට සිදුවනු ඇත.

එවැනි විශාල කැපකිරීමක් කොට ඉතිරි කර ගන්නා මුදල් ආරක්ෂිත ස්ථානයක තබාගත යුතුය. එසේම තමන්ට වුවමනා අවස්ථාව කදී එම මුදල් ආපසු ලබා ගැනීමට ද හැකි විය යුතුය. එපමණක් නොව කාලයත් සමඟ සිදුවන මුදලේ අගය අඩුවීම නිසා සිදුවන පාඩු අවම කර ගැනීමට ප්‍රමාණවත් පොලී මුදලක් ද ලැබිය යුතුය.

එබැවින් ඉතිරි කරන මුදල් තැන්පත් කර තැබීමට වඩාත්ම සුදුසු ස්ථානය වන්නේ නීත්‍යානුකූල බැංකු ආයතනයකි.




## 6.2 නීත්‍යානුකූල බැංකු ආයතන යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

ශ්‍රී ලංකාවේ පවතින නීතිය අනුව මහජනතාවගේ මුදල් තැන්පත් භාරගන්නා බැංකු ආයතන ශ්‍රී ලංකා මහා බැංකුවේ ලියාපදිංචි විය යුතුය. එසේ ලියාපදිංචි වන බැංකුවලට මහජනයා සමඟ මුදල් ගනුදෙනු කිරීමට බලය පැවරෙන බලපත්‍රයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබේ. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍ර ලාභී විශේෂිත බැංකු ආදී වශයෙන් එම බැංකු හඳුන්වයි. එවැනි බලපත්‍රයක් නැතිව මහජනයාගේ මුදල් භාර ගැනීම අධිකරණයකදී දඬුවම් ලැබිය හැකි වරදකි. මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබාගැනීම පහසු නොවේ. ඒ සඳහා විශාල ප්‍රාග්ධනයක්, සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් ආදී සුදුසුකම් රාශියක් තිබිය යුතුය. බලපත්‍ර ලාභී බැංකුවල මුදල් ව්‍යාපාර කටයුතු ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිරන්තරයෙන්ම අධීක්ෂණය කරනු ලැබේ. මහජනතාවගේ මුදල් ආරක්ෂාවන අයුරින් එම බැංකු මුදල් ව්‍යාපාර කටයුතු සිදුකළ යුතුය.

අනාගතයේදී විශාල මුදලක් අත්කර ගැනීමේ ඉලක්කයක් ඇතිව සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුම් වල මුදල් ඉතිරි කරන අයද සිටි. ඔවුන් ආදායම් ලැබෙන පරිදි නිතිපතා යම් මුදලක් ගිණුම්වල තැන්පත් කරයි. අවුරුද්දක් පමණ එසේ ඉතිරි කරන මුදල් ඔවුන් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරයි. ස්ථාවර තැන්පතු සඳහා බැංකු සාමාන්‍ය ඉතිරිකිරීම් ගිණුමට වඩා වැඩි පොලියක් ගෙවයි. උදාහරණයක් වශයෙන් මාසයකට රුපියල් 8,300 බැගින් ඉතුරු කළහොත් වර්ෂයක් අවසානයේ දී රුපියල් ලක්ෂයක ස්ථාවර තැන්පතුවක් ඇරඹිය හැක.




## 6.3 අනාගතය වෙනුවෙන් අද ඉතිරි කරමු.

අනාගතය යනු ඉදිරි දින කිහිපයක්, සතියක්, මාසයක්, අවුරුද්දක් හෝ අවුරුදු කීපයක් විය හැක. මහජනතාවගේ අවශ්‍යතාවයන් වලට ගැලපෙන පරිදි බැංකු විවිධ ගිණුම් වර්ග හඳුන්වා දී තිබේ.

බොහෝ ව්‍යාපාරිකයන් දිනපතා ඔවුන්ට ලැබෙන මුදල් දිනපතාම බැංකු ගිණුම්වල තැන්පත් කරයි. ව්‍යාපාරයේ අවශ්‍යතාවය අනුව ඉදිරි දින වලදී මුදල් ආපසු ලබා ගනී. එවැනි අයට බැංකු ජංගම ගිණුම් හඳුන්වා දී තිබේ. ඔවුන්ට පාස්පොත වෙනුවට ලැබෙන්නේ චෙක් පොතකි. ව්‍යාපාරයට භාණ්ඩ හා සේවාවන් සපයන අයට චෙක්පත්වලින් ගෙවීම් කළ හැක.

ඉතිරි කිරීමේ ගිණුම් වලින් වැඩි කොටසක් සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුම් වෙයි. බොහෝ අය තමන්ට ලැබෙන ආදායමෙන් කොටසක් පුරුද්දක් ලෙස ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරයි. සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම් මුදල් තැන්පත් කරන අයට ඉතා ප්‍රයෝජනවත් වෙයි. උවමනා අවස්ථාවකදී එම ගිණුම්වලින් මුදල් ආපසු ලබා ගැනීමට පුළුවන. එසේම එම ගිණුම්වල තිබෙන මුදල් වලට බැංකුවෙන් පොලියක්ද ගෙවනු ලැබේ.

**6.4 ස්ථාවර තැන්පතු වල පවතින මුදල් අවුරුදු කිහිපයකදී දෙගුණයක් වන බව ඔබ දැන සිටියාද?**

මුදල් දෙගුණ වීමට ගතවන කාලය සොයා ගැනීමට අපට 72 නීතිය භාවිතා කළ හැක. එනම් 72 වාර්ෂික පොලි අනුපාතයෙන් බෙදීමයි.

උදාහරණය: වාර්ෂික පොලිය සියයට නවයක් (9%) යැයි සිතමු. 72 නවයෙන් බෙදූවිට උත්තරය 8 අටයි. එනම් වාර්ෂික පොලිය සියයට 9 බැගින් පැවතුණොත් අවුරුදු අටකදී ඔබගේ තැන්පත් මුදල දෙගුණ වෙන බවයි. මෙය සිදුවන්නේ මිශ්‍ර පොලි ක්‍රමයේ මහිමයෙනි, එනම් වැල් පොලී ක්‍රමයට පොලියටත් පොලිය එකතු වෙමින් වර්ෂයක් පාසා තැන්පත් මුදල වර්ධනය වන බැවිණි .

පැහැදිලි ඉලක්කයක් ඇතිව සැලසුමකට අනුව බැංකු ගිණුමක මුදල් ඉතිරි කළහොත් ඕනෑම අයෙකුට ටික කාලෙකදී ලක්ෂපතියෙක් විය හැක.

"ඔබේ උරුමකරුවන්ට
ධන සම්පත් ඉතුරු කර තැබීම,
ඔවුන්ට අනුන්ගෙන් ඉල්ලාගෙන
ජීවත්වීමට සිදුවන දුප්පතුන් බවට පත්වීමට
ඉඩහැරීමට වඩා හොඳය."

**ඉස්ලාම් දහමේ ඉගැන්වීමකි.**

# සටහන්

# 4
# මුදල් වියදම් කිරීමට තිබිය යුතු දැනුම

## 1.0 දැනුම

මුදල් උපයා ගැනීමටත්, මුදල් ඉතිරි කිරීමටත් වගේම මුදල් වියදම් කිරීමටත් දැනුමක් තිබිය යුතුය.

වියදම් පිළිබඳ ව දැනුමක් ඇතුව වියදම් කරන විට එය බුද්ධිමත් ලෙස කරන වියදමක් හැටියට හැඳින්විය හැක.




### 1.1 දැනුමක් ඇතිව කරන වියදම් යනු මොනවාද?

**"අවශ්‍යතාවයන්"** සපුරා ගැනීමටත්, **"ඉලක්ක"** මුදුන් පමුණුවා ගැනීමටත්, **"ජීවිතය සතුටින් ගත කිරීමටත්"** උපකාර වන අන්දමට හොඳට සිතා බලා කරන වියදම් දැනුමක් ඇතිව කරන වියදම් ලෙස හැඳින්විය හැක.

මෙයින් අදහස් වන්නේ වියදම් කරන සෑම රුපියලක් ගැනම ඔබ මනා සිහි බුද්ධියකින් සිටිය යුතු බවයි.

එසේ බුද්ධිමත්ව වියදම් කරන මිනිසුන් නිතරම සුවදායක මානසික තත්ත්වයකින් යුතුව ජීවත් වෙයි. තමන් විසින්ම ඉතිරි කරගත් සැලකිය යුතු මුදලක් සැමවිටම ඔවුන් සතුව පවතී. ඔවුන් කිසිවිටෙක ණය උගුල්වල සිර වන්නේ නැත. ණය බරෙන් පීඩිත වන්නේ ද නැත.

## 2.0 බුද්ධිමත් ලෙස වියදම් කිරීමට දැන සිටිය යුතු වචන දෙක

මෙම ඉතාමත්ම වටිනා වචන දෙකෙහි තේරුම අප කවුරුත් මනාව දැන සිටිය යුතුය.

### අවශ්‍යතා

### උවමනාවන්

බැලූ බැල්මට මේ වචන දෙකෙන් අදහස් වන්නේ එකම තේරුමක් යැයි ඔබට සිතෙන්නට පුළුවවන. නමුත් මේ වචන දෙකට තේරුම් දෙකක් ඇත.

- **අවශ්‍යතා**

  ජීවිතය සුවපහසුවෙන් පවත්වාගෙන යෑමට තිබිය යුතු දේ අවශ්‍යතාවයන් ලෙස හැඳින්විය හැක.

  **උදාහරණ :** ආහාර, නිවාස, ඇඳුම්, ඖෂධ වැනි ජීවිතයට නැතිවම බැරි දේ අවශ්‍යතාවයන් වේ.

  **අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට ඇති හොඳම මිනුම :** යම් දෙයක් නැතිව ජීවත් විය නොහැකි නම් ඒ දෙය අවශ්‍යතාවයකි.

- **උවමනාවන්**

  ජීවිතය වඩාත් සැපවත් කර ගැනීමට, වඩ වඩා සතුටු වීමට උපකාර වන බොහෝ දේවල් උවමනාවන් ලෙස හැඳින්විය හැක.

  නමුත් ඒවා නොමැතිවද ජීවිතය පවත්වාගෙන යෑමට පුළුවන.

  **උදාහරණ :** අලුත් වර්ගයේ දුරකථනයක්, නවීන පන්නයේ සුඛෝපභෝගී වාහනයක්, කීර්තිමත් වෙළඳ නාමයක් යටතේ අලෙවි කරන ඇඳුම් පැළඳුම්, මිල අධික ආහාර පාන, ආදී නොයෙකුත් දේවල් උවමනාවන් ලෙස සැලකිය හැක.

  **උවමනාවන් හඳුනා ගැනීමට තිබෙන එකම මිනුම :** යම් දෙයක් නැතිව වුවද ජීවත්විය හැකිනම් ඒ දෙය උවමනාවන් ගණයට ඇතුළත් වෙයි.




# 3.0 බුද්ධිමත් ලෙස මුදල් වියදම් කරන හැටි

පළමුව ඔබේ අවශ්‍යතාවන්ට මුදල් වියදම් කරන්න

උවමනාවන් සඳහා වියදම් කළ හැක්කේ ඉන් පසුවයි. එහෙත් ඔබේ මාසික ඉතිරි කිරීම් වලට ප්‍රමාණවත් තරම් මුදල් නොමැති නම් උවමනාවන් සඳහා වියදම් කිරීම ප්‍රමාද කළ යුතුය. සැම විටම ඔබේ ඉතිරි කිරීම් වලට බලපාන උවමනාවන් මගහරින්න. නැතහොත් ප්‍රමාද කරන්න. එවැනි උවමනාවන්ට වියදම් කළොත් ඔබට මුදල් ඉතිරි කළ නොහැකි බව පෙනේනම්, එවැනි උවමනාවන්ට වියදම් කිරීමෙන් වළකින්න. මන්ද ඒවා නැතිව වුවත් ජීවත්වීමට පුළුවන් බැවිනි.

## 3.1 අය-වැය

ඔබේ මුදල්වලින් ඔබ කරන්න යන්නේ කුමක්ද යන්න සැලසුම් කරන්නේ අයවැය ලේඛනය මගිනි. තමන්ගේ මුදල් කළමනාකරණය කර ගැනීමට දුප්පත් පොහොසත් කාටත් අයවැය ලේඛනය ප්‍රයෝජනවත් වේ. මෙහිදී විශේෂයෙන්ම ඔබට ඔබගේ වියදම් සැලසුම් කර ගැනීමට අවස්ථාව ලැබේ. ඔබේ මුදල් වලින් කල හැකි දේ නම් වියදම් කිරීම, ඉතිරි කිරීම හා ආයෝජනය කිරීමයි. වියදම් සැලසුම් කර ගැනීමෙන් මේ කාර්යයන් තුනම මනාව ඉටු කර ගැනීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

**බුද්ධිමත්ව වියදම් කරන්න - නිතිපතා ඉතිරි කරන්න**
**ඥානාන්විතව ආයෝජනය කරන්න**

## 3.2 වියදම් සැලසුම

මනාව පිළියෙල කරගත් වියදම් සැලසුමක් ඔබට තිබේනම්, එය ඔබේ මුදල් කළමනාකරණය කරගැනීමට ලොකු උදව්වකි. වියදම් සැලසුමක් සකස් කරගන්නේ කොහොමද?

**පළමු පියවර :** මාසයක හෝ යම් කාල සීමාවක් තුළදී ඔබට ලැබෙන සියලුම ආදායම් සහ සියලු වියදම් සටහන් කරන්න.

**දෙවන පියවර :** ඔබට ලැබුණු එම ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් පහත දැක්වෙන කාරණා තුනට වෙන් කළ යුතුද යන්න ඔබම තීරණය කරන්න.

i. **අවශ්‍යතා :** ආහාර, නිවාස, බෙහෙත් ද්‍රව්‍ය, ඇඳුම්, ගමනාගමනය ආදී ඔබේ අවශ්‍යතා වලට කොපමණ මුදලක් වෙන් කළ යුතු ද?

ii. **ඉතිරි කිරීම් :** ඔබට ඉතිරි කිරීම් වර්ග දෙකක් ඇත. එනම් හදිසි අවස්ථාවල දී පාවිච්චිය පිණිස කරන ඉතිරි කිරීම සහ අනාගත මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට කරන ඉතිරි කිරීම් යනුවෙනි.

iii. **ජීවන රටාව :** විනෝදාස්වාදය, සාජ්පු සවාරි, හොඳ හෝටලවලින් ආහාර ගැනීම, ප්‍රිය සාද, විනෝද ගමන් ආදී දේ.

ඉතිරිකිරීම් වලට සියයට විස්සක් සහ ඔබ රුචිකරන ජීවන රටාවක් පවත්වා ගැනීම සඳහා සියයට විස්සක් වැනි වියදම් රාමුවක් සකස් කරගන්න. අඩු ආදායම්ලාභියෙකුට ආරම්භයේදී මෙම අනුපාතයන් ප්‍රයෝජනවත් විය හැක. පසුව ආදායම් වැඩි වන විට අනුපාතයන්ද වෙනස් කර ගැනීමට ඔබට පුළුවන. අවශ්‍යතා සඳහා සියයට පනහක්, ඉතිරි කිරීම් වලට සියයට විසි පහක් සහ ඔබේ ජීවන රටාවට සියයට 25 ක් ආදී වශයෙනි.

බුද්ධිමත් ලෙස වියදම් කිරීමට නම් ඔබට වියදම් සැලසුමක් අනිවාර්යයෙන්ම තිබිය යුතුයි.

කිසිම සැලසුමක් නැතුව මුදල් වියදම් කරන බොහෝ දෙනකු අපට හමුවී ඇත. ඔවුන්ගේ වියදම් ගැන ඔවුන්ටම පුදුමය.

"අතේ තිබුණු සල්ලි වලට මොනවා උනාද කියා මම දන්නෙ නෑ"

"සල්ලි ටික වාෂ්ප උනා වගේ"

"අද කාලෙ කොච්චර සල්ලි තිබුණත් මදි අප්පා වැනි කතා ඔබටත් අසන්නට ලැබී ඇතැයි සිතමු.

# 4.0 උපාය මාර්ග පහක්

අපේ රටෙත් වෙනත් බොහෝ රට වලත් මූල්‍ය සාක්ෂරතාවය තිබෙන මිනිසුන් වියදම් පාලනය කර ගැනීමට භාවිතා කරන උපාය මාර්ග පහක් පොත්පත්වල දක්වා ඇත. ඔවුන් තමන්ට මුදල් ලැබුණ විට හිතු මතේ වියදම් කරන්නේ නැත. කල්පනාකාරීව වියදම් කිරීමේදී ඔවුන් අනුගමනය කරන උපායමාර්ග පහතින් දක්වා ඇත.

i. **ලැයිස්තුවකට අනුව බඩු මිලදී ගැනීම :** මිලදී ගැනීමට අවශ්‍ය දේවල්වල ලැයිස්තුවක් කඩමන්ඩියට යෑමට පෙර සකස් කර ගත යුතුය. එවැනි බඩු ලැයිස්තුවක් සකස් කරන විට අනවශ්‍ය දේවල් මිලදී ගැනීමෙන් වැළකෙන බව ඔබටම වැටහෙයි. එය ම ජයග්‍රහණයකි.




ii. **බඩු මිල සංසන්දනය කිරීම :** එකම භාණ්ඩය විවිධ වෙළඳසැල්වලින් මිලදී ගැනීමට පුළුවන. භාණ්ඩ මිලට ගැනීමට පෙර විවිධ කඩ සාප්පුවල එම භාණ්ඩ විකුණන මිල ගණන් ගැන සොයා බැලීම ප්‍රයෝජනවත් වෙයි. වර්තමානයේදී අන්තර්ජාලය හරහා ද වෙළඳාම් කරන බැවින් ඒ තුළින් ද මිල ගණන් සසඳා බැලීමට අවස්ථාව ලැබී තිබේ. ඇතැම් විට එකම භාණ්ඩයට වෙළඳසැල් කිහිපයක විවිධ මිල ගණන් තිබෙන බව ඔබට පෙනී යනු ඇත. මිල අඩු වෙළඳසැලකින් ම එම භාණ්ඩ මිලට ගැනීමට ඔබට අවස්ථාව ලැබේ. “මමත් අහු උනානෙ, ඒ කඩේ බඩු ගිනි ගණන්” ආදී වශයෙන් පසුව ආඩාපාලි කීමෙන් වැඩක් නැත.

iii. **වට්ටම්වලින් ප්‍රයෝජනය ගැනීම :** වර්තමානයේ දී වෙළඳ ව්‍යාපාර විවිධ ආහාර වර්ග සහ උපයෝගී භාණ්ඩ මිල අඩුකර විකුණන අවස්ථා (වට්ටම් දෙන අවස්ථා) දකින්නට පුළුවන. එවැනි අවස්ථාවලින් ප්‍රයෝජනය

ගැනීමට පාරිභෝගික ඔබ දක්ෂ විය යුතුය. එසේ නිතර නිතර මිළ අඩු කරන නැතහොත් වට්ටම් ලබා දෙන ආයතන පවතී. එසේම නිතරම පාහේ මිල අඩුවන ද්‍රව්‍යද පවතී. එවැනි අවස්ථා ගැන විමසිලිමත්ව සිටීමෙන් කල්පනාකාරී පුද්ගලයෙකුට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් වැය කළ යුතු මුදලින් යම් ප්‍රමාණයක් අඩුකර ගැනීමට පුළුවන.

iv. **භාණ්ඩ වල වල දිගුකාලීන පැවැත්ම ගැන සැලකිලිමත් වීම:** දිගුකාලීන පැවැත්ම සහතික කර ඇති කීර්තිමත් වෙළඳ නාම යටතේ අලෙවි කරන ඇතැම් භාණ්ඩ එවැනිම සාමාන්‍ය භාණ්ඩවලට වඩා තරමක් මිලෙන් වැඩිය. මිල අඩු නිසාම “බාල බඩු” මිලට ගත යුතු නොවේ. මිල තරමක් වැඩි වුවද කල්පැවැත්ම වැඩි හා නිතර නිතර අලුත් වැඩියා කිරීමට අවශ්‍ය නොවන භාණ්ඩ මිලට ගැනීමෙන් මුදල් ඉතිරි කර ගැනීමට හැකිවේ.

v. **මිලදී ගැනීම කල් දැමීම:** එතරම් අත්‍යවශ්‍ය නොවන යම් භාණ්ඩයක් දුටු පමණින්ම මිලදී නොගෙන සිටිය හැක. මෙය මිලදී ගැනීම කල් දැමීමකි. මෙය අත්‍යවශ්‍ය නොවන සෑම භාණ්ඩයක් සඳහාම අදාළ කර ගත හැකි උපක්‍රමයකි. දින කීපයක් ගතවන විට එය මිලදී ගැනීමට තිබූ උනන්දුව ක්‍රමයෙන් අඩු වී යයි. සමහර විට මිලදී ගැනීම අත්හැර දමයි. එසේ වන්නේ එම භාණ්ඩය පිළිබඳව ගැඹුරින් සිතා බැලීමට කාලය ලැබුණු බැවිනි.

රාම වික්‍රම පවුලේ කතාව බලන්න

# 5.0 කතන්දර අංක 03

## 5.1 රාම වික්‍රම පවුලේ කතාව

**ගෘහ මූලික** : රාම වික්‍රම මහතා
**රැකියාව** : පෞද්ගලික අංශයේ කම්කරු
**මාසික වැටුප** : රුපියල් 42,000.00

**පවුලේ සාමාජික ගණන :** 3 රාම වික්‍රම මහතා සහ එම මහත්මිය හා එකම පුතා බොහෝ කලක සිට ම රාම වික්‍රම මහත්මිය පවුලේ ජීවන වියදම දැරීමට දායක වූවාය. ඇය විසින් මසා නිම කරන ඇඳුම් ප්‍රසිද්ධ රෙදි සාප්පුවකට විකිණීමෙන් මසකට රුපියල් (24,000 ) විසිහතර දහසක් පමණ උපයා ගනී.

රාම වික්‍රම පුතා ද මුදල් උපයන්නෙකි. විදුලි භාණ්ඩ අලුත්වැඩියා කිරීමෙන් සහ නිවෙස් වල විදුලි රැහැන් ඇදීමෙන් ඔහු මසකට රුපියල් (30,000) තිස් දහසක් පමණ ආදායමක් උපයාගනී. ඔහු තවමත් දෙමව්පියන්ගෙන් යැපෙන්නෙකි. එබැවින් දෙමව්පියන්ගේ ද අනුදැනුම ඇතිව මසකට රුපියල් විසි දහසක් පමණ බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පත් කරයි. දැනටමත් ඔහුට රුපියල් ලක්ෂ දෙකක ස්ථාවර තැන්පතුවක් ඇත. කාලයක සිට මුදල් ඉතිරි කළ බැවින්, රාම වික්‍රම යුවළට රුපියල් ලක්ෂ විස්සක පමණ ස්ථාවර තැන්පතු තිබේ.

රාම වික්‍රම පවුලේ මුළු ආදායම රුපියල් (96,000) අනූ හය දහසකි.

| | |
|---|---|
| **අවශ්‍යතා :**<br>ආහාර පාන, ගමනාගමනය හා බෙහෙත් ද්‍රව්‍ය ආදියට | රුපියල් 48,000.00 |
| **පවුලේ ඉතිරි කිරීම් :** රාම වික්‍රම මහතා සහ මහත්මියගේ බද්ධ ගිණුම: | රුපියල් 14,000.00 |
| පුතාගේ ඉතිරිකිරීමේ ගිණුම : | රුපියල් 20,000.00 |
| ජීවන රටාව (විනෝදාස්වාදය සඳහා) | රුපියල් 14,000.00 |
| **එකතුව;** | **රුපියල් 96,000.00** |

## 5.3 රාම වික්‍රම පවුලේ රහස්

රාම වික්‍රම පවුල ඔවුන් උපයන මාසික ආදායම් සීමාව තුළ වියදම හසුරවා ගැනීමට සමත්ව සිටි. ඔවුන්ගේ මාසික ආදායමෙන් සියයට පනහක් අවශ්‍යතා සඳහා වැය කරයි. ඉතිරි කිරීම් සඳහා සියයට තිස්පහක්ද, විනෝදාස්වාදය සියයට පහළොවක් ද වියදම් කරයි.

බොහෝ කාන්තාවන් අර පිරිමසුම් දායක ලෙස වියදම් කිරීමට සමත් වෙයි. මෙහිදී ද පවුලේ මුදල් පාලනය රාම වික්‍රම මහත්මියට පැවරී ඇත .

රාම වික්‍රම මහතා වෙළඳපොලෙන් බඩු මිලදී ගන්නේ නැත. බොහෝ පිරිමින් මෙන් ඔහු ද වියදම් පාලනයට අසමත් බැවිනි.

සතිපතා නිවසට අවශ්‍ය බඩු මොනවාද යන්න රාම වික්‍රම මහත්මිය කලින් තීරණය කරයි. එම අවශ්‍යතා කොළ කැබැල්ලක ලියයි. ඇය සතිපතා බඩු මිලදී ගැනීමට වෙළඳපොළට යන්නේ එම බඩු තුන්ඩුව ද රැගෙනය. එහි ලියා නැති කිසිවක් ඇය මිලදීගන්නේ නැත.

මිලට ගන්නා බඩු රාම වික්‍රම මහත්මිය විසින් අර පිරිමැස්මෙන් යුතුව පාවිච්චි කරයි. නාස්ති කරන්නේ නැත.

රාම වික්‍රම මහතාට ද අනවශ්‍ය වියදම් නැත. ඔහු සුරා සූදුවලින් තොරය. දුම් පානය කරන්නේ ද නැත.

තරුණ පුතාගේ අනාගතය ගැන සැලකිලිමත් වූ දෙමාපියන් හැටියට රුපියල් විසි දහස බැගින් මාසිකව ඉතුරු කරන ලෙස ඔහුට උපදෙස් දෙන ලද්දේ ද රාම වික්‍රම යුවළ විසිනි.

# 6.0 වියදම් උගුල්

උගුලකට අසුවීම යන්නෙන් අදහස් කරන්නේ ගැලවීමට අපහසු ලෙස යම් දෙයකට හිරවීමයි. වියදම් උගුල් ද එසේය. වියදම් උගුලකට අසුවූ විට, එම පුද්ගලයාට යම් යම් දේ මිලදී ගැනීමට හෝ යම් යම් අය වෙනුවෙන් වියදම් කිරීමට හෝ පොළඹවන සුළු වාතාවරණයක් ඇතිවේ.

i. **ආවේගශීලි බව** එවැනි එක් උගුලකි . කිසියම් ආවේගයකින් ක්‍රියා කරන පුද්ගලයෙකු ඒ අවස්ථාවේදී යම් මිලදී ගැනීමක් හෝ යම් වියදමක් කරන විට මිලට ගන්නා භාණ්ඩය ගැන හෝ කරන වියදම ගැන හෝ වැඩිදුර කල්පනා කරන්නේ නැත. මෙය අප කාටත් සිදුවිය හැකි දෙයකි. අප බොහෝ දෙනා ආවේගශීලී වන බැවිනි. එවැනි අවස්ථාවලදී දුරදිග බලන්නේ නැත. ක්ෂණිකව මුදල් වියදම් කරයි. බොහෝ විට ආවේගශීලී ලෙස වියදම් කළ අයෙකුට කෙටි කලකින්ම හොඳ සිහිය එයි. " ඒ වියදම නොකර හිටියනම් හොඳයි කියල දැන් මට හිතෙනවා" වැනි ප්‍රකාශන අසන්නට ලැබෙන්නේ එබැවිණි. නමුත් අශ්වයා ගියාට පසු ඉස්තාලය වැසීමෙන් ප්‍රයෝජනයක් නැත.

ii. **සහචර බලපෑම** තවත් එවැනි උගුලකි. සහචරයන් යනු යම් අයෙකු විසින් සමීපව ආශ්‍රය කරනු ලබන, ඔහු වටා සිටින, ඔහු හා සමාන මට්ටමේ පුද්ගලයන්ය. ඇතැම් අය සිය සහචරයන් සතුටු කිරීම සඳහා නැතහොත් සහචරයන් විස්මයට පත් කිරීම සඳහා අසාමාන්‍ය වියදම් කරති. එක් අයෙකු නවීන පන්නයේ මෝටර් රථයක් මිලදී ගත්තේ යැයි සිතමු. එය අනෙකාටද බලපෑමක් වනු ඇත. තමන් සතු දෙයක් විකුණා හෝ මූල්‍ය සමාගමකට ණය වී හෝ තම සහචරයා මිලදී ගත් වර්ගයේ වාහනයක් මිලදී ගන්නා තුරු ඔහුට නින්ද යන්නේ නැත. සහචර බලපෑම වාහන මිලදී ගැනීමට පමණක් සීමා නොවේ. නිවාස තැනීම, විවාහ මංගල උත්සව පැවැත්වීම, යම් යම් භාණ්ඩ මිලයට ගැනීම, දෙස් විදෙස් සංචාර වැනි නොයෙකුත් කාරණාවලදී ඉවක් බවක් නැතිව කරන වියදම් සහචර බලපෑමෙ තරම ප්‍රදර්ශනය කරයි.




iii. **උද්ධමනකාරී ජීවන රටාව** තවත් බරපතල වියදම් උගුලකි. මෙය කවුරුත් කතා කරන උද්ධමනය නොවේ. ව්‍යවහාර භාෂාවෙන් කියන්නේ නම් "සෝබනයට වියදම් කරනවා" යනු මෙම ජීවන රටාවයි. යම් අයෙකුගේ ආදායම් වැඩිවන විට මුදල් ඉතිරි කරනවා වෙනුවට වැඩි වැඩියෙන් වියදම් කිරීමට පෙළඹීම මෙම ජීවන රටාවේ තිබෙන උද්ධමනකාරී ලක්ෂණය වෙයි.

iv. **චිත්ත වේග අනුව කරන වියදම්** ද වියදම් උගුලක් ලෙස හඳුනා ගැනීමට පුළුවන. පෙර සඳහන් කළ ආවේගශීලි වියදම් වැඩිදුර නොසිතා සිදු කරන ක්ෂණික වියදම් වෙයි. නමුත් චිත්ත වේග අනුව කරන වියදම් බොහෝ විට යම් මානසික තත්ත්වයක් යටතේ සිදුකරන ඒවාය. මානසික ආතතිය, කම්පනය, දුක හෝ අධික සතුට වැනි තත්ත්වයන් යටතේ පුද්ගලයන් අනවශ්‍ය වියදම් කරන අවස්ථා දක්නට පුළුවන.

මෙවැනි වියදම් උගුල් වලට හසු නොවී තම මුදල් ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීමට මූල්‍ය සාක්ෂරතාවය ප්‍රයෝජනවත් වෙයි.

## 7.0 අනවශ්‍ය වියදම් වළකා ගන්නේ කෙසේද ?

යම් භාණ්ඩයක් මිලදී ගැනීමට පෙර පහත සඳහන් ප්‍රශ්ණ දෙක ඔබගෙන්ම අසන්න.

I. **ඇත්ත වශයෙන්ම මේ දේ මට අවශ්‍යද?**

II. **මෙහි වටිනාකම නොවෙනස්ව පවතීද?**

මීට අමතරව පහත සඳහන් වියදම් කිරීමේ පුරුදු වැඩිදියුණු කරගන්න.

### දිනපතා සිදු කරන වියදම් සටහන් පොතක ලියා තබා ගැනීම

සෑම මාසයක් අවසානයේදීම ඒ මාසය තුළ සිදු කරන ලද වියදම් සමාලෝචනය කර බැලීම (අනවශ්‍ය වියදම් කර ඇත්නම් ඒවා හඳුනාගැනීමට මෙය ප්‍රයෝජනවත් වෙයි.)

### "මුදලට සරිලන වටිනාකම" නමැති සංකල්පය භාවිතා කරන්න.

මෙහිදී භාණ්ඩයේ ඇති ගුණාත්මක බව සහ ප්‍රයෝජනවත් බව සැලකිල්ලට ගත යුතුය.

අධ්‍යාපනය, නිවාස තැනීම, ව්‍යාපාරයක් ඇරඹීම වැනි ඔබේ ජීවිතයේ ඇති විවිධ ඉලක්ක සමඟ ඔබේ වියදම් ගලපා බලන්න.

මෙවැනි පුරුදු දැන සිටීම ප්‍රයෝජනවත් වෙයි.

වඩාත් ප්‍රයෝජනවත් වන්නේ ඒවා පුරුදු කිරීමය; එනම් ප්‍රායෝගිකව ඔබේ දෛනික ජීවිතය තුළ ඒවා භාවිතයට ගැනීමය.

බුද්ධිමත් ලෙස වියදම් කිරීම යනු හොඳ සිහියෙන් යුතුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමයි. ඔබගේ සතුට සඳහා කරන වියදම් සියල්ල කපා හැරිය යුතු යැයි මෙයින් අදහස් කරන්නේ නැත. එහෙත් වියදම් කළ යුත්තේ යම් යම් පරමාර්ථ වෙනුවෙනි. ඔබ බුද්ධිමත් ලෙස වියදම් කරන්නට ආරම්භ කළ විට ඔබගේ කරදර ද අඩුවන්නට පටන් ගනී. ඔබේ ඉතිරි කිරීම් ද වර්ධනය වනු ඇත. එලෙස ඔබගේ මූල්‍ය ස්වාධීනත්වය සඳහා ශක්තිමත් පදනමක් ඇතිවේ.

# සටහන්

# 5
# මුදල් ආයෝජනය කිරීම

## 1.0 මුදල් ආයෝජනය කිරීම

කාලයත් සමඟින් ඔබගේ මුදල් වල වටිනාකම ආරක්ෂා වන පරිදි වත්කම් සඳහා මුදල් යෙදවීම ආයෝජනයක් ලෙස සරලව හඳුනාගනිමු. මෙතැනදී මුදලේ වටිනාකම වර්ධනය කිරීමට හැකියාව ඇති වත්කම් හඳුනාගත යුතුය.

ආයෝජන සහ ඉතිරිකිරීම් අතර වෙනසක් පවතී.

**ඉතිරිකිරීම්** ප්‍රධාන වශයෙන් අරමුණු කරන්නේ මුදලේ ආරක්ෂාව සහ තමන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී ඒවා කාසි හා නෝට්ටු වලින්ම ලබාගත හැකි බවයි.

**ආයෝජනවල** එකම අරමුණ නැතහොත් ඉලක්කය වන්නේ ධනය වර්ධනය කර ගැනීම තුළින් දිගුකාලීන වශයෙන් මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කරගැනීමයි.

**"වැඩි ආරක්ෂාව අඩු ප්‍රතිලාභ - වැඩි අවදානම වැඩි ප්‍රතිලාභ"**

වර්තමානයේ බොහෝ දෙනෙකුට මුදල් ඉතිරි කිරීම පිළිබඳව දැනුමක් පවතී. නමුත් ආයෝජන පිළිබඳව දන්නා අය අඩු ය. මේ දෙකම නොදන්නා අයද සමාජයේ සිටී. එවැනි අයට ධනවත් වීමට හෝ අනාගත මූල්‍ය සුරක්ෂිත භාවයක් ඇති කර ගැනීමට ඇති ඉඩකඩ ඉතා සීමිතය.

## 2.0 ඉතිරිකිරීමෙන් ඔබේ මුදල් ආරකෂාවේ

**මෙහිදී ඔබ හොඳින් සිතා බලා ශක්තිමත් මූල්‍යය ආයතනයක ඔබේ මුදල් තැන්පත් කළ යුතුය. එවිට ඒවා ආරක්ෂාව වනු ඇත. ඔබට අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ඒවා ආපසු ගැනීමටද පුළුවන. නමුත් එසේ ඉතිරි කරන මුදල් වර්ධනය වන්නේ සෙමිනි.**

## 3.0 ආයෝජනය කිරීමෙන් ඔබේ මුදල් වේගයෙන් වර්ධනය වේ.

**ආයෝජනය කිරීමෙන් ඔබේ මුදල් වේගයෙන් වර්ධනය විය හැක. ආයෝජනය කරන ලද මුදල ඉතා කෙටි කාලයකදී දෙගුණ තෙගුණ විය හැක. නමුත් ඕනෑම ආයෝජනයක යම් ප්‍රමාණයක හෝ අවදානමක් පවතින බවද අප දැන සිටිය යුතුය.**

**මෙහිදී අවදානම සහ ප්‍රතිලාභ අතර සම්බන්ධතාවය පෙන්නුම් කරන ප්‍රසිද්ධ වගන්තියක් දක්වමු.**

**එනම්, ආයෝජනය ආරක්ෂිතයි, එහෙත් ප්‍රතිලාභ අඩුයි. - ප්‍රතිලාභ වැඩි නම් ආයෝජනයේ අවදානමත් වැඩියි.**

**උදාහරණය :** ඔබට නීත්‍යානුකූල බැංකු ආයතනයක ස්ථාවර තැන්පතු ගිණුමක් ඇත. එය ඉතාමත්ම ආරක්ෂා සහිතයි. නමුත් වෙනත් ආයෝජනවලට සාපේක්ෂකව ප්‍රතිලාභ අඩුයි. වර්තමානයේ පොලී ප්‍රතිශතය සියයට අටක් පමණ වෙයි. ඒ අනුව ඔබේ මුදල දෙගුණ වීමට වර්ෂ නවයක් හෝ දහයක් පමණ ගත විය හැක. ඔබ කොටස් වෙළඳපොලේ ආයෝජනය කරමින් සමාගම් කිහිපයක ව්‍යාපාර කොටස් මිලදී ගෙන ඇතැයි සිතමු. එම සමාගම්වල කොටස් වටිනාකම සීඝ්‍රයෙන් වැඩි වීමට ඉඩ තිබේ. වැඩිවන මිල ගනන් යටතේ කොටස් විකිණීමෙන් ඔබ ආයෝජනය කරන ලද මුදල ඉතා ඉක්මනින් වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. එසේ වුවද එහි ලොකු අවදානමක් පවතී. එනම් සමාගම්වල කොටස් මිල ගණන් නොසිතූ පරිදි අඩුවීමට ඉඩ ඇති බැවිනි. ඇතැම් විට එම කොටස් මිලදී ගත් මිලටත් වඩා අඩු මිලකට විකිණීමට සිදුවිය හැක. අවදානම එයයි. එබැවින් කොටස් වෙළඳපොලේ ආයෝජනය කරන අයෙකු කොටස් මිල ගනන් ඉහළ පහළ යෑම පිළිබඳව පරීක්ෂාකාරීව සිටිය යුතුය.

# 4.0 ආයෝජන අවස්ථා

මුදල් ආයෝජනය කිරීමට අවස්ථා නැතහොත් ආයෝජන මාර්ග රාශියක් තිබිය හැකිය. අප විසින් තෝරා ගත යුත්තේ අපේ මුදල් වලට ආරක්‍ෂාවත් ප්‍රමාණවත් ප්‍රතිලාභත් ලැබෙන ආයෝජන මාර්ගයන්ය.

## 4.1 ස්ථාවර තැන්පත්

ස්ථාවර තැන්පත් හොඳ ආයෝජන මාර්ගයෙකි. සෑම නිත්‍යානුකූල බැංකු ආයතනයක්ම ස්ථාවර තැන්පත් ගිණුම්වල මුදල් අයෝජනය කිරීමට මහජනතාවට අවස්ථාව සලසා ඇත. ස්ථාවර තැන්පත් සඳහා ගෙවන පොලිය තමන් කැමතිනම් මාසිකව ලබා ගැනීමටද පුළුවන. එසේ කිරීමෙන් පොලි එකතු වීමක් සිදුවන්නේ නැත. වඩාත් ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමට නම් එම තැන්පත් මුදල හෝ එකතු වන පොලී මුදල් හෝ කලින් කලට ලබාගන්නේ නැතුව වර්ෂයක් පාසා තැන්පතුව අලුත් කරමින් ඉදිරියට ගෙන යාමයි. එසේ වර්ෂ කීපයක් නොකඩවා ආයෝජනය පවත්වාගෙන යෑමෙන් වාර්ෂිකව එකතුවන පොලියට ද පොලිය එකතු වී සංයුක්ත පොළිය හෙවත් මිශ්‍ර පොලි (වැල් පොලී) නිසා ඔබේ මුදල් කිහිප ගුණයකින් වර්ධනය කර ගැනීමට පුළුවන. ගිණුම කල්පිරන විට යළි ආයෝජනය කරන ලෙස ආරම්භයේදීම බැංකුවට උපදෙස් දීමෙන් ඔබේ මුදල දෙගුණ තෙගුණ කර ගැනීමේ අවස්ථාව උදාකර ගැනීමට පුළුවන.

තැන්පත් කරන මුදලේ ආරක්ෂාවටත්, මුදලේ අනාගත වටිනාකම ආරක්‍ෂා කර ගැනීමටත් ස්ථාවර තැන්පතු තෝරා ගැනීම සුදුසු වේ.




## 4.2 කොටස් වෙළෙඳපොලේ ආයෝජනය

යම් සමාගමක ප්‍රාග්ධනය සමාන කොටස් වලට බෙදූවිට එහි එක් පංගුවකට අපි කොටසක් යැයි කියමු.

සමාගම්වල ප්‍රාග්ධනය කොටස් වශයෙන් විකිණීමට පුළුවන. කොටස් විකිණීමෙන් ව්‍යාපාරික සමාගම එයට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගනී. එම ව්‍යාපාර කොටස් මිලදී ගැනීමෙන් ඕනෑම අයෙකුට එම සමාගමේ කොටස් හිමියෙක් නැතහොත් අයිතිකාරයෙක් වීමට පුළුවන. අයිතිකාරයාට අයිති කොටස් ප්‍රමාණයට අනුව ව්‍යාපාරික සමාගමේ ලාභයෙන් කොටසක් (ලාභාංශ) හිමි වෙයි. කොටස් හිමියෙකුට ඕනෑම අවස්ථාවකදී තමන්ට හිමි කොටස් ප්‍රමාණය විකුණා මුදල් කර ගැනීමටද පුළුවන.

ව්‍යාපාර කොටස් මිලදී ගැනීමටත් විකිණීමටත් පහසුකම් සලස්වන ස්ථානය කොටස් වෙළඳපොලයි. ශ්‍රී ලංකාවේ එය හඳුන්වන්නේ කොළඹ කොටස් හුවමාරුව නමිනි.

කොටස් වෙළඳපොලට ඇතුළත් වී සමාගම්වල කොටස් මිලදී ගැනීම සහ විකිණීම කළ හැක්කේ කොළඹ කොටස් හුවමාරුවෙහි ලියාපදිංචි තැරැව්කාර ආයතන හරහා පමණි.

කොටස් වෙළඳපොළේ ආයෝජනය කරන කෙනෙකුට ලැබෙන ප්‍රතිලාභ දෙවර්ගයකි.

i. **ලාභාංශ**

සමාගම වාර්ෂිකව ලබන ලාභයෙන් යම් ප්‍රතිශතයක් කොටස් හිමියන් අතර බෙදිය යුතුය. සෑම කොටස් හිමියෙකුටම ඔවුන් සතු කොටස් ප්‍රමාණය අනුව එම ලාභාංශ ගණනය කොට වර්ෂ අවසානයේදී ගෙවයි.

ii. **ප්‍රාග්ධන ලාභ**

බොහෝ දෙනෙක් කොටස් වෙළඳපොලේ ආයෝජනය කරන්නේ ලාභාංශ ලබා ගැනීමට ම නොව ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමේ චේතනාවෙනි. සමාගම් කොටස්වල වටිනාකම දිනපතා ඉහල පහල යයි. එබැවින් තමන් සතු කොටස්වල වටිනාකම ඉහළ යන අවස්ථාවලදී ගත් මිලට වඩා වැඩි මිලකට එම කොටස් විකිණීමෙන් ආයෝජකයාට ප්‍රාග්ධන ලාභ ලැබිය හැකිය.

එසේම කොටස් මිල පහළ වැටීමෙන් ඒවා ගත් මිලට වඩා අඩු මිලකට විකිණීමට සිදුවුවහොත් ආයෝජකයාට පාඩු සිදුවේ.

## 4.3 ඉඩම් ගොඩනැගිලි හා වෙනත් දේපොළ

දේපොළ මිලට ගෙන තබා ගැනීම හොඳ ආයෝජනයක් යැයි ප්‍රකාශ වෙයි. මිල මට්ටම සීඝ්‍රයෙන් පිරිහෙන ආර්ථිකයක එවැනි දේපල වලට වටිනාකමක් ලැබෙයි. එම භෞතික සම්පත් රැස්කර ගැනීමෙන් මුදලේ වටිනාකම ආරක්ෂා කර ගැනීමට පුළුවන. එසේ වුවද එවැනි දේපොළ වස්තුව සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට පරිශ්‍රමයක් දැරීමට සිදුවේ.




එබැවින් ආයෝජනයක් හැටියට භෞතික සම්පත් රැස්කර තබා ගන්නා අය ඒවායේ ආරක්ෂාවට අවශ්‍ය විධිවිධාන ද යොදාගත යුතුය. එසේම එම දේපල වලට අදාළව තිබිය යුතු නීතිමය ලියවිලි ද එනම් ඉඩම් ඔප්පු, ගිවිසුම් පත්‍ර ආදිය නීතියට අනුකූලව නිසි ලෙස සකස් කර ගෙන තබාගත යුතුය. එසේ නොවුවහොත් පසුකාලයකදී ඒවායේ අයිතිය හා හා උරුමය පිළිබඳව ගැටලු පැන නැගීමට ඉඩ තිබේ.

## 4.4 ආයෝජනය කිරීමේ ප්‍රයෝජන

ඔබ ඉතා මහන්සියෙන් උපයා සපයා ගත් රුපියල් ලක්ෂයක පමණ මුදලක් ඔබගේ නිවසේම තබාගෙන ඇතැයි සිතමු. අවුරුදු දහයකට පසුවත් එහි වටිනාකම රුපියල් ලක්ෂයක් ම පමණි. නමුත් ඒ වන විට ආහාරපාන, බෙහෙත් ද්‍රව්‍යය, ඇඳුම් පැළඳුම් ආදියේ මිල ගණන් ඉතා විශාල වශයෙන් ඉහළ ගොස් තිබීමට ඉඩ තිබේ. එබැවින් නිවසේ තබා ගෙන සිටි රුපියල් ලක්ෂය වටිනාකම අවුරුදු දහයකට පසු බොහෝ දුරට අඩු වීමට ඉඩ තිබේ.

නිවසේ තබා ගැනීම වෙනුවට ඔබ එම මුදල අඩුම වශයෙන් බැංකුවක ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණේ නම් කාලයත් සමඟ එම මුදලේ වටිනාකමද වැඩිවීමට ඉඩ තිබුණි.

නිෂ්ක්‍රීය මුදල්වලට වඩා යම් යම් ආයෝජනවල යොදවන මුදල් සක්‍රීය ලෙස ඔබ වෙනුවෙන් වැඩ කරයි.

"අවුරුද්දකදී තමන්ට
කළ හැකි දේ ගැන
බොහෝ දෙනාට ඇත්තේ
අධි තක්සේරුවකි.
එහෙත් අවුරුදු දහයක් තුළදී
ඔවුන්ට කළ හැකි දේ
අවතක්සේරු කරති."

# සටහන්

# 6
# ණය මුදල්

## 1.0 ණය මුදල්

අපේ අවශ්‍යතා සපුරා ගැනීමට අප ළඟ තිබෙන මුදල් පමණක් ප්‍රමාණවත් නොවන අවස්ථා උද්ගත වෙයි. එවැනි අවස්ථාවලදී අපට ණය මුදල් ලබා ගැනීමට සිදුවේ. පසු අවස්ථාවක දී නැවත ආපසු ගෙවන බවට පොරොන්දු වෙමින් වෙනත් ආයතනයකින් හෝ පුද්ගලයෙකුගෙන් මුදල් ඉල්ලා ගැනීම “ණය ගැනීම” ලෙස හැඳින්විය හැක.

### 1.1 මිනිසුන් ණය ගන්නේ ඇයි?

ජීවත්වීමේදී උද්ගතවන විවිධ අවශ්‍යතාවන් සඳහා ඕනෑම අයෙකුට ණය ගැනීමට සිදුවිය හැක. වර්තමාන සමාජයේ එය ස්වාභාවිකය. ණය මුදල් ලබා ගැනීමට හේතුවන ප්‍රධාන කාරණා හතරක් දැක්විය හැක.

i. යම් මිල අධික වස්තුවක් මිලයට ගැනීම අත්පත් කර ගැනීම හෝ ගොඩනැගීම සඳහා. (උදාහරණ : නිවාසයක් ඉඩමක් හෝ වාහනයක් වැනි)

ii. ආදායම් උත්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ තිබෙන ව්‍යාපාරයක් තවදුරටත් වැඩිදියුණු කර ගැනීම සඳහා

iii. අධ්‍යාපන හෝ සෞඛ්‍ය වියදම් පියවා ගැනීම පිණිස

iv. අනපේක්ෂිත හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා

එවැනි කාරණා සඳහා ණය මුදල් ලබා ගැනීම නරක දෙයක් නොවේ. එහිදී ඉතාමත්ම වැදගත් වන්නේ එසේ ලබා ගන්නා ණය මුදල තමන්ට ආපසු ගෙවිය හැකිද යන කරුණයි.

ඔබේ ජීවිත සුබ සිද්ධිය සඳහා හෝ අනාගතයේදී වැඩි වැඩිය මුදල් ලැබීම සඳහා උපකාර වන කටයුත්තකට හෝ ණය මුදල් ලබා ගන්නේ නම් එය නුවණින් යුතුව ණය ගැනීමකි. තමන්ට දරා ගත නොහැකි සුඛෝපභෝගී භාණ්ඩ, වාහන හෝ ප්‍රීති උත්සව හෝ සාද සඳහා ණය මුදල් ලබා ගන්නා බොහෝ දෙනා අනාගතයේදී ඉතා බරපතළ ගැටලුවට මුහුණ දෙයි.




## 2.0 නුවණින් යුතුව (ඥානාන්විතව) ණය මුදල් ලබා ගැනීම

මෙතැනදී නුවණින් යුතුව යන්නෙන් ප්‍රධාන කාරණා තුනක් අදහස් වේ. එනම්,

i. **ණය පිළිබඳ දැනුම :** ණය මුදලට අදාළ සියලු කරුණු ගැන දැනුමක් තිබිය යුතුය.

ii. **තමන්ගේත් අනුන්ගේත් පෙර අත්දැකීම් :** තමන්ම හෝ දන්නා හඳුනන වෙනත් අයෙකු හෝ කලින් ලබාගත් ණය හා ඒවාට අදාළ වූ අත්දැකීම් පිළිබඳ දැනුම සහ යන කරුණුයි.

iii. **හොඳින් විමසා බලා ණය ගැනීමේ තීරණයට එළඹියේ ද යන වග :** ණය ගැනීමේ අවශ්‍යතාවය, ගෙවිය යුතු පොලී සහ වෙනත් ගාස්තු ආදිය, එම මුදල ආපසු ගෙවීමට ලැබෙන කාලය, ණය මුදල යොදවන ආකාරය, ණය මුදල ආපසු ගෙවන ආකාරය ආදී කරුණු විමසා බැලිය යුතුය.

එවැනි නිසි සැලකිලිමත් භාවයකින් තොරව අපරීක්ෂාකාරී ලෙස ණය ගැනීමෙන් අනාගතයේදී මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය හැක.

“ණය කියන්නේ දෙපැත්ත කැපෙන ආයුධයක්” යැයි ගැමි කියමනක් තිබෙන්නේ මේ නිසා විය යුතුය.




## 2.1 විවිධ ණය පහසුකම්

අද යමක් ලබාගෙන පසුව එය ගෙවීම ණය යන්නෙහි සාමාන්‍ය තේරුම යි. එවැනි ණය ජීවිතයට පහසුවක් විය හැකි බැවින් අපි ඒවාට ණය පහසුකම් යැයි කියමු. ණය පහසුකම් විවිධාකාර වෙයි.




### i. විධිමත් ණය

විධිමත් ණය ලබා දෙන්නේ විධිමත් මූල්‍ය ආයතන වලිනි. නීත්‍යානුකූල බැංකු, සමුපකාර ණය දෙන ආයතන සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් ආදියයි. විධිමත් ණය පහසුකම් සඳහා ඉතා පැහැදිලි ණය ගිවිසුම්, නිශ්චිත පොලී අනුපාත, ආපසු ගෙවීමේ කාලසටහනක් ආදිය ඇතුළත් වෙයි.

ii. **අවිධිමත් ණය**

විධිමත් නොවන ආයතන සහ පුද්ගලයන්ගෙන් ලබා ගන්නා ණය අවිධිමත් ණය ලෙස දැක්වේ. නෑදෑ හිතවතුන්ගෙන්, මුදල් ණයට දෙන පුද්ගලයන්ගෙන් හෝ ආයතන වලින් සහ වෙළඳසැල් හිමියන්ගෙන් ලබාග න්නා ණය මේ ගණයට අයත්වේ. අවිධිමත් ණය සඳහා ප්‍රවේශය පහසුය. ණය ලබා දීමද ඉක්මනින්ම සිදුවෙයි. එසේ ම ඇතැම් විට ණය ක්‍රියාවලියේ නම්‍යශීලී භාවයක් ද දැකීමට පුළුවන. එහෙත් එවැනි ණය සඳහා දැඩි කොන්දේසි පැවතිය හැකි අතර ඉතා අධික පොලියක් ගෙවීමටද සිදුවේ.




iii. **කෙටිකාලීන හා දිගුකාලීන ණය**

සාමාන්‍යයෙන් වර්ෂයකට වඩා අඩු කාලයකදී ආපසු ගෙවිය යුතු ණය කෙටිකාලීන ණය ලෙස හැඳින්වේ. උදාහරණ: භෝග වගාවන් සඳහා ලබාදෙන ණය අස්වැන්න විකිණීමෙන් පසු ආපසු ගෙවිය යුතුය. දිගුකාලීන ණය ආපසු ගෙවීමට සාමාන්‍යයෙන් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් ලබා දෙනු ලැබේ. උදාහරණ: නිවාස ඉදිකිරීම සඳහා ලබාදෙන ණය ආපසු ගෙවීමට වර්ෂ දහය පහළොව වැනි දීර්ඝ කාලයක් ලැබෙයි.




සාමාන්‍යයෙන් ණය ලබා දෙන්නේ මුදලිනි. එහෙත් භාණ්ඩ හෝ ද්‍රව්‍යය වලින් ලබාදෙන ණය ද පවතී. උදාහරණ: වගා කටයුතු සඳහා අවශ්‍ය වන බීජ පොහොර හා රසායනික ද්‍රව්‍ය වැනි දෑ ණයට සපයයි. සමහර තොග සහ සිල්ලර බඩු වෙළෙඳසැල් පාරිබෝගිකයන්ට භාණ්ඩවලින් ණය සපයා මාසයක් හෝ යම් කාලසීමාවක් අවසානයේදී මුදලින් අය කර ගනී.

ණය සඳහා වන වියදම් වටහා ගැනීමටත් ඒවායේ ඇති අවධානම හඳුනා ගැනීමටත් මෙම විවිධාකාර ණය ගැන දැනුමක් තිබිය යුතුය



# 3.0 ණය මුදල් සඳහා වන වියදම්

කිසිම ණය හිමියෙක් ණය මුදල් නොමිලේ ලබා දෙන්නේ නැත. ණය සඳහා ගාස්තුවක් අය කෙරේ. එහි තේරුම ණය ගන්නා පුද්ගලයාට ඒ සඳහා වියදමක් දැරීමට සිදුවන බවයි. එම වියදම් වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

**ණය සඳහා අයකරන පොලිය විවිධ ගාස්තු වෙනත් අය කිරීම්**




## 3.1 ණය සඳහා අයකරන පොලිය:

පොලිය යනු මුල් මුදලට වඩා වැඩිපුර ගෙවිය යුතු මුදලයි. පොලී අය කරන්නේ සියයට ගණනක් වශයෙනි. එනම් ණය මුදල රුපියල් සියයක් නම් පොලිය රුපියල් අටක්, දහයක්, විස්සක්, තිහක් ආදී වශයෙනි. සාමාන්‍යයෙන් පොලී අය කරන්නේ වාර්ෂික පදනමකිනි. එහෙත් ඇතැම් අවිධිමත් ණය හිමියන් දවසට, සතියට හෝ මාසයට වැනි කෙටි කාලවටද පොලිය ගණන් බලනු ලැබේ.

උදාහරණයක් වශයෙන් වාර්ෂික පොලිය සියයට විස්ස බැගින් රුපියල් තිස් දහසක් ණයට ගත්තේ යැයි සිතමු. වර්ෂයේ අවසානයේදී පොලිය වශයෙන් රුපියල් හය දහසක් ගෙවිය යුතුය. ගෙවිය යුතු මුලු මුදල රුපියල් තිස් හයදහසකි. (30,000+6000)

එම මුදලම පොලිය මාසයකට සියයට විස්සක් බැගින් ගෙවීමට ණයට ගත්තේ නම් මාසය අවසානයේ දී මුළු මුදල රුපියල් තිස් හය දහසක් ගෙවිය යුතුය. (30,000+6000)

දෛනික පොලියට ණය මුදල් ලබා ගන්නා අය ද සිටී. උදාහරණයක් වශයෙන් පාන්දරින් මාළු වෙළඳපොළට යන වෙළෙන්දියක් මාළු මිලට ගැනීම සඳහා දෛනික පොලිය සියයට දහය බැගින් රුපියල් තිස් දහසක් ණයට ගත්තේ යැයි සිතමු. දිනය අවසානයේ දී ඇය රුපියල් තිස්තුන් දහසක් ගෙවිය යුතුය. (30,000+3000)

මාසිකව හා දෛනික පොලි ගෙවීම වාර්ෂික පොලියට වඩා වැඩි බව අවබෝධ කරගත යුතුය. පොලි අයකරන ක්‍රමය අනුව ද ණය ගන්නා අයට වැඩි මුදලක් ගෙවීමට සිදුවන අවස්ථා තිබේ. (හීන වන ශේෂ ක්‍රමය, සමතල ක්‍රමය වැනි පොලී අය කරන ක්‍රම මෙහි උප ග්‍රන්ථයෙහි දක්වා ඇත.)

## 4.0 තුන් පොළකින් ණය ගත් තුන්දෙනාගේ කතාව

එකම ගමේ ජීවත් වූ තුන්දෙනෙක් තුන්පොළකින් ණය අරගෙන ගොවිතැන් කළහ.

විලියම් මාමා ණය ගත්තේ ගමේ මුදලාලිගෙනි. පොතේ ලියාගෙන තිබූ විදියට ඔහු ලබාගත් මුළු ණය මුදල රුපියල් විසි දහසකි. මාමාගේ අතට මුදල් වශයෙන් ලැබුනේ පොඩි ගණනක් වුණත් බිත්තර වී, පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍යය ලැබුණේ ණයට නිසා ඒ ගණන හරි ඇති කියා මාමා සිතයි.

කරුණා නැන්දා ණයගත්තේ ගමේ ගෙවල් ගානෙ ගිහින් ණය බෙදන ආයතනයකිනි. ඒ අය වැඩිපුර ණය දෙන්නෙත් ගැහැණු අයටයි. කරුණා නැන්දාත් රුපියල් විසිදහසක් ම ලබාගෙන තිබුණි. මුදල් ඔක්කොම වියදම් වුනේ ගොවිතැන්වලටයි. හොඳ අස්වැන්නක්ද ලබා ගත්තා.

සංජීව පුතා ගනුදෙනු කරන්නේ නීත්‍යානුකූල බැංකු ආයතනයක් සමඟයි. ඔහු රුපියල් විසි දහසක් ම ලබාගෙන තිබුණා.

අස්වනු විකුණලා ණය තුරුස් එහෙම ගෙවා නිම කළාට පස්සේ දවසක මේ තුන්දෙනා ගමේ පන්සලේදී මුණ ගැහුන.

**සංජීව** : මාමේ මෙදාපාර ගොවිතැන් ටිකක් සාරයි නේද ?

**මාමා** : ගොවිතැන්නං සරු උනා ඒ උනාට.....









**කරුණා නැන්දා** : මාමාට නම් අට දාහක් වත් ඉතුරු වුණා. මටත් අස්වැන්න විකුණල ගත්තු සල්ලි වලින් වැඩි කොටහක්ම ගියේ ණය ගෙවන්න. ලේසියි පහසුයි කියලා කීවට මමත් සියයට අටේ මාසෙ පොලියට රුපියල් විසි දාහක් ම ගත්තා. මාස් පතා ටික ටික ගෙව්වා. ඒ වුනාට පරීක්ෂණ ගාස්තුයි ප්‍රමාද ගාස්තුයි හිඟ පොලියයි එකතු වුණාම ගණන් බලල කිව්වා රුපියල් විසි අට දහසක්ම ගෙවන්න කියලා. මොනව කරන්නද මම ගෙව්වා. මට ඉතුරු වුණේ රුපියල් හය දාහයි මාමේ.


මාමට නම් රුපියල් අටදාහක්වත් ඉතිරි වුණා. මට වෙච්ච දේ සංජය පුතා දන්නවද.....?
නෑ නැන්දෙ ඇයි මොනවා වුණාද..?


ලේසියි පහසුයි කියල කිව්වට මම රුපියල් විසිදහසක් ණයට ගත්තේ ගමේ ණයට සල්ලි බෙදන ආයතනයෙන්. සීයට අටේ පොළියට.
ඉතින් කරුණ නැන්දේ...







**මාමා** : පුතා නම් ණය ගන්නේ ඔය බැංකුවකින් නේද? ඒවායේ ඔච්චර ගණනක් ගෙවන්න වෙන්නෙ නෑ මගේ හිතේ.

**සංජීව** : ඔව් මාමේ රුපියල් විසි දාහට මාස හයට පොලිය හැටියට මගෙන් ගත්තේ රුපියල් එක් දහස් දෙසීයක් පමණයි. වගා ණය වලට බැංකු අය කරන්නේ අඩු පොලියක් නේ.







**කරුණා නැන්දා** : හානේ නිකන් දුන්නා වගේ නෙ




**සංජීව** : ඔව් නැන්දේ අපි ඊළඟ කන්නෙ ඉඳලා බැංකුවෙන්ම ණය ගනිමු. මට පුළුවනි ඔය දෙන්නව බැංකුවට හඳුන්වලා දෙන්ට.

**මාමා** : උඹට පින් සිද්ධ වෙනවා පුතේ.



# 5.0 ගාස්තු සහ වෙනත් අය කිරීම්

ණය දෙන ආයතන සහ පුද්ගලයන් ණය සඳහා අය කරන පොලී ප්‍රතිශතයට අමතරව විවිධ ගාස්තු අයකරන අතර විශේෂ කරුණු සඳහා වෙනත් අය කිරීම් ද සිදුකරයි. උදාහරණ: ලිපි ද්‍රව්‍ය ගාස්තු, ණය ලිපි ලේඛන පිළියෙළ කිරීමේ ගාස්තු, ණය ඇගයීමේ හා ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා අය කිරීම්, එසේම, ලබාගත් ණය නිසි වෙලාවට නොගෙවීමෙන් වෙන ප්‍රමාදයට ප්‍රමාද ගාස්තු, තවදුරටත් ප්‍රමාද වුවහොත් දඩ පොලී ආදී නොයෙකුත් ගාස්තු හා අය කිරීම් සඳහා ණය ලබා ගන්නා තැනැත්තාට අතිරේක මුදලක් ගෙවීමට සිදුවේ. බොහෝ දෙනා දකින්නේ ණය සඳහා අය කරන පොලී ප්‍රතිශතය පමණි. එහෙත් ඉහත දැක්වූ සියලුම ගාස්තු හා අය කිරීම් ණය සඳහා ගෙවිය යුතු වියදමට අඩංගු වෙයි.

# 6.0 ඇප හා සුරැකුම්

ඇප හෝ සුරැකුම් නොමැතිව කිසිම ආයතනයක් ණය මුදල් ලබා දෙනු නොලැබේ. ඉතා කුඩා ණය මුදල් සඳහා පුද්ගල ඇප භාරගත හැකිය. සෙසු ණය සඳහා ඉඩම් දේපොළ රත්තරන් භාණ්ඩ වැනි වටිනා යමක් සුරැකුමක් ලෙස ණය දෙන ආයතනයට උගස්කර පවරා දිය යුතුය. යම් හෙයකින් ලබාගත් ණය මුදල ගෙවීමට අපහසු වුවහොත් උගස්කර ඇති දේපළ විකුණා හෝ ණය මුදල හිලව් කර ගැනීමට ණය දෙන ආයතනයට හෝ පුද්ගලයන්ට අවකාශ ලැබේ.

## පරීක්ෂාකාරී වෙමු



යම් අවශ්‍යතාවයක දී ණය මුදලක් ලබා ගන්නේ නම් හොඳයයි ඔබට සිතෙන්නට පුළුවන. එවැනි අවස්ථාවක දී ණය ගැනීමට පෙර පහත සඳහන් ප්‍රශ්න කීපය ඔබෙන්ම විමසා බලන්න.

i. ඇත්ත වශයෙන්ම මට ණය මුදලක් අවශ්‍යද? (ණය නොවී එම කාර්යය ඉටු කර ගත හැකි වෙනත් මාර්ග තිබිය හැකි බැවිණි.)

ii. මෙම ණය මුදල ලබා ගත්තොත් අනාගතයේදී මට වැඩිපුර ආදායමක් උපයාගැනීමට හැකිවේද? එයින් මගේ ඉතිරිකිරීම් වර්ධනය කර ගැනීමට ලැබෙයි ද?

iii. ණය මුදල නිසා මගේ ඉතිරි කිරීම් වලට කුමක් සිදුවේද? පුරුදු පරිදි දිගටම ඉතිරි කිරීම් කරගෙන යෑමට හැකිවේද? නැතහොත් තිබෙන ඉතිරිකිරීම් පවා මට අහිමිවීමට ඉඩ තිබේද?

iv. ලබා ගන්නා ණය මුදල ආපසු ගෙවීමේ දී අදාළ වන මාසික වාරිකය හා පොලී මුදල් ගෙවීමට මට ප්‍රමාණවත් ආදායමක් තිබේද?

මෙම ප්‍රශ්න වලට ඔබ විසින්ම සපයන අවංක සහ බුද්ධිමත් පිළිතුරු ඔබේ අනාගතය තීරණය කරයි.

**පහත සඳහන් උපදෙස් මාලාව ද බලන්න.**

**I.** **ඔබ ණය මුදලක් ලබාගත යුත්තේ ඔබට අවශ්‍යම නම් පමණි. එසේ නැතිව යම් අයෙකු හෝ ආයතනයක් විසින් මුදල් ලබාදෙන නිසා ණය ගැනීමෙන් වළකින්න. (වර්තමානයේ දී රට පුරාම තරගකාරී ලෙස ණයමුදල් සපයන ආයතන සහ පුද්ගලයින් සිටිති. ණය දීම ඔවුන්ට ආදායම් උපදවන ව්‍යාපාරික කටයුත්තකි. එබැවින් ඔවුන් දෙන නිසා ම ඔබ ගත යුතු නැත.)**

**II.** **ණය දෙන ආයතන සහ පුද්ගලයින් ණය සඳහා අයකරන පොලී ප්‍රතිශතයන් සංසන්දනය කර බලන්න. පොලී ගණනය කරන්නේ දෛනිකව ද සතිපතා ද මාසිකව ද වාර්ෂිකව ද යන්න සොයා බලන්න. පොලී අය කරන්නේ හීන වන ශේෂ ක්‍රමයට ද නැතහොත් සමාන වාරික එන පරිදි සමතල ක්‍රමයට ද යන්න සොයා බලන්න.**

**III.** **ණය ලබා ගැනීමට පෙර එයට අදාළ වන ණය ගිවිසුම කියවා බලන්න. ණය ගිවිසුමේ අඩංගු කොන්දේසි ඔබට බලපාන්නේ කෙසේදැයි සිතා බලන්න. කියවා බලා තේරුම් ගැනීමෙන් පසුව මිස ගිවිසුම් වලට අත්සන් නොතබන්න.**

**IV.** **ණය ලබා ගත්තේ නම්, එකඟ වූ පරිදි ණය වාරික සහ පොලි නිසි වේලාවට ගෙවන්න. තමන් විසින් කරන සියලුම ගෙවීම් වලට අදාළව සටහන් තබා ගන්න. ආයතනයෙන් දෙනු ලබන පාස්පොත වැනි ලේඛනයක ඔවුන්ගේ ද අත්සන් සහිතව වාරික ගෙවීම් සටහන් කර තබාගැනීම වඩාත් සුදුසුය.**

**V.** **ණය යනු වගකීමකි. එය ආපසු ගෙවිය යුතු බැවිණි. එබැවින් ලබා ගන්නා ණය කල්පනාකාරී ලෙස පාවිච්චි කරන්න . ඔබගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීම, ආදායම වැඩි කර ගැනීම වැනි ඵලදායක කාර්යයන් සඳහා පමණක් ණය මුදල යොදවන්න.**

# 7.0 අපරීක්ෂාකාරී ලෙස ණය ගැනීම භයානක වන්නේ ඇයි?

නිසි සැලසුමක් නැතුව ණය ගැනීම යනු අපරීක්ෂාකාරී ලෙස ණය ගැනීමකි. එයින් උද්ගත විය හැකි ගැටලු කිහිපයක් පහතින් දක්වමු.

i. **ණය උගුලකට හසුවීම :** මෙය සිදුවන්නේ බොහෝ විට අපරීක්ෂාකාරී ලෙස ගන්නා ණය නිසි වේලාවට ආපසු ගෙවීමට නොහැකිවීමෙනි. ණය ආපසු ගෙවන ලෙස ණය හිමියන් විසින් කරනු ලබන බලපෑම හේතුවෙන් දැඩි පීඩනයකට හසුවන ණයගැතියා එවැනි අවස්ථාවලදී වෙනත් මූලාශ්‍රයකින් ණය ලබාගෙන ණය ගෙවීමට පෙළඹෙයි. එක ණය මුදලක් නිසි ලෙස ගෙවීමට නොහැකි පුද්ගලයකුට ණය දෙකක් ගෙවීම කොහොමටත් කළ නොහැකි දෙයකි. යමෙක් පරණ ණය මුදල ගෙවීමට අලුත් ණය මුදලක් ලබා ගන්නේ නම් ඔහු ණය උගුලක පැටලී ඇති බවට එය කදිම සාක්ෂියකි.

ii. **ආතතිය සහ පවුල් ආරවුල් :** ගෙවා ගත නොහැකිව හිඟ හිටුවා ඇති ණය මුදල නිසා ණයගැතියා දැඩි මානසික පීඩනයකට ගොදුරු වෙයි. පොලී දඩ, පොලී, ප්‍රමාද ගාස්තු ආදිය එකතු වීමෙන් දිනෙන් දින වැඩි වන ණය මුදල ගැන සිතන විට ඔහුගේ ආතතියත් වර්ධනය වේ. ණයහිමියාගෙන් එල්ල වන පීඩනයත් ණය මුදල වෙනුවෙන් සුරැකුම් ලෙස තබා ඇති දේපොළ අහිමි වීමේ අවදානමත් මේ තත්ත්වය උග්‍ර කිරීමට හේතුවේ. එවන් වාතාවරණයකදී ණය ගැතියා තම පවුලේ සාමාජිකයින් සමඟ පවා ගැටුම් ඇතිකර ගනී. ඇතැම් විට පුරුෂයාට නොදන්වා භාර්යාව විසිනුත් භාර්යාවට නොදන්වා පුරුෂයා විසිනුත් ණය ලබා ගන්නා බව වාර්තා වී තිබේ. එවැනි ණය මුදලක් ගෙවා ගැනීමට නොහැකි වන විට පවුල් ආරවුල් ඇතිවීම පුදුමයක් නොවේ.



iii. දේපොළ හානි: ණය මුදල ගෙවා ගැනීමට නොහැකි වන විට ණය දුන් ආයතනය සුරැකුම් වශයෙන් තබා ඇති දේපොළ විකුණා හෝ ණය මුදල අයකර ගැනීමට ඉඩ තිබේ. එවන් අවස්ථාවල දී ණයගැතියා මහත් අසීරුතාවයන්ට මුහුණ දෙන අතර, ණය ගැනීමට පෙර තමන්ට අයත්ව තිබූ ගේ දොර ඉඩකඩම් පවා ඔහුට අහිමි වීමට ඉඩ තිබේ. එවන් අවස්ථාවකදී ඔහුට පිහිට වීමට කිසිවෙකු නැත. එය තමන් අතින්ම තම වළ කපා ගත්තා වැනි දෙයකි.

iv. ප්‍රතිරූපයට හානි වීම: යම් අයෙකු ගත් ණය නොගෙවා පැහැර හැර ඇති බව සමාජය තුළ ප්‍රචාරය වූ විට ඔහුගේ ඇයගේ කීර්ති නාමයට, පවුලේ නම්බුවට සමාජ පිළිගැනීමට හානි සිදුවේ.

v. පුද්ගලයාගේ ණය සුදුසුකම පිරිහී යෑම: පුද්ගලයෙකු සතු ණය සුදුසුකම නැතිව ගියහොත් අනාගතයේ දී වෙනත් කිසිවෙකු සමඟ හෝ මුදල් ගනුදෙනුවක් කර ගැනීම අසීරුවේ.

### ණය උගුල

*ණය මුදලක් ලබා ගනියි.*
*ණය වාරික ගෙවීමට දැඩි පරිශ්‍රමයක් දරයි.*
*ආපසු ගෙවීම් අතපසුවේ.*
*වෙනත් තැනකින් අලුත් ණය මුදලක් ලබා ගනී.*
*පැරණි ණය මුදලට එකතුවූ පොලිය පමණක් ගෙවයි.*
*දැන් ණය මුදල් දෙකකි.*
*පොලි එකතුවීම නිසා*
*දිනෙන් දින ණය මුදල් වර්ධනය වේ..*
*තවත් තැනකින් ණය ගැනීමට පෙළඹේ.*
*වැඩි වැඩියෙන් ණය ගනී.*
*එහෙත් එකදු ණය මුදලක් හෝ*
*සම්පූර්ණයෙන් ගෙවා නිම කර ගැනීමට දුෂ්කර වේ.*
*තමන් ණය උගුලක සිරවී සිටින බව අවබෝධ වන විට*
*සියල්ල සිදුවී හමාරය.*

| පැරණි කියමන් |
|---|
| ඉස්සර බොහෝ සිල්ලර බඩු වෙළඳසැල්වල කැශියර් මේසයට ඉහලින් බිත්තියේ විශේෂ වගන්තියක් ලියා තිබුණි. |
| “ණය දීමෙන් මුදලත් මිතුරත් යන දෙකම නැතිවේ”. |
| මුදල් උපයන දේවලට මිස කෑමට බීමට ණය ගැනීමෙන් ආපසු ගෙවීමට අපහසුවන බව වෙළඳසැල් හිමියෝ දැන සිටියහ. |
| ණය යනු දෙපැත්ත කැපෙන ආයුධයක් යැයි පැරණ්නන් විශ්වාස කලේ හේතු ඇතුවය. |
| ණය මුදල් ප්‍රයෝජනවත් ලෙස යොදවා දියුණුවට පත් අය එදත් සිටියහ. අදත් සිටිති. අනෙක් අතට, ණය මුදල් වගකීමෙන් තොරව වියදම් කර තමන්ට පරම්පරාවෙන් ලැබී තිබුණු ගේදොර ඉඩකඩම් පවා අහිමි කරගත් අයද බොහෝය. |

# හොඳ ණය සහ නරක ණය

| ඥානාන්විත ලෙස ලබාගත් ණය (හොඳ ණය) | අපරීක්ෂාකාරී ලෙස ලබාගත් ණය (නරක ණය) |
|---|---|
| ආදායම් උපයන මාර්ගය වැඩිදියුණු කර ගැනීමට, අධ්‍යාපනයට, සෞඛ්‍යයට, පවුලේ සුභ සිද්ධියට යොදවයි. | සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීමට, ප්‍රිය සාදවලට, (වර්තමාන බොහෝ විවාහ මංගලෝත්සව වැනි) තමන්ට ඉහළ ජීවන තත්ත්වයක් ඇති බව සමාජයේ අනිත් අයට පෙන්වීමට ණය මුදල් යොදවයි. |
| ණය මුදල තමන්ට දරා ගත හැකි ප්‍රමාණයකි. එබැවින් එය නිසි කලට ආපසු ගෙවිය හැක. | ණය මුදල, එය ලබාගන්නා පුද්ගලයාගේ ආපසු ගෙවීමේ හැකියාවට වඩා වැඩි ප්‍රමාණයකි. එබැවින් නිසිකලට වාරික මුදල් ගෙවීමට අපහසු වෙයි. |
| ණය ලබාගන්නේ විධිමත් නීත්‍යානුකූල මූල්‍ය ආයතන වලිනි. එසේම එම ණය සාපේක්ෂකව අඩු පොලී ප්‍රතිශතයකට ලබා ගනී.<br><br>ආපසු ගෙවීම් සැලැස්මකට සහ කාල සටහනකට අනුව විධිමත් ලෙස වාර්තාගත වෙයි. | ණය ලබා ගන්නේ අධික පොලී මුදල් අය කරන මුදල් ණයට දෙන්නන්ගෙනි. එම ණය දෙන ආයතන හෝ පුද්ගලයා විධිමත් පිළිවෙත් අනුගමනය කිරීමට බැඳී නැත. එබැවින් බැරෑරුම් කොන්දේසි, අධික පොලී සහ විවිධ ගාස්තු යටතේ ලබා ගැනීමට සිදුවේ. ණය ලබාගන්නා පුද්ගලයා ආපසු ගෙවීමේ දී මහත් අසීරුතාවයන්ට මුහුණ දෙයි.<br><br>ආපසු ගෙවීමේ සැලසුම් විධිමත් නැත. අධික පොලී සහ ගාස්තු ආදිය නිසා ආපසු ගෙවීම ප්‍රමාද වේ. නැතහොත් ගෙවීමට නොහැකි වේ. |
| ආදායම් උපයන මාර්ග වැඩි දියුණු වන බැවින්, ආදායම් වැඩි වේ. | අලුතින් ආදායම් උපයන මාර්ග වර්ධනය වීමක් සිදුවන්නේ නැත. පෙර සිටම තිබුණු ආදායම් ඉපයීමේ මාර්ග වලටද අවහිරතා ඇතිවීමට පුළුවන. |
| ආදායම් වැඩිවන බැවින් ඉතිරි කිරීම් ද වර්ධනය වේ. මූල්‍යය ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමට හැකිවේ. | නරක ණය නිසා ඉතිරිකිරීම් වර්ධනය කිරීමට නොහැකිවෙයි. මූල්‍යය ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම දුෂ්කර වේ. |

"ඔබට ඒවා ලැබීමට පෙර කිසිවිටෙකත් ඔබේ මුදල් වියදම් නොකරන්න."

## 8.0 සාරාංශය (ස්වර්ණමය රීතිය)

ඥානාන්විතව පාවිච්චි කරන්නේ නම්, ණය වූ කලී ඉතාමත්ම ප්‍රයෝජනවත් මූල්‍ය උපකරණයකි. ණය මුදල්වලින් අපට අපේ ගොවිතැන්, වෙළහෙළඳාම්, කර්මාන්ත හා ව්‍යාපාර ආදිය වැඩි දියුණු කර ගැනීමට පුළුවන. ජීවිතයේ වැදගත් අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ද, අපගේ වත්කම් වැඩි කර ගැනීමටද ණය මුදල් අපට ප්‍රයෝජනවත් වෙයි.

එසේ වුවද, අපරීක්ෂාකාරි ලෙස ණය මුදල් භාවිතා කළහොත් අපට උරුම වන්නේ ආතතිය, අධික දේපල හානි හෝ පාඩු සහ බොහෝ කාලයක් තිස්සේ මුහුණ දීමට සිදු වන ගැටලු රාශියකි.

මේ අනුව ණය මුදල් පිළිබඳ ස්වර්ණමය රීතිය ඉතා පැහැදිලිය.

"ඔබට ආපසු ගෙවිය හැකි ප්‍රමාණයට පමණක් ණය මුදල් ලබා ගන්න. එසේ ලබාගත් ණයෙහි වාරික සහ පොලිය නියමිත කාලයට ආපසු ගෙවන්න.

ගන්නා ණය ඔබගේ අනාගත සුබසිද්ධියට හේතු වන කටයුතු සඳහා පමණක් යොදවන්න."

ඥානාන්විත ලෙස ණය මුදල් ලබා ගැනීම
(නුවණ ඇති අය ණයගන්නේ මෙහෙමයි.!)

අවශ්‍යතාවයක් හට ගනී.

ණය මුදලක් ලබා නොගෙන
අවශ්‍යතාව ඉටු කර ගැනීමට හැකි
විකල්ප මාර්ග තිබේදැයි සොයාබලයි.

ඒ අනුව ලබාගත යුතු ණය මුදල් තීරණය කරයි.
ණය ආපසු ගෙවීමේ සැලසුම සකස් කරයි.

හොඳම ණය දෙන ආයතනය තෝරා ගනී.
ලබාගත් ණය ප්‍රවේශම්කාරි ලෙස
ණය ලබාගත් කාර්ය සඳහාම යොදවයි.
නිසි වෙලාවට ණය ආපසු ගෙවීම සිදු කරයි.

# සටහන්

# 7
# මුදල් ආරක්ෂා කර ගැනීම

## 1.0 මුදල් වල ආරක්ෂාව

මුදල් උපයා ගැනීම සහ වියදම් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒවා ආරක්ෂා කරගැනීමද ඔබගේ වගකීමකි. බොහෝ කාලයක් තිස්සේ උපයාගන්නා ලද මුදල් වුවද, නිසි ආරකෂාවක් තිබුනේ නැත්නම් එක මොහොතකින් ඒවා ඔබට අහිමි වීමට ඉඩ තිබේ. මෙතැනදී ආරක්ෂාව යන්නට කාරණා ගණනාවක් අඩංගු වෙයි. එනම් සොරකම්, වංචාවන් සිදුවීම්, හදිසි ආපදාවන් පමණක් නොව සමහර විට ඔබගේම අපරීක්ෂාකාරී තීරණයක් හෝ ක්‍රියාවක් නිසා ක්ෂණයකින් ඔබ ගේ මුදල් ඔබට අහිමි වීමට ඉඩ තිබේ.

උත්සාහවන්ත තරුණ ගොවි මහත්මයෙකු වූ සුනිල් කුඩා යතුරුපැදියක් මිලයට ගැනීම සඳහා කාලයක් තිස්සේ මුදල් රැස්කළේය. ඔහු එම මුදල් නිවසින් පිටතට රැගෙන ගිය අවස්ථාවක කිසිවකු විසින් ඒවා සොරකම් කරන ලදී . ඔහුගේ සියළු මුදල් එක රැ යකින් ඔහුට අහිමි විය. ලොකු මුදලක් අනාරක්ෂිතව පිටතට රැගෙන යෑම ඔහුගේ තීරණයකි. එසේම බැංකු පොතක මුදල් ඉතිරි නොකර නිවසේම තබා ගැනීමද ඔහුගෙ ්ම තීරණයකි. එවැනි වේදනාකාරී අහිමිවීම් වලක්වා ගැනීමට නිසි විදි විධාන යොදා ගැනීම ආරක්ෂාව යන්නේ අදහස් වේ.

## 2.0 මුදල් අහිමිවන අවස්ථා

i. **සොරකම:**
මෙහිදී අදහස් කරන්නේ කාසි හා නෝට්ටු සහ ස්වර්ණාභරණ වැනි වටිනා දේ සොරාගනු ලැබීමෙන් සිදුවන අහිමිවීමයි. සුනිල් ට සිදුවූයේ අහිමිවීමකි.

ii. **මූල්‍ය වංචා (මුදල් මගඩි)**
ඇතැම් පුද්ගලයන් ඔබගේ මුදල් වංචාකාරී ලෙස ඔවුන් වෙත ඇදගැනීම සඳහා නොයෙකුත් උපාය මාර්ග අනුගමනය කරයි. ඔබේ මුදල් වැඩි කර ගැනීමට ව්‍යාජ ආයෝජන යෝජනා ඉදිරිපත් කරයි. එවැනි උගුලකට හසු වුවහොත් ඔබේ මුදල් ක්ෂණයකින්ම අහිමි වීමට ඉඩ තිබේ. පහත දැක්වෙන ඉන්දියානු ජනකතාව බලන්න.

එක්තරා ගමකට පිටස්තර ප්‍රදේශයකින් ඉතා ධනවත් පෙනුමක් ඇති තරුණයින් දෙපළක් පැමිණියහ. ඔවුන් වටිනා භාණ්ඩ මිලදී ගනිමින්, මිල අධික ආහාර පාන සඳහා මුදල් වියදම් කරමින් ප්‍රීති වූහ. එම අසාමාන්‍ය වියදම් ගැන පුදුමයට පත් ගැමියෝ ඔවුන් මුදල් උපයා ගන්නේ කෙසේදැයි විමසූහ. තම මුදල් ටික දිනකින්ම දෙගුණයක් කර ගැනීමේ ක්‍රමයක් තමන් සතු බව තරුණයින් ප්‍රකාශ කළහ. තරුණයන්ගේ ආකර්ෂණීය වචන වලට රැවටුනු ගැමියන් ද ඔවුන් සතු මුදල් දෙගුණ කර දෙන ලෙස ඉල්ලා සිටියහ. ටික දිනකින් මුදල් දෙගුණ කර

දෙන බවට පොරොන්දු වෙමින් ගමේ සියලු දෙනාගේම මුදල් එක් රැස්කර ගත් තරුණයින් දෙදෙනා එක රැයකින්ම අතුරුදන් වූහ. ඔවුන් යළි කිසි දිනෙක එම ගමට පැමිණියේ නැත.

මෙවැනි මුදල් මගඩිකරුවන් වර්තමානයේ ද සිටිති.

මූල්‍ය වංචා සහ මුදල් මගඩි ගැන සෝදිසියෙන් සිටින්න. ඉක්මනින් මුදල් ලැබෙන ක්‍රම හෝ විශ්වාස කළ නොහැකි අසාමාන්‍යය ලාභ උපයන ව්‍යාපාර ආදිය ගැන පිටස්තර පුද්ගලයින් විසින් ඔබට මවා පාන සුරංගනා කතාවලට නොරැවටෙන්න. ඉතා ඉක්මනින් මුදල් වැඩි කරගත හැකි ව්‍යාපාර හෝ ආයෝජන නැත. මුදල් උපයාගත හැක්කේ වෙහෙස මහන්සි වීමෙන් පමණි.

iii. **හදිසි ආපදා අවස්ථා:** අනපේක්ෂිත කරදරවලට මුහුණ දීමේදී ඔබේ මුදල් ඉක්මනින්ම වියදම් විය හැක. එබැවින් හදිසි ආපදා අවස්ථාවකට මුහුණ දීම සඳහා ඔබ කල් තියා සූදානමින් සිටිය යුතුය. ඒ සඳහා හදිසි අවස්ථා අරමුදලක් ගොඩනගාගන්න. එම මුදල් සුරක්ෂිත ලෙස තබාගත යුතුය. වර්තමානයේ දී සිදුවන ස්වාභාවික ව්‍යසන ආදිය සැලකිල්ලට ගැනීමේ දී අවම වශයෙන් මාස තුනක් ජීවත් වීමට ප්‍රමාණවත් මුදලක් හදිසි අවස්ථා අරමුදලෙහි තිබිය යුතුය. අධික පොලියට පිටතින් ණය ලබා නොගෙන අවස්ථාවට මුහුණ දීමට එමගින් ඔබට හැකිවනු ඇත.

iv. **අපරීක්ෂාකාරී ලෙස ණය දීම**: ඔබ යම් අයෙකුට (ඥාති මිත්‍රාදීන්ට පවා) ණය මුදලක් දෙන්නේනම් ඒ පිළිබඳව විස්තර වාර්තාවක් තබාගන්න. එසේ නොමැති වූ විට ණයගැතියාගෙන් ආපසු ලබා ගැනීමේ දී දුෂ්කරතා ඇතිවිය හැක. අපරීක්ෂාකාරී ණය ගනුදෙනු වලදී ඔබේ මුදල් ඔබට අහිමි වීමට පවා ඉඩ තිබේ.

මුදල් හරි හම්බ කර ගැනීමට ඔබ ගත් වෙහෙසකර උත්සාහයන් අපතේ නොගිය බව ඔබට දැනෙන්නේ එම මුදල් ආරක්ෂාකාරී ලෙස තිබෙන බව දකින විටය.

*"සුළු වියදම් ගැන පරීක්ෂාකාරීවන්න;*
*කුඩා ජල කාන්දුවකට*
*මහා නැවක් ගිල්විය හැක"*

**- බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් -**
**ඇමරිකාවේ සිටි ජනාධිපතිවරයෙක්**

# 8
# අනාගතයට සැලසුම්

## 1.0 අනාගතයට සැලසුම්

ඉදිරි වර්ෂ වලදී කුමන ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවේදැයි අපි නොදනිමු. එසේ වුවද යම් යම් වෙනස්කම් වලට මුහුණ දීමට සිදුවන බව දනිමු. අනාගතයට සැලසුමක් අවශ්‍ය වන්නේ ඒ නිසාය. විශේෂයෙන්ම මහළු වයසට පත් වූ කල පහසුවෙන් ජීවත්වීමට සුදුසු වැඩපිළිවෙලක් අපට තිබිය යුතුය. සැලසුමක් තිබේ නම්, අනුන්ට බරක් නොවී සැහැල්ලුවෙන් ජීවත්වීමට අපට පුළුවන. එසේම දරු මුණුබුරන් ආදී අපේ උරුමකරුවන්ටද වටිනා යමක් ඉතිරි කර තැබීමටද අපට හැකියාව ලැබේ.




මහළු විය අප කාටත් පොදු අවස්ථාවකි.

පෙරදීමෙන් මුදල් උපයා ගැනීමට නොහැකි වෛද්‍ය වියදම්, එදිනෙදා වියදම් ආදී මුදල් වැය කිරීමට සිදුවන කාරණා බොහෝය. එබැවින් විශ්‍රාම ජීවිතයට ගැලපෙන මූල්‍ය සැලැස්මක් කල්තියාම සකස් කරගෙන තිබීම ප්‍රයෝජනවත්ය.

ඒ සඳහා කළ හැකි දේ මොනවාද?

i. මුදල් උපයන විටම ඉතිරි කරන්න. ආරම්භයේදී මේ සඳහා බැංකුවක සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක් සුදුසුවේ. සුළු ප්‍රමාණයකින් වුවද ඉතිරි කිරීම ප්‍රයෝජනවත්ය. නිතිපතා ගිණුමෙහි මුදල් ඉතිරි කිරීමෙන් එය ඔබට පුරුද්දක් බවට පත්වේ. ඉතිරිකිරීමේ පුරුද්ද ඇති වූ විට ඔබට මහත් උද්යෝගයකින් යුතුව මුදල් ඉතිරිකිරීමට පුළුවන. එසේ ගිණුමෙහි එකතුවන මුදල් පසු කාලයකදී ඔබට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට පුළුවන.

ii. පසු කලෙකදී වැඩි වැඩියෙන් මුදල් උත්පාදනය කිරීමේ හැකියාව ඇති ඉඩම් ගොඩනැගිලි ආදී දේපොළ වත්කම් අත්පත් කරගන්න.

iii. ස්ථාවර තැන්පත් ගිණුම්වල මුදල් සහ පොලිය වර්ධනය වීමට ඉඩ හරින්න. ඔබ ආදායම් උපයන කාලයේදී ඔබේ ස්ථාවර ගිණුම්වල තිබෙන මුදල් හෝ ඒවාට එකතු වී ඇති පොලී මුදල් ආපසු ගැනීමෙන් වළකින්න. එසේ කිරීමෙන් පොලියටත් පොලිය හැදෙන (සංයුක්ත පොලී) වැල් පොලී ක්‍රමයේ මහිමයෙන් ඔබේ මුදල් දෙගුණ තෙගුණ කර ගැනීමට ඔබට පුළුවන. විශ්‍රාම ගත් පසු ස්ථාවර ගිණුම්වල පොලිය මාසිකව ලබා ගන්න. එය ඔබේ විශ්‍රාම වැටුපයි !

## 2.0 කතාන්දර අංක 04

### 2.1 පීටර් මහතාගේ කතාව

ගොවිතැනින් සහ කිරි ගව පාලනයෙන් ආදායම් උපයාගත් පීටර් මහතා අවුරුදු විස්සකට අධික කාලයක් තිස්සේ එක දිගටම බැංකු ගිණුම්වල මුදල් ඉතිරි කළ අයෙකි. ඔහු ගේ දොර ඉඩකඩම් වැඩි දියුණු කරගත්තේය. වැඩි වැඩියෙන් ආදායම් උපයා ගැනීමට ද ඔහුට හැකි විය. බැංකුවේ කළමනාකරු ද ඔහු ඉතා හොඳින් දන්නා හඳුනන අයෙකි. ඔහු පීටර්ගේ "මූල්‍ය උපදේශකයා" විය. පසු කලෙක ඉතිරි කිරීමේ ගිණුම්වල එකතු වී තිබුණු මුදල් සියල්ල ඒකරාශී කොට පීටර් රුපියල් ලක්ෂ දොළහක ස්ථාවර තැන්පත් ගිණුමක් ආරම්භ කළේය. "මේ තැන්පතුව පීටර් මහත්මයාගේ පෙන්ෂන් එකට කියලා හිතාගන්න" කියා බැංකු කලමනාකරු පීටර් මහතාට උපදෙස් දුන්නේය.




වසරෙන් වසර තමන්ගේ තැන්පත් මුදල වර්ධනය වන ආකාරය දුටු පීටර් ඉමහත් සතුටට පත් විය. ඔහු කිසිවිටෙකත් තැන්පත් මුදල හෝ එකතු වූ පොලිය ආපසු ලබාගත්තේ නැත. ඒ හේතුවෙන් කාලයත් සමඟ වැල් පොලී ක්‍රමයේ මහිමයෙන් පීටර්ගේ මුල් තැන්පත් මුදල දෙතුන් ගුණයකින් වර්ධනය විය.

තැන්පත් මුදලේ පසු උරුම කරු ලෙස තමන්ගේ එකම පුතු බැංකුවට නම්කර ඇති පීටර් දැන් විවේක සුවයෙන් සිය විශ්‍රාම ජීවිතය ගතකරයි. ඔහුගේ වියදම් වලට ප්‍රමාණවත් පොලී ආදායමක් ඔහුට ලැබෙයි. එය ඇත්ත වශයෙන්ම ඔහුට විශ්‍රාම වැටුපක් හා සමානය. "මම හොඳට හරිහම්බ කරපු මිනිහෙක්. ඒ උනාට මාව ලක්ෂපතියෙක් කළේ බැංකුවේ මහත්තයා" පීටර් ඉමහත් සතුටින් තම අතීතය ආවර්ජනා කරයි.

## 3.0 මූල්‍යය ඉලක්ක තීරණය කිරීම

එක් එක් අයගේ ආදායම් සහ වියදම් විවිධාකාරය. එහෙත් මූලික අවශ්‍යතාවයන් බොහෝ දෙනාට පොදු ය. ඒ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට නම් යම් අරමුණකට ඉලක්කයකට වැඩ කළ යුතුවේ. අරමුණක් නැති ජීවිතය මං මුලාවීමක් වැනිය. එපමණක් නොව එය ඛේදාන්තයක් වීමටද ඉඩ තිබේ. ඕනෑම පුද්ගලයෙකුට ජීවිත අරමුණු මුදුන් පමුණුවා ගැනීමට මුදල් අත්‍යවශ්‍යය වේ. එබැවින් අපේ ජීවිත අරමුණු හා බැඳුණු මූල්‍යය ඉලක්ක තිබිය යුතුය. මූල්‍යය ඉලක්ක නොමැති විට සුළු සුළු වටිනාකමක් නැති දේ වලට මුදල් වියදම් වෙයි. මූල්‍ය ඉලක්ක අප යා යුතු දිසාව පෙන්වනවා පමණක් නොව මූල්‍ය විනයක් ද ඇතිකරයි.

මූල්‍ය ඉලක්ක කෙටිකාලීන, මැදි කාලීන හා දිගුකාලීන වශයෙන් ත්‍රිවිධාකාර වේ.

**කෙටිකාලීන මූල්‍ය ඉලක්ක:** යම් යම් ගොවි උපකරණ මිලදී ගැනීම, ණය මුදලක් ගෙවා නිම කිරීම වැනි ඉක්මනින් කළ යුතු දේ.

**මැදිකාලීන මූල්‍ය ඉලක්ක:** ගොවිපළ වැඩිදියුණු කර ගැනීම, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම, අමතර ආදායම් උපදවන කටයුත්තක් ආරම්භ කිරීම වැනි දේ.

**දිගුකාලීන මූල්‍ය ඉලක්ක:** ඉඩමක් මිලට ගැනීම, නිවසක් ඉදිකර ගැනීම සහ විශ්‍රාම ජීවිතයට සූදානම් වීම වැනි දේ

## 4.0 මූල්‍ය ඉලක්ක සපුරා ගන්නේ කෙසේ ද?

**I. ඔබේ මූල්‍ය ඉලක්කය ඉතා පැහැදිලි ලෙස ලියා සටහන් කර තබා ගන්න.**

**II. ඒ සඳහා කොපමණ මුදලක් වැය වේදැයි ඇස්තමේන්තු කරන්න.**

**III. මුදල් ඉතිරි කිරීම සහ ආයෝජනය මගින් පියවරෙන් පියවර ඉලක්කය කරා ඉදිරියට යන්න. (මෙහිදී මැදි කාලීන සහ දිගු කාලීන ඉලක්ක දිනා ගැනීම සඳහා බැංකු ණය පහසුකම් ලබා ගැනීමටද පුළුවන)**

මුදල් නාස්ති කරනවා වෙනුවට මුදල් ඥානාන්විතව වියදම් කිරීමට මූල්‍ය ඉලක්ක පුද්ගලයාට උපකාර වෙයි.

# ඔබේ වත්කම් ඊළඟ පරම්පරාවටත්......

යමෙක් වෙහෙස මහන්සියෙන් කොපමණ ධනයක් වත්කමක් රැස්කර ගත්තත් දරුමුණුබුරන්ට ඒවා බෙදා දෙන නිසි ක්‍රමවේදයක් අනුගමනය කළේ නැත්නම් ඒ ධනය නාස්ති වීමට පුළුවන. එසේත් නැත්නම් දරුවන් හෝ ඥාතීන් අතර ආරවුල් ඇති කිරීමටද එය හේතුවිය හැක.

ඔබ සතු ඉඩම්, රන් භාණ්ඩ, බැංකු ගිණුම්වල ඇති මුදල් සහ වෙනත් වටිනා දේපොළ පිළිබඳ වාර්තාවක් සකස් කරන්න. (ඔබෙන් පසුව ඒවා උරුම විය යුත්තේ කාටදැයි ඔබම තීරණය කරන්න.)




වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ වටිනාකම දරුවන්ට ද කියාදෙන්න. ඥානාන්විත ලෙස මුදල් වැය කරන අන්දම ඔවුන්ට ද පුරුදු කරවන්න. ඔබේ ජීවිත භුක්තියට යටත්ව ඉඩම් දේපොළ ඔප්පු වලින්ම දරුවන් අතර බෙදා හරින්න. බැංකු ගිණුම්වල ඇති මුදල් සඳහා උරුමකරුවන් නම් කරන්න.

මූල්‍ය ස්වාධීනත්වයක් ඇතිව අභිමානවත් ලෙස ජීවත්වීමට ලැබීම මහලු වියේ දී කෙනෙකුට ලැබෙන වාසනාවකි.

ඔබත් එවැනි වාසනාවන්තයකු වන්න !

# සටහන්

# 9
# මූල්‍ය විනය සහ නිරවුල් මානසිකත්වය

## 1.0 මූල්‍ය විනය සහ නිරවුල් මානසිකත්වය

මුදල් කළමනාකරණය කර ගැනීම යනු හුදු මුදල් උපයා ගැනීම පමණක්ම නොවේ. දැනටමත් තමන් සතු මුදල් බුද්ධිමත් ලෙස හසුරුවා ගැනීමද එයින් අදහස් කෙරේ. යහපත් ලෙස මුදල් කළමනාකරණය කරගැනීමට සෑම පුද්ගලයකුටම මූල්‍ය විනය තිබිය යුතුය. එසේම ඒ සඳහා නිරවුල් මානසිකත්වයක් ද තිබිය යුතුය.




## 2.0 මූල්‍ය විනය යනු කුමක්ද?

මුදල් වලට ඔබව පාලනය කිරීමට නොදී ඔබ විසින් මුදල් පාලනය කිරීම මූල්‍යවිනය යන්නෙන් අදහස් වේ. එය මුදල් වියදම් කිරීම හා සම්බන්ධ හොඳ පුරුදු ඇතිකර ගැනීමකි. එසේම අපරීක්ෂාකාරී වියදම් මගහැරීමට දක්ෂ වීමත් මූල්‍යය විනය යන්නෙන් අදහස් වේ. මූල්‍ය විනය පෙන්නුම් කරන යහපත් පිළිවෙත් කිහිපයක් පහත දැක්වේ.

i. ඔබේ ආදායම් සීමාව තුළ වියදම් කරන්න. මෙයින් අදහස් වන්නේ ඔබේ ආදායමට ඔරොත්තු නොදෙන මිල අධික භාණ්ඩ හා සේවා මිලදී ගැනීමෙන් වැළකීමයි.

ii. නිතිපතා මුදල් ඉතිරි කරන්න. කුඩා මුදලක් වුවද මාසිකව නිතිපතා බැංකු ගිණුමක මුදල් ඉතිරි කරන්න. ආදායමෙන් කොටසක් පුරුද්දක් වශයෙන් ඉතිරිකිරීම මෙයින් අදහස් වෙයි.

iii. අනවශ්‍ය ණය ගැනීමෙන් වැළකීම. අත්‍යවශ්‍යම කාරණයකට හෝ ආදායම් ඉපයීමට හැකි ආයෝජනයකට හැර සුඛෝපභෝගී ජීවිතය සඳහා මුදල් ණයට ගැනීමෙන් වලකින්න.

iv. සැලසුමක් තුළ ගනුදෙනු කරන්න. සැම විටම අයවැයක් යටතේ වියදම් කරන්න. ආවේගශීලීව වියදම් කිරීමට ඉක්මන් වන්න එපා.

කොටින්ම ඔබගේම "අනාගත සුබ සිද්ධිය" උදෙසා වර්තමානයේ දී ඔබට "ඇතැම් දේවල්" ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් තිබේ නම් මූල්‍ය විනය යනු එයයි. ඒ හැකියාව ඇති වන්නේ ඔබ මුදල් ගැන සිතන ආකාරය අනුවයි. එනම් ඔබගේ මූල්‍ය විනයේ පදනම ඔබගේම මානසික ස්වභාවය බවයි.

## 3.0 නිරවුල් මානසිකත්වය

ඔබේ මානසිකත්වය, අදහස් හා ආකල්ප ඔබේ මුදල් භාවිතයට සෘජුවම බලපෑම් කරයි. මුදල් භාවිතයේදී යහපත් මානසික මට්ටම් තුනක් ගැන අවධානය යොමු වී තිබේ.

I. **ධනාත්මක මානසිකත්වය :** ජීවිතයේ ගුණාත්මක භාවය වැඩිකර ගැනීමටත් සුරක්ෂිත භාවයටත් මුදල් උපයෝගී වන බව දැඩිව විශ්වාස කරයි.

II. **දුරදර්ශී මානසිකත්වය :** වර්තමානයේ අත්‍යවශ්‍යය නොවන උවමනාකම් ඉටු කරගන්නවාට වඩා දුර බලමින් අධ්‍යාපනය, සෞඛ්‍යය, හදිසි ආපදා සහ විශ්‍රාම ජීවිතය වැනි කාරණාවලට ප්‍රමුඛත්වයක් දෙයි.

III. **වගකීම් සහිත මානසිකත්වය :** තමන් විසින් ගන්නා සෑම මූල්‍ය තීරණයක්ම තමන්ගේ මුළු පවුලටම බලපාන බව තේරුම් ගනියි.

පුද්ගලයෙකු තුළ ආත්ම විශ්වාසය, ඉවසීම, සහ ඥානාන්විතව යම් යම් දේ තෝරා ගැනීම ට ඇති දක්ෂතාවය වැනි ගුණාංග වර්ධනය වීමට නිරවුල් මානසිකත්වය උපකාර වෙයි .

## පහත සඳහන් උදාහරණය බලන්න.

ගමක දක්ෂ ගොවි මහතුන් දෙපලක් ජීවත් වුහ. දෙදෙනාම ගොවිතැන්වලින් ඉහල අස්වනු ලබාගන්නා ලදී. හොඳ ආදායමක් ලැබුවද දෙදෙනාගේ මුදල් පරිහරණය පිළිබඳ ආකල්ප වෙනස්ය.

පළමුවැන්නා "හෙට මැරුණත් හිතට සැපයි අද ජොලී කරලා" යන සංකල්පය තදින්ම හිතට ගත් පුද්ගලයෙකි. ඔහු අස්වනු විකුණා ලබන ආදායමෙන් ප්‍රිය සාද පවත්වයි. නෑදෑ හිත මිතුරන් සමග කා බී ප්‍රීති වෙයි. ටික දිනකින්ම ඔහුගේ මුදල් අතුරුදහන් වෙයි.




දෙවැන්නා නිරවුල් මානසිකත්වයක් සහිත මූල්‍යය විනයක් ඇති පුද්ගලයෙකි. ඔහු අස්වනු විකුණා ලබන ආදායමෙන් කොටසක් බැංකු ගිණුමක ඉතුරු කරයි. ගොවිතැන් සඳහා ගත් සුළු සුළු ණය ගෙවා නිමකරයි. ඊළඟ වගා කන්නය සඳහා සූදානම් වෙයි. පවුලේ අය සමඟ සරල ජීවිතයක් ගත කරයි.

පළමුවැන්නා උපයන ධනය වර්ධනය වීමට ඉඩක් නැත.

එහෙත් දෙවැන්නාගේ ධනය වසරෙන් වසර වර්ධනය වේ.

## 4.0 මූල්‍ය සාක්ෂරතාවයේ බලපෑම නිරීක්ෂණය කරන්න

මෙහි පළමු පුද්ගලයා මුදල් පරිහරණය පිළිබඳ දැක්වූ ආකල්පය ධනාත්මක නොවූ අතර ඒ අනුව ඔහුගේ හැසිරීම් රටාව තීරණය විය. මුදල් උපයා ගැනීමට ප්‍රමාණවත් දැනුමක් සහ හැකියාවක් ඔහුට තිබුණි. නමුත් මුදල් පිළිබඳව තිබූ වැරදි ආකල්පය සහ වැරදි හැසිරීම නිසා ඔහුගේ ධනය නාස්ති විය; වර්ධනය වූයේ නැත. මුදල් පරිහරණය පිළිබඳව දෙවැන්නාගේ දැනුම හැකියාව ආකල්ප සහ චර්යාව වඩාත් ධනාත්මක සහ වගකීම් සහිත විය. ඒ හේතුවෙන් උපයා ගත් ධනය ආරක්ෂා විය; ධනය වර්ධනය විය.

### සාරාංශය

මුදල් පරිහරණය හා සම්බන්ධ හොඳ පුරුදුවලට අපි මූල්‍යය විනය යැයි කියමු. මෙහිදී නිරවුල් මානසිකත්වය වන්නේ මුදල් පිළිබඳව නිවැරදි ආකාරයෙන් සිතීමයි. ඔබ සිතන ආකාරයයි. මේ දෙකෙහි සුසංයෝගයෙන් පුද්ගලයෙකුගේ සාර්ථකත්වය සහ මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු වෙයි

# සටහන්

# 10
# ඩිජිටල් මුදල්

## 1.0 ඩිජිටල් මුදල්

**ඩිජිටල් මුදල් යනුවෙන් අදහස් කරන්නේ මොනවාද?**

කාලයක් තිස්සේ බැංකු සේවා සැපයීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදයන් සම්පූර්ණ පරිවර්තනයකට ලක් කරමින් වඩා වෙනස් සහ නව තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කරන බැංකු හා මූල්‍ය සේවාවන් හඳුන්වා දීම පිණිස (Digital Finance) ඩිජිටල් මුදල් යන පදය භාවිතා කෙරේ. මූල්‍ය සේවාවන් සැපයීම සඳහා යොදාගන්නා සැකසුම් ක්‍රම (Products) යෙදවුම් (Applications) ක්‍රමවේද (Processes) සහ ව්‍යාපාරික මොඩියුල් (Business Modules) ආදී අංගෝපාංග රාශියක් ඩිජිටල් මූල්‍ය සේවාවන්වලට අයත් වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය දියුණුවත් සමඟ මූල්‍ය ගනුදෙනු වඩාත් පහසු කර ගැනීමට උපකාරී වන විද්‍යුත් මෙවලම් රාශියක් බැංකු ක්‍රමය තුළට හඳුන්වා දී ඇත. පහත දක්වා ඇති උදාහරණය ගැන සිතා බලන්න.

**උදාහරණය:** අප නවීන සුඛෝපභෝගී බස් රථයක සුවපහසු ආසන මත වාඩි වී මිහිරි සංගීතයකට ද සවන් දෙමින් නිදහසේ චාරිකාවක යෙදී සිටින බව මොහොතකට සිතන්න. වායු සමනය කර ඇති නිසා අපට දහදිය දමන්නේ නැත. රථය අභ්‍යන්තරයේ මගීන්ට වන තෙරපුම අවම වන පරිදි විය සකසා ඇති බැවින් ගැස්සෙන්නේ පැද්දෙන්නේ නැත. අපට කිසිදු වෙහෙසක් නැතිව ගමනාන්තය දක්වා පැමිණීමට පුළුවන. එහෙත් එතරම් සුවදායක ලෙස බස් රථය නිර්මාණය කර ඇත්තේ කෙසේදැයි අප කිසිවෙකු දැන සිටියේ නැත. අප එහි සුවදායක පහසුකම් භුක්ති වින්දා පමණි.

වෙනදාට වඩා කඩිනමින්, පහසුවෙන් සහ ආරක්ෂිත ලෙස අපේ මූල්‍ය ගනුදෙනු කර ගැනීමට ඩිජිටල් මූල්‍ය සේවාවන් අපට උපකාරී වේ. එම සේවාවන් ක්‍රියාත්මක කරන, හසුරුවන සහ මෙහෙයවන ආයතන මෙන්ම ඒවා නියාමනය හා අධීක්ෂණය කරන ආයතන පද්ධතියක්ද නීති රීති හා රෙගුලාසි මාලාවක් ද පවතී. සාමාන්‍ය ගනුදෙනුකරුවන් වන අපට වැදගත් වන්නේ තිරය පිටුපස සිදුවන්නේ කුමක්ද යන්නට වඩා එදිනෙදා ජීවිතයේදී අපේ ගනුදෙනුවලට ඩිජිටල් මූල්‍ය සේවාවන් යොදා ගන්නා ආකාරය ගැන වැටහීමක් ලබා ගැනීමයි. බස් රථයේ නවීන අංගෝපාංගවල සුවදායක මිහිර අත්විඳිමින් අපි ගමන යමු.

මූල්‍යය ගනුදෙනුවලදී භාවිතා වන ඩිජිටල් තාක්ෂණය යම් දුරකට වටහාගැනීමටත් එම තාක්ෂණය හා මෙවලම් භාවිතයට ගැනීමටත් පුද්ගලයෙකුට ඇති දැනුම, හැකියාව සහ ඒවා පිළිබඳ සුභවාදී ආකල්ප හා හැසිරීම් රටාව යන සියල්ලම ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය යන්නෙන් අදහස් වෙයි.

අපි වේගයෙන් ඩිජිටල් යුගයකට ප්‍රවේශ වෙමින් සිටිමු.

මහා මාර්ගයේදී සිදුවන මාර්ග නීති උල්ලංඝනය කිරීමකදී පොලිස් නිලධාරීන් දෙන දඩ කොළය රැගෙන තැපැල් කාර්යාලයක් වෙත යෑමට වුවමනා නැත; මහා මාර්ගයේදීම දඩ මුදල ගෙවීමට ඩිජිටල් සේවා උපකාරී වෙයි. දැනටමත් මෙය ක්‍රියාත්මකය. මෙතරම් කඩිනම්, කාර්යක්ෂම සහ ආරක්ෂිත අයුරින් මූල්‍ය සේවාවන් සැපයීමට උපකාරී වන ඩිජිටල් මෙවලම් රාශියකි.




## 2.0 අන්තර්ජාලය සහ ජංගම දුරකථන හරහා සිදුකරන බැංකු ගනුදෙනු

**අන්තර්ජාලය :** අන්තර්ජාලය හරහා සිදු කරන බැංකු ගනුදෙනුවකදී කෙනෙකුට තම නිවසේ සිටම තමන්ගේ පරිගණකය උපයෝගී කරගෙන බාහිර පාර්ශවයක් සමඟ සෘජුව සම්බන්ධ වීමෙන් අදාළ ගනුදෙනු සිදුකළ හැකිය. අන්තර්ජාලය හරහා බැංකු ගනුදෙනු කිරීමට තමන්ගේ ගිණුම තිබෙන බැංකුවේ අවසරය සහ ලියාපදිංචිය ලබා තිබිය යුතුය. (User Name and Password)

**ජංගම දුරකථන :** දවසේ ඕනෑම වේලාවකදී ඕනෑම තැනක සිට තමන්ගේ දුරකථනය හරහා බැංකු ගනුදෙනු කිරීමට අවස්ථාව ලැබී තිබේ. දැනට මහජනතාව අතර වඩාත්ම ප්‍රචලිත ඩිජිටල් මූල්‍ය සේවාව මෙයයි. මේ සඳහා විශේෂ ජංගම යෙදවුම් (Mobile Applications) භාවිතා කළ යුතුය. ශ්‍රී ලංකාවේ සියලුම බලපත්‍රලාභී බැංකු දුරකථනය හරහා බැංකු ගනුදෙනු කිරීමට උපකාරී වන ජංගම යෙදවුම් (Mobile Applications) හඳුන්වා දී ඇත.



ගනුදෙනුකරු තම ගිණුම තිබෙන බැංකුවේ ජංගම යෙදුම (ඇප් එක) තමන්ගේ දුරකථනයට බාගත (Download) කරගත යුතුය. ගනුදෙනුකරුවන්ට තම ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නිලධාරීන්ගෙන් විමසා අදාළ ජංගම යෙදවුම බාගත කොට ස්ථාපිත කරන ආකාරය දැන ගැනීමට පුළුවන. බොහෝමයක් බැංකුවල එවැනි උපදෙස් දීම සඳහා නිලධාරින් සිටි. එහිදී ඇප් එක පාවිච්චි කරන අයගේ නම (Username) සහ මුර පදයක් (Password) යොදාගත යුතුය. ඒවා අනුන්ට දැනගැනීමට නොලැබෙන පරිදි ආරක්ෂිතව තබා ගැනීමට වග බලා ගත යුතුය.

එසේ සක්‍රිය කර ගත් ඇප් එකකින් ගනුදෙනුකරුවෙකුට තමන්ගේ බැංකු ගිණුම හරහා ගනුදෙනු රාශියක් කර ගැනීමට පුළුවන. ඒවායින් කිහිපයක් පහත දක්වා ඇත.

i. තමන්ගේ බැංකු ගිණුම්වල ඇති ශේෂ පරීක්ෂා කර බැලීම

ii. ගිණුම හරහා පසුගිය කාලය තුළ සිදු කර ඇති ගනුදෙනු පරීක්ෂා කර බැලීම

iii. මාසික බිල් පත් ගෙවීමටද පුළුවන. එනම් විදුලිය ජලය සහ දුරකථන සේවා ආදිය සඳහා කරන ගාස්තු දුරකථනය හරහාම ගෙවිය හැක.

iv. තමන් ලබාගත් ණය මුදලක වාරික ගෙවීමටද පුළුවන

v. තමන්ගේ ණය කාඩ් පතේ පෙර මාසයට අදාළ හිඟ මුදල් ගෙවිය හැක

vi. වෙනත් පුද්ගලයකුගේ හෝ ආයතනයක බැංකු ගිණුම් වෙත මුදල් ප්‍රේෂණය කිරීමට පුළුවන.

vii. කිවු ආර් කෝඩ් (QR Code) තිබෙන වෙළෙඳ සැලකින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවලට කියුආර් මඟින් ක්ෂණිකව මුදල් ගෙවීමට පුළුවන.

## 3.0 ගෙවීම් කාඩ්පත් (Payment Cards)

යම් භාණ්ඩයක් හෝ සේවාවක් විකුණන තැනක දී (Point of Sale - POS) මිලදීගන්නා භාණ්ඩ හෝ සේවාවලට කඩිනමින් ගෙවීම් කිරීමටද, ස්වයංක්‍රීය ටෙල මැෂින් එකක් හරහා තම ගිණුමේ ඇති මුදල් ආපසු ලබාගැනීමට ද, මෙම කාඩ්පත් උපයෝගී කර ගැනීමට පුළුවන. බැංකු විසින් මෙම විද්‍යුත් කාඩ්පත් නිකුත් කරනු ලබන්නේ අන්තර්ජාතිකව පිළිග න්නා වීසා, මාස්ටකාඩ් (Visa Master Card) වැනි කාඩ් පත් යෝජනා ක්‍රම යටතේය. එබැවින් ගනුදෙනුකරුට මෙම කාඩ් පත්‍ර යොදාගෙන පිට රටකදී වුව ද භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් කිරීමට පුළුවන. මෙවැනි ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීමට බලය ඇත්තේ බලපත්‍රලාභී බැංකු සහ මූල්‍ය ආයතන හා ජංගම දුරකථන සේවා සපයන සමාගම්වලට පමණි.

## 3.1 හරපත (Debit Card)

*බැංකුවේ ගිණුම් හිමියන්ට එම ගිණුම්වලින් මුදල් ආපසු ලබා ගැනීම ආදී කටයුතු පහසු කරගැනීමට හර කාඩ් පත් නිකුත් කරනු ලැබේ. එය විද්‍යුත් කාඩ් පතකි. නිකුත් කළ දින සිට වසර කිහිපයක් එමගින් ගනුදෙනු කිරීමට අවස්ථාව ලැබෙයි. කාලය අවසන් වූ විට නැවත එම කාඩ් පත අලුත්කර ගැනීමට පුළුවන. කාඩ්පත නිකුත් කිරීම සඳහා සුළු ගාස්තුවක් අය කරනු ලැබේ. බහුල වශයෙන් තමන්ගේම ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට හර කාඩ් පත භාවිතා කරනු දක්නට පුළුවන. ගනුදෙනුකරුවා මුදල් ආපසු ගැනීම පිණිස බැංකුවේ ගෙවීම් කවුන්ටරය වෙත යෑමට අවශ්‍ය නැත. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) වෙත ගොස් අදාළ මුරපදය භාවිතා කොට හරපත මගින් තම ගිණුමෙහි ඇති මුදල් ආපසු ලබා ගැනීමට පුළුවන. එසේම හරපත් යොදාගෙන භාන්ඩ හා සේවාවන් සඳහා මිල ගෙවීමටද පුළුවන. මුදල් ආපසු ගත්තත්, යම්කිසි ගෙවීමක් සිදුකළත් එහිදී සිදුවන්නේ තමන්ගේ ගිණුමේ ශේෂයෙන් අදාළ වටිනාකම අඩුවීමයි.*

## 3.2 ණය කාඩ් පත (Credit Card)

ණය කාඩ් පත් ද ගෙවීම් කාඩ්පත් ගණයට වැටෙන තවත් මෙවලමකි. බැංකුව ගනුදෙනුකරුට අනුමත කරන ණය සීමාවක් යටතේ මෙම කාඩ් පත ක්‍රියාත්මක වෙයි. ණය කාඩ් පත නිකුත් කරන බැංකුව ගනුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය මත එක්තරා උපරිම සීමාවක් දක්වා වන ණය මුදලක් අනුමත කරයි. එම උපරිම සීමාව දක්වා භාණ්ඩ හා සේවාවන් සඳහා ගෙවීම් කිරීමට කාඩ් පත් හිමියාට අවස්ථාව ලැබේ. සෑම මාසයකම නිශ්චිත දිනයකදී පෙර මාසයේදී ලබා ගත් ණය ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ගෙවා නිම කළ යුතුය. නැතහොත් බැංකුව නියම කරන අවම ප්‍රමාණය හෝ ගෙවිය යුතුය. එසේ පෙර මාසෙට අදාළ ණය ප්‍රමාණය එකවරම ගෙවා නිම කළොත් කිසිදු පොලී මුදලක් අය කරන්නේ නැත. (පොලී රහිතව එම ණය මුදල භාවිත කිරීමට ලැබෙන කාලය සාමාන්‍යයෙන් දින පනස් දෙකක් පමණ වේ) මුළු මුදලම නොගෙවා අවම මුදල් ප්‍රමාණය පමණක් ගේවුවහොත් ණයශේෂය ඉදිරියට යන බැවින් ඒ සඳහා පොලී මුදලක් ගෙවීමට සිදුවෙයි.

මීට අමතරව ණයකාඩ් පත මගින් මුදල් ද ලබා ගැනීමට පුළුවන. ඒ සඳහා වෙනම හඳුනා ගැනීමේ අංකයක් නිකුත් කරයි (PIN) එසේ මුදල් ලබා ගතහොත් ලබා ගත් දින සිටම අදාළ මුදල සඳහා පොලී අය කරනු ලැබේ.

අන්තර්ජාලය හරහා කරන ගනුදෙනුවල දී ණය කාඩ් පත යොදා ගැනීමට පුළුවන. එහිදී කාඩ් පත ඉදිරිපත් නොකරන නමුත් කාඩ් පතේ තොරතුරු අදාළ පාර්ශවයට ලබාදිය යුතුය. (තමන් නොදන්නා පාර්ශවයක් වෙත ණය කාඩ් පතේ තොරතුරු ලබාදීම සුදුසු නොවේ.)




ණය කාඩ් පතින් ගෙවීම් කරන විට ඒ අවස්ථාවේදීම ගනුදෙනුකරුගේ ගිණුමෙන් මුදල් අඩුවන්නේ නැත. බැංකුව ලබාදුන් ණය මුදලක් බැවින් එකඟ වී ඇති නියමිත දිනයේදී හෝ ඊට පෙර එම ණය ආපසු ගෙවිය යුතුය. යම් හෙයකින් ගනුදෙනුකරුට එම ණය මුදල හෝ  බැංකුව නියම කරන අවම මුදල ගෙවීමට අපහසු වුවහොත් ගනුදෙනුකරු ණය මුදල පැහැර හැරියා සේ සලකා කටයුතු කරයි. ඒ අනුව ගනුදෙනුකරුගේ විස්තර ශ්‍රී ලංකා  ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කරනු ලැබේ. ගනුදෙනුකරුට එම ණය කාඩ් පත තවදුරටත් භාවිතා කිරීමට නොහැක. එසේම වෙනත් බැංකුවකින් හෝ ණය පහසුකමක් හෝ ණය කාඩ් පතක් වැනි පහසුකමක් ලබා ගැනීමට ද අවස්ථාවක් ලැබෙන්නේ නැත.

මීට අමතරව බැංකුවට කලින් මුදල් ගෙවා ගනුදෙනු කිරීම සඳහා විද්‍යුත් කාඩ් පතක් ගැනීමටද පුළුවන. (Stored Value Card) එම කාඩ් පතෙන් යම් මිලදී ගැනීමක් සඳහා ගෙවීමක් කළ විට අදාළ වටිනාකම කලින් රඳවා ඇති මුදලෙන් අඩුවේ. රඳවා තැබූ මුදල් ප්‍රමාණය අඩු වූ විට ගනුදෙනුකරුට යළිත් අඩුව සම්පූර්ණ කිරීමට මුදල් තැන්පත් කිරීමට (Reload) පුළුවන. විදේශ සංචාර වලදී පාවිච්චි කිරීම පිණිස මෙය ප්‍රයෝජනවත් වෙයි. එසේම අන්තර්ජාලය හරහා කරන ගනුදෙනුවලදී ද මෙම කාඩ් පත වඩාත් ආරක්ෂාකාරී වේ.  මෙම කාඩ් පත යොදාගෙන ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයෙන් ද මුදල් ආපසු ලබා ගැනීමට පුළුවන.

## 4.0 ක්ෂණික ප්‍රතිචාර කේතය (QR Code) පදනම් කරගෙන සිදු කරන ගෙවීම් (Quick Response Code based Payments)

ක්ෂණික ප්‍රතිචාර කේතය පදනම් කරගත් ගෙවීම් යනුවෙන් අදහස් වන්නේ, කිසියම් බැංකු ගනුදෙනුකරුවෙක් තම ජංගම දුරකථනයට බාගත කරගන්නා එම බැංකුවේ ජංගම ගෙවීමේ යෙදවුමකින් (Mobile Payment Application) වෙළඳ ආයතනයක කියු ආර් කෝඩ් එක (QR Code) සුපරීක්ෂණය (Scan) කිරීමෙන් පසු තමන් ලබා ගත් භාණ්ඩ හා සේවාවන් සඳහා අදාළ වන මිල ක්ෂණිකව ගෙවිය හැකි ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ

ඒකාබද්ධ ගෙවීම් පද්ධතියක් වන මෙම ක්‍රමය ලංකා කිව් ආර් (Lanka QR) නමින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍ර ලාභී බැංකු හා ලංකා ක්ලියර් (Lanka Clear) සමාගම ඒකාබද්ධව 2019 මාර්තු මාසයේ දී හඳුන්වා දෙන ලදී. ඒ සමඟම බලපත්‍ර ලාභී බැංකු ලංකා කිව් ආර් ක්‍රමයට (Lanka QR) ගැළපෙන ජංගම ගෙවීම් යෙදවුම් (Lanka QR Certified Mobile Applications) හඳුන්වා දෙන ලදී. එම යෙදවුමක් තමන්ගේ දුරකථනයට බාගත (Download) කරගන්නා ගනුදෙනුකරුවකුට එමගින් යම් භාණ්ඩ හා සේවා අලෙවි කරන ස්ථානයකදී (Point of Sale) තමන් ලබාගන්නා භාණ්ඩ හා සේවාවලට අදාළ මිල ක්ෂණිකව ගෙවීමට අවස්ථාව ලැබේ.

එහිදී ගනුදෙනුකරු තම ජංගම දුරකථනයෙහි ඇති තමන්ගේ බැංකුවෙන් හඳුන්වා දුන් ලංකා කිව් ආර්ක්‍රමයට ගැලපෙන ඇප් එක විවෘත කළ යුතුය. ගෙවීම කළ යුත්තේ කියු ආර් කෝඩ් යටතේ බව තෝරා ගත යුතුය. ඉන්පසු ජංගම දුරකථනයෙහි ඇති කැමරාවෙන් වෙළඳසැලට අයත් කිව් ආර් කෝඩ් එක සුපරීක්ෂණය (Scan) කළ යුතුය. එහිදී වෙළඳසැල හිමියා විසින් සඳහන් කරන භාණ්ඩ හා සේවාවල මිල (වටිනාකම) ඇතුලත් කළ යුතුය. තමන් මිල ගෙවන්නේ ඉතිරි කිරීමේ ගිණුමෙන් ද, ජංගම ගිණුමෙන් ද නැතහොත් ණය කාඩ් පතෙන් ද යන්න සඳහන් කළ යුතුය.

මිල ඇතුළත් කිරීමෙන් පසු ගනුදෙනුව තහවුරු කළ යුතුය. ක්ෂණිකවම ගනුදෙනුකරුගේ ගිණුමෙන් අදාල වටිනාකම අඩුවී වෙළඳ සල් හිමියාගේ ගිණුමට බැරවනවා ඇත. ඒ බව දෙදෙනාටම ක්ෂණික පණිවුඩ මාර්ගයෙන් දැනුම් දෙයි.

## 5.0 ව්‍යුහගත නොවූ පරිපූරක දත්ත සේවාව මාර්ගයෙන් සිදු කරන බැංකු ගනුදෙනු (Unstructured Supplementary Service Data - USSD)

ව්‍යුහගත නොවූ පරිපූරක දත්ත සේවාව යන්නෙන් අදහස් වන්නේ ගනුදෙනු කරුවෙකුට ඔහුගේ /ඇගේ බැංකුව විසින් සපයා ඇති (USSD Short Code) කේතයෙන් බැංකුවට දුරකථන ඇමතුමක් දුන් විට එම අයගේ බැංකු ගිණුමෙන් මුදල් ගෙවීමට, වෙනත් අයෙකුගේ ගිණුමට මුදල් මාරු කිරීමට ආදී ගනුදෙනුවලට අවස්ථාව සැලසෙන ගෙවීම් ක්‍රමයකි. මෙහි විශේෂත්වය වන්නේ USSD මගින් ගනුදෙනු කිරීමට සුහුරු (Smart) ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වන්නේ නැති වීමයි. මෙය සරල නමුත් ගෝලීය ආවරණයක් සහිත තාක්ෂණයකි. මෙහිදී සිදුවන්නේ USSD කෝඩ් එකෙන් ගනුදෙනුකරුගේ බැංකු ගිණුම ඔහුගේ ජංගම දුරකථනයේ අංකය සමඟ සම්බන්ධ වීමයි. (බැංකුව ගනුදෙනුකරුට USSD Short Cord එක සපයා ඇත).

එම කෝඩ් එකෙන් ගනුදෙනුකරුවා බැංකුවට ඇමතුමක් දුන් විට අනුමත කිරීම සඳහා සරල ආකෘතියක් ලැබෙයි. එය අනුමත කළ විට ගනුදෙනුව සකස් වී අදාළ ගෙවීම සිදුකරයි. ඒ සමගම ගනුදෙනු කරු සහ මුදල් ලබන වෙළඳ ආයතනයට ද ගෙවීම පිළිබඳ තහවුරුවක් ලැබෙයි.

## 6.0 ගෙවීම් කාඩ්පත්වල ආරක්ෂාව සම්බන්ධයෙන් දැන සිටිය යුතු කරුණු

i. ගෙවීම් කාඩ් පත් ඉතාමත්ම ආරක්ෂිත ස්ථානවල තබා ගත යුතුයි. ඒවාට අදාළ රහස්‍ය අංක වෙනත් බාහිර පුද්ගලයින්ට දැනගැනීමට තැබිය යුතු නොවේ.




ii. Card පතක් නැති වුවහොත් එම කාඩ් පත නිකුත් කළ බැංකුවට වහාම දැනුම්දිය යුතුය.




iii. සියලුම ගනුදෙනු තමන් විසින්ම සිදු කළ යුතුය. පිටස්තර අය ලවා ගනුදෙනු සිදු නොකළ යුතුය. පිටස්තර අයට රහස්‍ය අංකය ආදි මුර පද දැන ගැනීමට සැලැස්විය යුතු නොවේ.

iv. ගෙවීම් කාඩ්පත් වල විස්තර ඊමේල්, SMS WhatsApp ආදී ක්‍රම වලින් වෙනත් අය වෙත යැවීම සුදුසු නොවේ.



"කිසිවෙකුට යකඩ විනාශ කළ නොහැක. නමුත් යකඩය තුළින්ම එන මළකඩවලට එය විනාශ කළ හැක. ඒ වගේම කිසිවෙකුට පුද්ගලයාව විනාශ කළ නොහැක; නමුත් පුද්ගලයාගේ මානසිකත්වයට එය කළ හැක"

(රටන් ටාටා ඉන්දියාවේ වඩාත් ගෞරවයට පාත්‍ර වූ ව්‍යාපාර හිමියෙකි.)

# 11
# උප ග්‍රන්ථය

## 1.0 ණය සඳහා පොලී අය කරන හැටි

ණය හිමියන් විසින් ණය ලාභීන්ගෙන් පොලි අය කරන ආකාර කීපයකි. සමහර ණය සඳහා දෛනික පදනමින් පොලී අය කරයි. තවත් සමහර ණය සඳහා මාසික පදනමින් පොලී අය කරයි. සාමාන්‍යයෙන් පොලි අය කරනු ලබන්නේ වාර්ෂික පදනමිනි. නිත්‍යානුකූල බැංකු ආයතන ණය මුදල් සඳහා පොලී ගණනය කරන්නේ හීනවන ශේෂ ක්‍රමයටය. ඇතැම් මූල්‍ය ආයතන සහ පුද්ගලයින් ණය මුදල් සඳහා පොලී අය කිරීම පිණිස සම තල ක්‍රමය භාවිතා කරයි. සෑම මාසයකදීම එක සමාන වටිනාකමින් යුත් වාරික ගෙවීම සමතල ක්‍රමයයි.

හීනවන ශේෂ ක්‍රමය පොලී අය කිරීමේදී (වාරික ගෙවීම නිසා) සෑම මාසයකම අඩුවන ණය ශේෂයට අනුව පොලී ගණනය කරයි. ඒ නිසා ගෙවිය යුතු පොලිය මාසෙන් මාසයට අඩු වෙයි. ඒ අනුව වාරිකය සහ පොලිය එකතු වීමෙන් ගෙවිය යුතු මුළු ගණන ද මාසයෙන් මාසයට අඩුවේ. මෙය මාස් පතා නියමිත දිනයේ දී ණය මුදල ගෙවීමට උනන්දු වන ණය ලාභියෙකුට වාසි දායක තත්ත්වයකි. පහත උදාහරණය බලන්න.

| ආපසු ගෙවීමේ කාලය මාස 36 | |
|---|---|
| ලබාගත් ණය මුදල | රුපියල් 50 ,000.00 |
| පොලි අනුපාතය (වර්ෂයකට) | සියයට 12 |
| ආපසු ගෙවීමේ කාලය | මාස 36 |

| මාසය | ණය ශේෂය | ණය වාරිකය | ණය ශේෂය සඳහා මාසිකව ගෙවිය යුතු පොලිය | මාසිකව ගෙවිය යුතු මුළු ගණන |
|---|---|---|---|---|
| 1 | 50,000 | 1389 | 500 | 1889 |
| 2 | 48,611 | 1389 | 486 | 1875 |
| 3 | 47,222 | 1389 | 472 | 1861 |
| 4 | 45,833 | 1,389 | 458 | 1,847 |
| 5 | 44,444 | 1,389 | 444 | 1,833 |
| 6 | 43,056 | 1,389 | 431 | 1,819 |
| 7 | 41,667 | 1,389 | 417 | 1,806 |
| 8 | 40,278 | 1,389 | 403 | 1,792 |
| 9 | 38,889 | 1,389 | 389 | 1,778 |
| 10 | 37,500 | 1,389 | 375 | 1,764 |
| 11 | 36,111 | 1,389 | 361 | 1,750 |
| 12 | 34,722 | 1,389 | 347 | 1,736 |
| 13 | 33,333 | 1,389 | 333 | 1,722 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | 31,944 | 1,389 | 319 | 1,708 |
| 15 | 30,556 | 1,389 | 306 | 1,694 |
| 16 | 29,167 | 1,389 | 292 | 1,681 |
| 17 | 27,778 | 1,389 | 278 | 1,667 |
| 18 | 26,389 | 1,389 | 264 | 1,653 |
| 19 | 25,000 | 1,389 | 250 | 1,639 |
| 20 | 23,611 | 1,389 | 236 | 1,625 |
| 21 | 22,222 | 1,389 | 222 | 1,611 |
| 22 | 20,833 | 1,389 | 208 | 1,597 |
| 23 | 19,444 | 1,389 | 194 | 1,583 |
| 24 | 18,056 | 1,389 | 181 | 1,569 |
| 25 | 16,667 | 1,389 | 167 | 1,556 |
| 26 | 15,278 | 1,389 | 153 | 1,542 |
| 27 | 13,889 | 1,389 | 139 | 1,528 |
| 28 | 12,500 | 1,389 | 125 | 1,514 |
| 29 | 11,111 | 1,389 | 111 | 1,500 |
| 30 | 9,722 | 1,389 | 97 | 1,486 |
| 31 | 8,333 | 1,389 | 83 | 1,472 |
| 32 | 6,944 | 1,389 | 69 | 1,458 |
| 33 | 5,556 | 1,389 | 56 | 1,444 |
| 34 | 4,167 | 1,389 | 42 | 1,431 |
| 35 | 2,778 | 1,389 | 28 | 1,417 |
| 36 | 1,389 | 1,389 | 14 | 1,403 |
| | | **50,000** | **9,250** | **59,250** |

පළමු මාසයේ ණය වාරිකය ගෙවූ බැවින් දෙවන මාසයේ දී ණය ශේෂය අඩු වී ඇති ආකාරය බලන්න. මෙලෙස මාසයෙන් මාසයට ණය ශේෂය අඩුවේ. අඩුවන ණය ශේෂයට පොලී ගණනය කරන බැවින් පොලිය ද මාසයෙන් මාසයට අඩු වන අන්දම නිරීක්ෂණය කරන්න. වර්ෂ තුනටම ගෙවිය යුතු පොලී මුදල රුපියල් 9,250.00 පමණි. ණය මුදලද සමඟ ගෙවිය යුතු මුළු ගණන රුපියල් 59,250 පමණි.

හීන වන ශේෂ ක්‍රමයට පොලිය ගණනය කරන බැවින් ණය ගැනුම්කරුට අත්වන වාසි සහගත තත්ත්වය අවබෝධ කරගන්න.

මෙම ණය ප්‍රමාණයම (50,000.00) මෙම පොලී ප්‍රතිශතය යටතේම (12%) ලබාගෙන මාස තිස් හයකදී (36) සමතල ක්‍රමය යටතේ පොලී ගෙවීමේදී ණය ගැනුම්කරුට ගෙවීමට සිදුවන ප්‍රමාණය සංසන්දනය කර බලන්න.

## සමතල ක්‍රමය

සමතල ක්‍රමය යන්නෙන් අදහස් කරන්නේ ණය ආපසු ගෙවීමේදී එක සමාන වටිනාකම ඇති වාරික මුදලක් ගෙවීමට හැකිවන පරිදි මාසික වාරිකය තීරණය කිරීමයි. මෙහිදී ණය මුදලට අදාළ වන පොලී මුදල මුල් මුදලට එකතුකොට එම ප්‍රමාණය ගෙවිය යුතු වාරික ගණනින් බෙදා (ගෙවිය යුතු) මාසික වාරිකය තීරණය කරයි. මෙහිදී ණය මුදලට එකතු වන පොලිය මත පොලිය එකතුවීම නිසා ණය ගැනුම්කරුට වැඩි මුදලක් ගෙවීමට සිදුවන බව පහත උදාහරණයෙන් පෙන්නුම් කරයි.

| සමතල ක්‍රමය යටතේ පොලි අය කිරීම | |
|---|---|
| මුළු ණය මුදල රුපියල් | 50,000.00 |
| වාර්ෂික පොලිය සියයට | 12 |
| ගෙවිය යුතු මාසික වාරික ගණන | 36 |
| පොලි සහ ණය වාරික එකතු කොට සමාන වාරික වලින් ගෙවීම මුල් ණය මුදල රුපියල් | 50,000 |
| පළමු වර්ෂයට අදාළ පොලී මුදල රුපියල් | 6,000 |
| දෙවන වර්ෂයට (රුපියල් 56,000) අදාල පොලිය රුපියල් | 6,720 |
| තුන්වන වර්ෂයට (රුපියල් 62,720) අදාළ පොලිය රුපියල් | 7,526 |
| එකතුව රුපියල් | 70,426 |
| සමාන මාසික වාරිකය (එකතුව තිස් හයෙන් බෙදූවිට) රුපියල් | 1931.28 |

සමාන වාරික වලින් ගෙවිය හැකි බව පැහැදිලිය. නමුත් මෙහි දී වැල් පොලී ක්‍රමයට එකතු වන පොලිය මත පොලී ගෙවීමට සිදුවීම නිසා ණය ගැනුම්කරුට වැඩිපුර මුදලක් ගෙවීමට සිදුවේ. ඉහත දැක්වූ හීන වන ශේෂ ක්‍රමයට ගණනය කළ පොලි මුදල සමග සසඳා බලන්න.

## මාසික පොලිය සහ වාර්ෂික පොලිය අතර වෙනස

සාමාන්‍යයෙන් බැංකු ආයතන ණය මුදල් සඳහා පොලී ගණනය කරන්නේ වාර්ෂික පදනමිනි. නමුත් පොලියට ණය දෙන වෙනත් ආයතන සහ පුද්ගලයන් මාසික පදනමින් පොලි ගණනය කරන බව වාර්තා වී තිබේ.

උදාහරණයක් වශයෙන් ඔබ බැංකු ආයතනයකින් ණය මුදලක් (100.00)ලබා ගත්තේ යැයි සිතමු.

වර්ෂයේ අවසානයේ ඔබට ගෙවීමට සිදුවන මුළු මුදල ගණනය කරන්නේ මෙසේය.

| | |
|---|---|
| ලබාගත් මුල් ණය මුදල රුපියල් | 100.00 |
| සියයට දහය බැගින් වර්ෂයක පොලිය රුපියල් | 10.00 |
| වර්ෂය අවසානයේදී ගෙවිය යුතු මුළු මුදල රුපියල් | 110.00 |
| **ණය ගෙවා අවසාන කිරීමට ඔබට ගෙවීමට සිදුවන්නේ රුපියල් එකසිය දහයකි.** | |

ඔබ මාසික පොලියට ණය දෙන ආයතනයකින් රුපියල් 100 ණය මුදල සියයට දහයේ පොලි අනුපාත යටතේ ලබාගත්තේ යැයි සිතමු.

වර්ෂය තුළ හෝ වර්ෂ අවසානයේ දී ගෙවිය යුතු මුළු මුදල ගණනය කරන්නේ මෙසේය.

| | |
|---|---:|
| ණයට ගත් මුදල රුපියල් | 100.00 |
| පළමු මාසයට පොලී රුපියල් | 10.00 |
| දවන මාසයට පොලී රුපියල් | 10.00 |
| තුන්වන මාසයට පොලී රුපියල් | 10.00 |
| හතරවන මාසයට පොලී රුපියල් | 10.00 |
| පස්වන මාසයට පොලී රුපියල් | 10.00 |
| හයවන මාසෙට පොඩි රුපියල් | 10.00 |
| හත්වන මාසයට පොලි රුපියල් | 10.00 |
| අටවන මාසෙට පොලී රුපියල් | 10.00 |
| නව වන මාසයට පොලි රුපියල් | 10.00 |
| දහවන මාසයට පොලි රුපියල් | 10.00 |
| එකොලොස්වන මාසෙට පොලී රුපියල් | 10.00 |
| දොළොස්වන මාසෙට පොලී රුපියල් | 10.00 |
| **එකතුව රුපියල්** | **220.00** |

එම ණය ගෙවා නිම කිරීම පිණිස රුපියල් 220 ක් ගෙවිය යුතුය. වාර්ෂික පොලියට ණය ගන්නා කෙනෙකුට වඩා මාසික පොලියට ණය ගන්නා කෙනෙකුට වැඩිපුර මුදලක් ගෙවීමට සිදුවේ .

# 2.0 හොර සල්ලි!

සැබෑ මුදල් නෝට්ටු ලෙස මතුපිටින් බලන විට පෙනෙන පරිදි ඇතැම් අය ව්‍යාජ නෝට්ටු මුද්‍රණය කළ අවස්ථා ගැන වාර්තා වී තිබේ. ව්‍යාජ නෝට්ටු මුද්‍රණය කිරීම නීති විරෝධී ක්‍රියාවකි. මුදල් නෝට්ටු නිකුත් කිරීමේ බලය ඇත්තේ ශ්‍රී ලංකා මහා බැංකුවට පමණි.

කෙසේ වුවද, සැබෑ නෝට්ටුවක් හා සමාන ලෙස හොර නෝට්ටු මුද්‍රණය කිරීමට නොහැකි වන සේ සැබෑ නෝට්ටු මුද්‍රණය කර තිබේ.

සැබෑ නෝට්ටු මුද්‍රණය කරන කඩදාසි ඒ වෙනුවෙන්ම සකස්කර ඇති විශේෂ කඩදාසියකි. එබැවින් කිසිවෙකුට එම කඩදාසිය හෝ ඊට සමාන කඩදාසි වර්ගයක් සොයා ගැනීමට නොහැකි වේ. සැබෑ නෝට්ටුවක් හඳුනාගැනීම පිණිස යම් යම් ආරක්ෂක සලකුණු යොදා තිබේ. හොර නෝට්ටුවලට එවැනි ආරක්ෂක සලකුණු යෙදීමට නොහැකිය.

මුදල් නෝට්ටුවක මුදල් අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා අත්සන් යොදා ඇත. එසේ අත්සන් යොදා ඇති පැත්ත නෝට්ටුවේ මුහුණත ලෙසත් අනිත් පැත්ත නෝට්ටුවේ පිටුපස පැත්ත ලෙසත් සලකනු ලැබේ.
මුදල් නෝට්ටුවල යොදා ඇති ආරක්ෂක සලකුණු කිහිපයක් පහතින් දක්වා ඇත. (ඔබට ලැබෙන නෝට්ටු සැබෑ නෝට්ටු ද යන්න දැන ගැනීමට මෙම සලකුණු පිළිබඳ දැනුමක් තිබීම ප්‍රයෝජනවත් වෙයි.)

## දිය සලකුණ

නෝට්ටුවක මුහුණත වම් පැත්තේ මෙම දිය සලකුණු යොදා තිබේ. ආලෝකයට අල්ලා බැලූ විට එය මනාව දැකගත හැකිය. පැරැණි නෝට්ටුවල දිය සලකුණ ලෙස සිංහයාගේ රූපය දක්වා තිබුණි. වර්තමාන නෝට්ටුවල දිය සලකුණු ලෙස ඇත්තේ එම නෝට්ටුවේ වටිනාකම දැක්වෙන ඉලක්කම් සහ නෝට්ටුවේ මුද්‍රණය කර තිබෙන පක්ෂියාය.

## ආරක්ෂක නූල

නෝට්ටුවේ මුහුණත පැත්තේ බැලූ විට පැහැදිලිව දක්නට පුළුවන. රුපියල් 20, 50, හා 100 නෝට්ටු වල ආරක්ෂක නූල නෝට්ටුවෙහි ඇතුලට ගිල්වා ඇත. රුපියල් 500, 1000, හා 5000 ආදී නෝට්ටුවල මෙම ආරක්ෂක නූල තරමක් පළල් වන අතර ඉතා පැහැදිලිව දක්නට පුළුවන. තවද, නෝට්ටුවේ වටිනාකම ඉලක්කමින් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නම කෙටියෙන් දක්වන ඉංග්‍රීසි අකුරු CBSL ආරක්ෂක නූල මත දක්වා තිබේ.

## වැර ගැන්වූ කොන්

හැම නෝට්ටුවකම කොන් හතරේ දක්වා ඇති ඉරි (දිය සලකුණ) වැර ගැන්වූ කොන් ලෙස හැඳින්වේ.

## ඉතා කුඩා අකුරු

නෝට්ටුවල මුහුණත පැත්තේ වම් පස පහළ CBSL යන ඉංග්‍රීසි අකුරු සහිත නෝට්ටුවේ වටිනාකම දක්වන ඉලක්කම් ඉතා කුඩා අකුරින් දක්වා තිබේ.

## උස් වූ මුද්‍රිත කොටස්

නෝට්ටුවල මුහුණත පැත්තේ දක්වා ඇති ශ්‍රී ලංකා මහ බැංකුව නමැති පාඨය සහ දෙපස යොදා ඇති ඉරි අනෙක් අකුරු රූපවලට වඩා උස්ව මුද්‍රණය කර ඇත.

## අන්ධ පුද්ගලයින්ට නෝට්ටුවල වටිනාකම හඳුනා ගැනීමට යොදා ඇති සලකුණු

නෝට්ටුවේ මුහුණත පැත්තේ වම් පසට වන්නට සිරස් අතට රළු ලෙස මුද්‍රණය කර ඇති තිත් සලකුණුවලින් අන්ධ පුද්ගලයින්ට නෝට්ටුවේ වටිනාකම හඳුනාගත හැක.

ව්‍යාජ නෝට්ටුවක් යැයි සැක හිතුනොත් මේ ආරක්ෂක ලකුණුවලින් එකකට වැඩි ගණනක් පරීක්ෂා කර බැලීමෙන් නෝට්ටුව හඳුනා ගැනීමට පුළුවන.

*"වියදම් කිරීමෙන් පසු ඉතිරි වන දේ*
*ඉතිරි කිරීමක් නොවේ;*
*ඒ වෙනුවට ඉතිරි කිරීමෙන් පසු*
*ඉතිරි වන දේ වියදම් කරන්න".*

# 3.0 රක්ෂණය

ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි එක හා සමාන අවදානම් ඇති පුද්ගලයන් විශාල පිරිසක් දායක වීමෙන් ඇති කරන විශේෂ අරමුදලකින් ඇත්ත වශයෙන්ම එම අවදානමට මුහුණ දෙන කිහිප දෙනෙකුට වන්දි ගෙවීම රක්ෂණයෙන් කෙරෙන කාර්යය හැටියට හැඳින්වීමට පුළුවන. උදාහරණයක් වශයෙන් රථ වාහන අනතුරු රක්ෂණය විමසා බලමු.

සෑම වාහනකටම අනතුරකට මුහුණ දීමේ අවදානම පවතී. එනිසා සෑම වාහන හිමියෙක්ම රක්ෂණ ආවරණයක් ලබා ගනී. නමුත් ඇත්ත වශයෙන්ම අනතුරු වලට ලක්වන්නේ කීපදෙනෙකි. ඔවුන්ට සිදුවන අලාභය රක්ෂණ අරමුදලින් ගෙවන බැවින් හානි පූර්ණය කර ගැනීමට ඔවුන්ට පුළුවන. මෙහිදී සිදුවන්නේ තනි පුද්ගලයෙකුට තනියම දරා ගැනීමට නොහැකි අවදානමක් ඒ හා සමාන අවදානම් ඇති විශාල පිරිසක් අතර බෙදා ගැනීමකි. එහෙත් සෑම අවදානමක්ම රක්ෂණය කළ නොහැක.

**රක්ෂණය කළ හැකි අවදානම් මොනවාද?**
**ජීවිත හදිසි අනතුරු**
**ලෙඩ රෝග ගිනි අනතුරු**
**සොර බිය කෘෂිකාර්මික වගා හානි ත්‍රස්තවාදී ක්‍රියා**

**රක්ෂණය යනු ගිවිසුමකි.** රක්ෂක (රක්ෂණ ආයතනය) රක්ෂිතයාට (එනම් රක්ෂණය ලබන්නාට) රක්ෂණ යෝජනාව ඉදිරිපත් කළ පසු එහි ඇති තොරතුරු සහ කොන්දේසි පරීක්ෂා කර බලා රක්ෂිතයා විසින් එය පිළිගැනීමෙන් ගිවිසුම ඇතිවේ. එහිදී රක්ෂණය කරන අවදානම අනුව තීරණය කරන වටිනාකම මත කිසියම් වාරික මුදලක් ගෙවීමෙන් ගිවිසුම යාවත්කාලීනව පවත්වා ගැනීමට පුළුවන. එවැනි රක්ෂණයක් හිමි රක්ෂිතයකුට සත්‍ය වශයෙන්ම අලාභයක් හෝ හානියක් සිදු වූ විට රක්ෂණ ආයතනයෙන් වන්දි ඉල්ලා සිටීමට පුළුවන.

## රක්ෂණයක් ලබා ගැනීමේ ප්‍රයෝජන

බලාපොරොත්තු නොවූ අවස්ථාවක හානියක් සිදුවුවහොත් එම හානිය ප්‍රතිපූරණය කර ගැනීමට අවස්ථාව ලැබෙයි. හානිය තක්සේරු කොට රක්ෂණ ආයතනයෙන් වන්දි මුදල් ප්‍රධානය කරයි.

ජීවිත රක්ෂණයකදීනම් රක්ෂිතයා මියගිය අවස්ථාවක ඔහුගේ /ඇයගේ යැපෙන්නන්ට වන්දි මුදල් ලබාගෙන ආර්ථික අපහසුතාවයන් සමනය කර ගැනීමට පුළුවන.

ගිවිසුම්ගත කාලය තුළ රක්ෂිතය මියගියේ නැත්නම් ගෙවා ඇති රක්ෂණ වාරික මුදල් සහ ඒ මත ලැබෙන ප්‍රතිලාභ ලබා ගැනීම ට රක්ෂිතයාට අවස්ථාව ලැබේ.

හදිසි අනතුරකදී පුද්ගලයන්ට සිදුවන හානි වලටද වන්දි ලබා ගැනීමට පුළුවන.

වෛද්‍ය රක්ෂණයකදී රක්ෂිතයාගේ රෝහල් ගාස්තු, සැත්කම් ගාස්තු ආදිය ප්‍රතිපූරණය කරයි. කෘෂි රක්ෂණයකදී හානිය තක්සේරු කොට වන්දි මුදල් ගෙවයි.

රක්ෂිත ව්‍යාපාරයකට හානි සිදුවූ විට හානිය තක්සේරුකොට ගිවිසුමට අනුව වන්දි ගෙවයි.

# 4.0 ණය කාඩ් පත් භාවිතය

කෙටිකාලීන ණය පහසු කමක්ද සහිතව යම් යම් මිල ගෙවීම් සඳහා පහසු ක්‍රමයක් හැටියට ණය කාඩ් පත් හඳුනා ගැනීමට පුළුවන.

ණය කාඩ්පත් නිකුත් කිරීමට බලයලත් ආයතනය විසින් ගනුදෙනුකරුවාගේ ආදායම් තත්ත්වයට අනුව තීරණය කරන මුදල් සීමාව තුළ වියදම් කිරීමට හැකිවන සේ ණය කාඩ් පත් නිකුත් කරයි.

## ණය කාඩ් පත හරහා ගෙවීම් කිරීම

ණය කාඩ් පත ගෙවීම් පහසු කරයි. තම අතේ මුදල් නැතිව වුවද අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීමට කාඩ් පත් හිමියාට අවස්ථාව ලැබේ. ණය කාඩ් පත පිළිගන්නා වෙළෙඳුන් වෙතින් ඔබට අවශ්‍යය භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට පුළුවන. එහිදී මුදල් වෙනුවට කාඩ් පතින් ගෙවීම් කළ හැක. ඒ අවස්ථාවේදී ඔබ අතෙහි හෝ බැංකු ගිණුමෙහි මුදල් නොතිබෙන්නට පුළුවන. එසේ වුව ද ගනුදෙනුවට එය අදාළ නොවේ. තමන් වෙත මුදල් නොමැති අවස්ථාවක වුවද තමන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමට හැකිවීම ණය කාඩ් පතින් ලැබෙන ප්‍රයෝජනයයි.

ණය කාඩ් පත නිකුත් කළ බැංකුව හෝ ආයතනය සෑම මාසයකදීම පෙර මාසයේ ණය ගනුදෙනු පිළිබඳ විස්තරයක් නැතහොත් ගිණුම් ප්‍රකාශය ඔබ වෙත ලබාදෙයි. පෙර මාසයේ ණය ගනුදෙනු වෙනුවෙන් ගෙවිය යුතු සම්පූර්ණ මුදල එහි දැක්වේ. එම මුදල සම්පූර්ණයෙන්ම ගෙවිය හැකිනම් කිසිදු පොලී මුදලක් අය වන්නේ නැත. සම්පූර්ණ මුදල ගෙවිය නොහැකි අවස්ථාවකදී ගෙවිය යුතු අවම මුදල ද එහි සඳහන් වේ. අවම මුදල පමණක් ගෙවුවහොත් ණය මුදලට පොලියක් ගෙවීමට සිදුවේ.

ගිණුම් ප්‍රකාශයේ සඳහන් කරන දිනයට පෙර ණය මුදල නොගෙවන අයට ප්‍රමාද ගාස්තු, දඩ පොලී ආදී අමතර ගෙවීම් ද කිරීමට සිදුවිය හැක. ණය ගෙවීම් පැහැර හරින අයගේ විස්තර ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කරනු ලැබේ.

ණය කාඩ් පතින් මුදල් ලබා ගැනීමට ද පුළුවන. එලෙස ලබා ගන්නා ණය මුදල් සඳහා පොලි ගෙවීමට සිදුවේ.

ණය කාඩ් පත් නිකුත් කිරීමේදී ගාස්තුවක් අය කරනු ලැබේ. එසේ ම කාඩ් පත වාර්ෂිකව අලුත් කර ගැනීමේදී ද ගාස්තුවක් ගෙවීමට සිදුවේ.

ණය කාඩ් පත් අංකය හෝ කාඩ් පතින් මුදල් ගැනීමට භාවිතා කරන රහස් අංකය හෝ වෙනත් අයට නොදීමට වග බලා ගත යුතුය.

# කල්පනාකාරීවන්න

ණය කාඩ්පත යොදාගෙන ඉවක් බවක් නැතිව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමෙන් වලකින්න. ඊළඟ මාසයේදී කරදරයක් නැතුව ගෙවිය හැකි ප්‍රමාණයට ණය ගත යුතුය. තමන්ගේ ආදායම් සීමාව ඉක්මවා ණය ගැනීමෙන් ගෙවීම අපහසු වීම නිසා හිඟ ණය සඳහා පොලි සහ අමතර ගාස්තු ගෙවීමට සිදුවේ.

ණය කාඩ්පතක් නැති වුවහොත් ඒ බව වහාම කාඩ්පත නිකුත් කළ ආයතනයට දැනුම් දිය යුතුය.

*"ජීවිතය බයිසිකලයක් වැනිය.*
*නොවැටී සිටින්නට නම්*
*ඔබ ඉදිරියට පදවාගෙන යා යුතුමය"*

- ඇල්බට් අයින්ස්ටයින් -

# 5.0 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB)

මෙම ආයතනය වඩා ප්‍රසිද්ධ වී ඇත්තේ ක්‍රිබ් (CRIB) යන නාමයෙනි. එය මෙම ආයතනය ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වන CredIt InformatIon Bureau of SrI Lanka යන්න කෙටි කර දැක්වීමකි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතකට අනුව පිහිටුවා ඇති මෙම ආයතනය බලපත්‍ර ලාබී වාණිජ බැංකු ඇතුළු මූල්‍යය ආයතන රැසකටම සිය සේවාව සපයයි.

ඒ මූල්‍යය ආයතන යම් පුද්ගලයකුට හෝ ආයතනයකට ණය මුදලක්, ණය කාඩ්පතක් හෝ ලීසින් පහසුකමක් ප්‍රධානය කළ විට ඒ පිළිබඳ විස්තර මෙම කාර්යාංශයට වාර්තා කරනු ලැබේ. එසේම එවැනි ණය පහසුකම් නො ගෙවා පැහැර හැරි අය පිළිබඳ විස්තර ද වාර්තාකරයි.

මේ නිසා කිසිවෙකුට එක් මූල්‍යය ආයතනයකින් ණය මුදල් ලබාගෙන ඒවා නොගෙවා පැහැර හරිමින් වෙනත් මූල්‍ය ආයතනයක් වෙත ගොස් ණය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩකඩ සම්පූර්ණයෙන්ම වළක්වා තිබේ. යම් පුද්ගලයෙක් හෝ ආයතනයක් කිසියම් මූල්‍යායතනයකින් ණය පහසුකම් ඉල්ලූ විට එම ආයතනය මුලින්ම කරන්නේ ණය තොරතුරු කාර්යාංශය හරහා එම ණය අයදුම්කරුගේ අතීත මුදල් ගනුදෙනු පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමයි. අයදුම්කරු වෙනත් මූල්‍ය ආයතනයකින් ණය පහසුකම් ලබාගෙන තිබේද? ගිවිසගත් ආකාරයටම එම ණය ආපසු ගෙවනවාද? ණය ගෙවීම් පැහැර හැර තිබේද? එසේ නම් කොපමණ මුදලක් ගෙවන්න තිබෙනවාද ? ආදී විස්තර රැසක් ණය තොරතුරු කාර්යාංශය හරහා ලබා ගැනීමට පුළුවන. එසේ ලැබෙන වාර්තාව එම මූල්‍ය ආයතනයට අදාළ ණය අයදුම්කරුට අලුතින් ණය මුදලක් ලබා දීම පිළිබඳ තීරණය ගැනීමට උපකාර වෙයි.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. Guide to Payment Services in Sri Lanka - Central Bank of Sri Lanka

2 Financial Literacy Survey Sri Lanka 2021 - Central Bank of Sri Lanka

3. Financia Literacy Road map of Sri Lanka 2024 - 2028 - Central Bank of Sri Lanka

4. මූල්‍ය සාක්ෂරතාවය, ඩබ්ලිව්. එම්. කරුණාරත්න - ශ්‍රී ලංකා මහා බැංකුව, (2011)

5. මූල්‍ය සාක්ෂරතාවය, ඔබේ මූල්‍යමය යහපැවැත්ම උදාකර ගැනීම සඳහා - රවී අබේසූරිය

6. Help, Hope and A insight for your money and your life - Chuck Bentley and Larry Burkett

7. Practical Money Skills Work Book - Practicalmoneysk

මුදල් තිබුණු පමණින්ම ජීවිතය සාර්ථක වන්නේ නැත. ඒ සඳහා මුදල් පරිහරණය පිළිබඳ දැනුම එනම් මූල්‍ය සාක්‍ෂරතාවයද තිබිය යුතුය. මූල්‍ය සාක්ෂරතාව යනුවෙන් අදහස් කරන්නේ නීත්‍යානුකූල මාර්ගවලින් මුදල් උපයා ගැනීමට, ආරක්ෂාකාරී ලෙස මුදල් ඉතිරිකිරීමට, ඥානාන්විත ලෙස මුදල් වියදම් කිරීමට, ඵලදායක අයුරින් මුදල් ආයෝජනය කිරීමට සහ මුදල් ප්‍රවේසම් කර ගැනීමට අදාළව පුද්ගලයෙකු සතු දැනුම, ආකල්ප සහ එම අයගේ චර්යාවයි.

මුදල් උපයා ගත යුත්තේ නිත්‍යනුකූල මාර්ග වලිනි. වෙහෙස මහන්සියෙන් වැඩ කිරීමෙන් හැර පහසුවෙන් මුදල් උපයාගත හැකි කෙටි මාර්ග තිබේ යැයි විශ්වාස කිරීම මුලාවකි. එසේ කල්පනා කරන පුද්ගලයින් වංචා කාර මුදල් මගඩි වල පහසු ගොදුරක් බවට පත්වෙයි.

මුදල් උපයා ගැනීම තරමක් අසීරු බව කවුරුත් දනී. නමුත් මුදල් වියදම් කිරීම පහසුය. වියදම් කිරීමට කාරණාද බොහෝය. එබැවින් තමන් සතු මුදල් ඥානාන්විත ලෙස වියදම් කිරීමට වග බලා ගත යුතුය. එසේම එම මුදල් ආරක්ෂා කරගැනීමට ද පියවර ගත යුතුය. හේතුව මුදල් නැති නාස්ති වන මාර්ග රාශියක් ඇති බැවිනි.

මුදල් තැන්පත් කළ යුත්තේ මහජනයාගේ මුදල් තැන්පත් භාර ගැනීමට නීත්‍යානුකූලව බලය සහ අවසරය ලැබී ඇති ආයතනවල පමණි. ඉල්ලූ විට තැන්පත් මුදල් ආපසු ගෙවීමේ හැකියාවද එම ආයතන වලට තිබිය යුතුය. බොහෝ බැංකු ආයතනවලට මෙම සුදුසුකම් තිබේ. එසේම ණය ගැනීමේ දී ද ප්‍රවේශම් විය යුතුය. වර්තමානයේ දී ණය දෙන පුද්ගලයන් සහ ආයතන වැඩි වී තිබේ. ඔවුන් ඉක්මනින් සහ පහසුවෙන් ණය දෙන බව පවසයි. නමුත් ලබාගත් ණය ආපසු ගෙවීමේදී ණයකරුට අධික පොලී සහ ගාස්තු ගෙවීමට සිදුවෙයි.

මෙවැනි කරුණු කාරණා ගැන පුද්ගලයෙකුට හොඳ දැනුමක්, නිවැරදි ආකල්ප සහ යහපත් හැසිරීමක් තිබිය යුතුය. දැනුම තිබුණත් හැසිරීම ඥානාන්විත නොවන විට මුදල් නැති නාස්ති වීමට පුළුවන.

මෙවැනි කරුණු ගැන ප්‍රයෝජනවත් අදහස් මෙම ග්‍රන්ථයෙහි අඩංගු කර තිබේ. මෙම ග්‍රන්ථයෙහි කතුවරයා ශ්‍රී ලංකා මහා බැංකුවේ හිටපු සහකාර අධිපතිවරයෙකු වන ඩබ්ලිව් එම් කරුණාරත්න මහතාය. ඔහු මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව මීට පෙරද ග්‍රන්ථයක් ප්‍රකාශයට පත්කර ඇති අත්දැකීම් බහුල පුද්ගලයෙකි. විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාව සමඟ බැංකු ගනුදෙනු කිරීමේදී ඒ මහතා ලද අත්දැකීම් ද මෙම ග්‍රන්ථය සම්පාදනයට උපකාර කරගෙන තිබේ.

මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නංවා ගැනීම තුළින් සාමාන්‍ය ජනතාවට බැංකු ආයතන සමඟ වඩා විශ්වාසදායක ගනුදෙනු සම්බන්ධතා ඇතිකරගැනීමට පුළුවන. එය ඔවුන්ගේ ආර්ථික දියුණුවට ද මහත් සේ උපකාරී වේ. ඒ සඳහා මෙම ග්‍රන්ථයෙහි සඳහන් කරුණු ජනතාවට ප්‍රයෝජනවත් වන්නේ නම් එය අප කාගේත් සතුටට කරුණකි.

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**
**2/2/1 කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල**

**දුරකථන - 011- 2770986**
**වෙබ් අඩවිය - www.sarp.lk**

9 786245 753123